# ක්‍රිස්තියානි ධර්මය

## 11 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



**සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට**
**www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.**

පළමුවන මුද්‍රණය 2015
දෙවන මුද්‍රණය 2016
තෙවන මුද්‍රණය 2018
හතරවන මුද්‍රණය 2019
පස්වන මුද්‍රණය 2020

සියලුම හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0405-1

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
අංක. 90, වාසනාවත්ත පාර, මත්තේගොඩ දරන ස්ථානයෙහි පිහිටි
විශ්ව ග්‍රැෆික්ස් (පුද්) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by : Educational Publications Department
Printed by : Vishwa Graphics (Pvt) Ltd.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

දියුණුවේ හිණිපෙත කරා ගමන් කරනා වත්මන් ලොවට, නිතැතින්ම අවැසි වනුයේ වඩාත් නව්‍ය වූ අධ්‍යාපන ක්‍රමයකි. එමඟින් නිර්මාණය කළ යුත්තේ මනුගුණදම් සපිරුණු හා කුසලතාවලින් යුක්ත දරුපරපුරකි. එකී උත්තුංග මෙහෙවරට ජව බලය සපයමින්, විශ්වීය අභියෝග සඳහා දිරියෙන් මුහුණ දිය හැකි සිසු පරපුරක් නිර්මාණය කිරීම සඳහා සහාය වීම අපගේ පරම වගකීම වන්නේ ය. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යය වෙනුවෙන් සක්‍රීය ලෙස මැදිහත් වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ වෙනුවෙන් දායකත්වය ලබා දෙන්නේ ජාතියේ දරුදැරියන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොත විටෙක දැනුම් කෝෂ්ඨාගාරයකි. එය තවත් විටෙක අප වින්දනාත්මක ලොවකට ද කැඳවාගෙන යයි. එසේම මේ පෙළපොත් අපගේ තර්ක බුද්ධිය වඩවාලන්නේ අනේකවිධ කුසලතා පුබුදු කරවාගන්නට ද සුවිසල් එළි දහරක් වෙමිනි. විදුබිමෙන් සමුගත් දිනක වුව අපරිමිත ආදරයෙන් ස්මරණය කළ හැකි මතක, පෙළපොත් පිටු අතර දැවටී ඔබ සමඟින් අත්වැල් බැඳ එනු නොඅනුමාන ය. මේ පෙළපොත සමඟම තව තවත් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත නිති පියමනිමින් පරිපූර්ණත්වය අත් කරගැනුමට ඔබ සැම නිරතුරුව ඇප කැප විය යුතු ය.

නිදහස් අධ්‍යාපනයේ මහානර්ඝ ත්‍යාගයක් සේ මේ පුස්තකය ඔබ දෝතට පිරිනැමේ. පෙළපොත් වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අර්ථසම්පන්න අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පාඨ්‍ය ග්‍රන්ථය මනාව පරිශීලනය කරමින් නැණ ගුණ පිරි පුරවැසියන් වී අනාගත ලොව ඒකාලෝක කරන්නට දැයේ සියලු දූ දරුවන් වෙත දිරිය සවිය ලැබේවායි හදවතින් සුබ පතමි.

පෙළපොත් සම්පාදන කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ සම්පත්දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සැමටත් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

**නියාමනය හා අධීක්ෂණය**

පී.එන්. අයිලප්පෙරුම — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**මෙහෙයවීම**

ඩබ්ලිව්.ඒ. නිර්මලා පියසීලි — අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සම්බන්ධීකරණය**

ආර්. ඩී. විජේවික්‍රම — නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**සහාය සම්බන්ධීකරණය**

එස්. ජී. ඩී. එන්. එල්. සමරකෝන් — සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**අනුශාසකත්වය**

ගෞ. ඩබ්. පී. එබනේසර් ජෝශප් දේවගැතිතුමා — මහලේකම්,
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, කොළඹ.

**සංස්කාරක මණ්ඩලය**

ගෞ. ජයනාත් පණ්ඩිතරත්න දේවගැතිතුමා — සභාපති, ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය,
කොළඹ.

ගෞ. ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය — විධායක ලේකම්,
ක්‍රිස්තියානි අධ්‍යාපන කොමිසම,
ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
කොළඹ.

ගෞ. සී. ඩබ්. සී. බාල්රාජ් දේවගැතිතුමා — විදුහල්පති,
ශාන්ත තෝමස් විදුහල,
බණ්ඩාරවෙල.

**ලේඛක මණ්ඩලය**

නිලන්ති දීපා ද සිල්වා — ගුරු වෘත්තිය,
මෙතොදිස්ත උසස් විදුහල,
පුවක් අරඹ, මොරටුව.

එම්. රදීකා සමන්ති මෙන්ඩිස් — ගුරු වෘත්තිය,
සාන්ත තෝමස් විදුහල,
ගල්කිස්ස.

ගෞ. ජේ. සී. එස්. රෝහිත ද සිල්වා දේවගැතිතුමා — කුලාචාර්ය,
වෙස්ලි විදුහල,
කොළඹ.

| | |
|---|---|
| එම්. රේණුකා දමයන්ති | ගුරු වෘත්තිය,<br>මාවතගම මධ්‍ය මහ විද්‍යාලය,<br>මාවතගම. |
| ගරු එස්. බාලසුන්දරම් දේවගැතිතුමා | දේශක,<br>අධ්‍යයන හා හැඩගැස්වීමේ<br>මුල් දෙව් මැදුරු අධ්‍යාපන ආයතනය,<br>කොළඹ. |
| ඩී. ග්ලෝරි හෙබ්සිබා | ගුරු වෘත්තිය,<br>ගම්පොළ හින්දු විදුහල,<br>ගම්පොළ. |
| එන්. පී. සෙල්වනිදි පෙරේරා | ගුරු වෘත්තිය, (විශ්‍රාමික). |

**භාෂා සංස්කාරක**

| | |
|---|---|
| වයි. ප්‍රීති නීලමනි පුෂ්පමාලා විමලසිරි | ගුරු උපදේශිකා (සිංහල),<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>ශ්‍රී ජයවර්ධනපුර,<br>බත්තරමුල්ල. |

**පරිගණක අක්ෂර සංයෝජනය, පිටු සැලසුම්කරණය හා පිටකවර නිර්මාණය**

ෂර්වෝන් මෙන්ඩිස්

# පටුන

පිටු

**දෙවියන් වහන්සේ සියල්ලේ කර්තෘවරයාණෝ ද නිර්මාතෘ ද බව විශ්වාස කරයි.**

1. ජුදා සමාජ දැක්ම 1 . 3
2. මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක් 4 . 6
3. යහපත් බැටළු එඬේරා 7 . 10
4. දුක් උසුලන සේවකයාණෝ 11 . 14

**ජේසුස් වහන්සේගේ පරිපූර්ණ ජීවිතය හා සේවය තුළින් දිවි මග ආලෝකවත් කර ගනියි.**

5. ප්‍රේමයෙන් දිවි ගෙවමු 15 . 18
6. සාමයට කැපවෙමු 19 . 23
7. කමාව අත්දකිමු 24 . 28
8. ඒකත්වයෙන් දිවි ගෙවමු 29 . 32
9. බලාපොරොත්තුව හා සදාතන ජීවනය 33 . 36

**ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබමින් ජීවිත නවෝදයක් අත්දකියි.**

10. මුල් කිතුනු සභාවෙන් ආදර්ශයක් 37 . 41
11. ඵලදායි මෙහෙවරක් 42 . 45
12. ජීවිත වෙනසක් 46 . 50
13. හවුල් නායකත්වයෙන් ජය 51 . 56
14. දිරියෙන් යුතු මෙහෙවර 57 . 63
15. අභියෝග මැද මෙහෙවර 64 . 67
16. සාක්ෂියේ දිරියෙන් මෙහෙවර 68 . 71

**දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට දායක වෙයි.**

17. ක්‍රිස්තුන් වහන්සේට අයත් මම 72 . 76
18. ක්‍රිස්තුන් වහන්සේට අයත් අප 77 . 81
19. සහජීවනයෙන් ගොඩ නැගෙමු 82 . 84
20. ආත්මයාණන්ගෙන් දිවි මග ලබමු 85 . 88
21 දරිද්‍රතාවේ අභියෝගය ජය ගනිමු 89 . 92
22. පීඩිත වූවන් මුදවාලමු 93 . 96

**ශුද්ධ බයිබලය ජීවිතයට අත්වැලක් කර ගනියි.**

23. සමාජ සාධාරණත්වය කරා 97 . 100
24. පිවිතුරු දිවියක් කරා 101 . 103
25. නවෝදයේ අරුණලු 104 . 106

# 1 ජුදා සමාජ දැක්ම

**දෙවියන් වහන්සේගේ කැඳවීමට අනුව ආබ්‍රහම්තුමාගේ නායකත්වයෙන් පිහිටුවනු ලැබූ ඉශ්‍රායෙල් ජාතිය, පසුව දස පනත මූලික වූ ජන සමාජයක් ලෙස ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**උත්පත්ති 12: 2-3, 13 : 14-17, 15: 5, නික්මයාම 20: 1-17**

## ආබ්‍රහම් කැඳවීම

බබිලෝනියේ සිට සෑම අතින් ම සරුසාර කානාන් දේශය කරා ජන කණ්ඩායම්වල සංක්‍රමණය ක්‍රි. පූ. 19 වන සියවසේ දී සිදු වුණි. එහෙත් ඒ කණ්ඩායම් අතුරෙන් ආබ්‍රහම්ගේ (ආබ්‍රම්) සංක්‍රමණය සිදු වූයේ හුදෙක් ලෞකික වුවමනාවක් නිසා නොව, දෙවියන් වහන්සේගේ නිශ්චිත පරමාර්ථයන් ඉටුකිරීමේ අරමුණෙනි. හාරාන් දේශයෙන්, ආබ්‍රහම් ඇතුළු පවුලේ සාමාජිකයන් විශේෂ කාර්යභාරයක් සඳහා කැඳවනු ලැබුවේ දෙවියන් වහන්සේ යි. හෙතෙම තම මව් බිම ද නෑදෑයන් ද පියාගේ ගෘහය ද සියල්ල හැරදමා මේ ගමනේ යෙදුණි.

## ආබ්‍රහම්ගේ ඇදහිල්ල

ආබ්‍රහම් දේව කැඳවීමට දැක්වූ ප්‍රතිචාරයෙන් ඔහු තුළ එක ම සත්‍ය දෙවියන් වහන්සේ කෙරෙහි පැවති ඒකාන්ත ඇදහිල්ල තහවුරු විය. හෙතෙම දෙවියන් වහන්සේ කෙරෙහි පමණක් අදහමින් ජීවිතයේ පරමාර්ථ වටහාගෙන තමන් සතු සියල්ල ඉවත දමා ඒ අනුව ක්‍රියා කළේ ය.

මින් අපට පැහැදිලි වන වැදගත් කරුණු දෙකක් වන්නේ,

1. ඉශ්‍රායෙල් සමාජය එක ම දෙවියන් වහන්සේ අදහන හා එම ඇදහිල්ල මත ගොඩනැගුණු සමාජයක් බවයි.

2. එසේම එම සමාජයේ ආරම්භක ඉතිහාසය ආබ්‍රහම්තුමාගේ කැඳවීම සමග බද්ධ ව පවතින බවයි.

## ආබ්‍රහම් ලැබූ ගිවිසුමෙහි වූ පොරොන්දු

දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ගැඹුරු සම්බන්ධතාවකට ඇතුළු වූ සේක. මෙලෙස ඔහු ලත් කැඳවීමේ ඵලග පියවර දෙවියන් වහන්සේ ඔහු හා සමග ගිවිසුමකට එළඹීමයි. මේ ගිවිසුම තුළ ආබ්‍රහම් හා පසුව ඔහුගේ පෙළපතින් දෙවියන් වහන්සේ

කෙරෙහි ඇදහිල්ලෙන් හා කීකරුකමින් යුක්තව සිටීම දැකිය හැකි ය. දෙවියන් වහන්සේ ඔහුට හා ඔහුගේ පෙළපතට ආශිර්වාද කිරීම ගිවිසුමේ දෙවියන් වහන්සේගේ කොටස යි. මෙම ගිවිසුමෙහි පොරොන්දු තෙවැදෑරුම් වේ. ඒවා නම්;

### (i) ඔහු විශාල ජාතියක පියා බවට පත්වීම (උත්පත්ති 12: 2, 13: 16, 15: 5)

ආබ්‍රහම් තමන්ට වයස අවුරුදු 99 දීත් දරුවකු නොසිටීම ගැන දෙවියන් වහන්සේට කරුණු කී ය. දෙවියන් වහන්සේ ඔහුට "පොළොවේ දූවිලි හා සමාන" මෙන් ම "අහසේ තාරකා'' මෙන් ගණන් කළ නොහැකි විශාල දරු පරපුරක් දෙන බව පොරොන්දු වූ සේක. එසේම ඔහුට දුන් අලුත් නාමයෙන් ඔහු ලැබූ විශේෂ තත්ත්වය හැඳින්වේ. ඔහුගේ මුල් නම "ආබ්‍රම්" ය. ඔහුට ආබ්‍රහම්" යන නාමය දෙනු ලැබුවේ ය. එහි අරුත "ජාතීන්ගේ පියා" යන්න ය.

### (ii) දේශයක උරුමය ලැබීම (උත්පත්ති 12: 7, 13: 15, 17: 8)

ආබ්‍රහම්, හාරාන් දේශයේ තම පියාගෙන් උරුම වූ සියල්ල අමතක කොට, දෙවියන් වහන්සේගේ කැඳවීමට කීකරු විය. සශ්‍රීක දේශයක උරුමය, දෙවියන් වහන්සේ ඔහුට දීමට ස්ථිර ලෙස ම පොරොන්දු වූ සේක.

### (iii) අන්‍යයන්ට ආශිර්වාදයක් වීම (උත්පත්ති 12: 2-3)

ආබ්‍රහම්ට හා ඔහුගේ පෙළපතට දෙවියන් වහන්සේගෙන් ආශිර්වාද ලැබුණි. එහෙත් දෙවියන් වහන්සේගේ අරමුණ ඉන් ඔබ්බට යන්නකි. මෙසේ ආබ්‍රහම්ට දෙවියන් වහන්සේ දුන් තුන්වෙනි පොරොන්දුව නම් "ඔහුගේ නාමය ආසිරි පැතීමේ නාමයක්" වන බවත්, එ තුළින් "මිහිමත සියලු දෙනා දෙවියන් වහන්සේගෙන් ආසිරි ලබන බවත් ය". මින් අදහස් වන්නේ ආබ්‍රහම් තම ඇදහිල්ල හා කීකරුකම තුළින් ලද ආශිර්වාදය හුදෙක් පෞද්ගලිකව ලැබූවක් පමණක් නොව, සමස්ත ලෝකවාසීන්ට ම හිමි වන සුවිසල් ආශිර්වාදයක් ලෙස ලැබූ බව යි.

මෙයාකාරයෙන් විකාශනය වූ ජන සමාජය පසුව ඊජිප්තුවේ වහලුන් බවට පත්වී, දෙවි සමිඳුන් ඔවුන් වහල්කමෙන් මුදා ගැනීමෙන් පසු ඔවුනට ලබා දුන් දස පනත තුළින් දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතරත්, මනුෂ්‍යයා හා මනුෂ්‍යයා අතරත් සබඳතාව තහවුරු වී වඩාත් අර්ථවත් විය.

### දස පනත තුළින් විනය ගරුක සමාජයක් (නික්මයාම 20: 1-17)

ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේ දුන් දස පනත තුළ ජීවිතය හා සමාජය සඳහා අවශ්‍ය මූලික සාරධර්ම ගැබ් වී තිබේ. ඉශ්‍රායෙල් ජන සමාජය හා එහි සමාජ දර්ශනය මේ මත ගොඩ නැගී තිබේ.

දස පනත



## දස පනත හා එහි විශ්ලේෂණය

| | | | |
|---|---|---|---|
| 01 | මා හැර අන් කිසිම දෙවි කෙනකු නුඹට නොසිටිය යුතු ය. | 05 | පියාට ද මවට ද ගෞරව කරව. |
| | | 06 | මිනී නොමරව. |
| 02 | නෙළූ රූපයක්... කිසිම වස්තුවකට සමාන දෙයක් සාදා නො ගන්න. ඒවාට නමස්කාර නො කරන්න. | 07 | කාමමිථ්‍යාචාරය නොකරව. |
| | | 08 | සොරකම් නොකරව. |
| 03 | දෙවි සමිඳාණන්ගේ නාමය අගරු ලෙස භාවිත නො කරන්න. | 09 | අසල්වැසියාට විරුද්ධ ව බොරු සාක්ෂි නොකියව. |
| 04 | සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. | 10 | අසල්වැසියා සතු කිසිවකටවත් ඇළුම් නොකරව. |

1, 2, 3, 4--
මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව හා මිනිසා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් කළ යුතු පරම යුතුකම් හා වගකීම්

5, 6, 7, 8, 9, 10 -
මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණ ධර්ම හා මිනිස් සබඳතා මේ පනත්වල අඩංගු වේ.

මෙම විග්‍රහයේ දෙවන කොටසේ පස්වන පනතට අනුව පවුලක පැවතිය යුතු දෙමාපිය හා දරු සබඳතාවල අර්ථවත් බව හා වටිනාකම පිළිබිඹු වන අතර අනෙකුත් අණපනත් ද ඉශ්රායෙල් සමාජය තුළ ක්‍රියාත්මක වීමෙන්, එහි සමාජ දර්ශනය පෝෂණය වී තිබේ.

ජුදෙව් ජන සමාජය තුළ පැවති සාරධර්ම හා දේව ඇදහිල්ල ඉතා පුළුල් හා අර්ථවත් බවින් යුක්ත වෙයි. ලෝකය තුළ අප ක්‍රියා කළ යුත්තේ, පැහැදිලිව ම දේව සබඳතාව අර්ථවත්ව හා සත්‍යවාදීව වර්ධනය කර ගැනීම තුළිනි. මෙවන් අර්ථවත්, යහපත් දිවි පෙවෙතක් සඳහා දස පනතින් අපට මූලික මග පෙන්වීමක් ලැබේ. එවිට සමාජය තුළ අප ක්‍රියාත්මක වන්නේ දේව අභිප්‍රායයන් ඉටු කරන දේව දරුවන් ලෙසට ය. මෙහි ප්‍රතිඵලය අප ජීවත්වන සමාජය යහපත් බවින් පූර්ණ වීම යි.

**ක්‍රියාකාරකම්**

01. 'ආබ්‍රහම්තුමාගේ තිරසාර ඇදහිල්ල අලුත් ජන සමාජයක් නිර්මාණය කිරීමට හේතු විය' ඊට නිදසුන් දක්වමින් සඟරාවකට ලිපියක් ලියන්න.

02. වත්මන් සමාජය ගුණවත් බවින් පිරුණු සමාජයක් බවට පත් කිරීමට ඉශ්රායෙල් සමාජයෙන් ගත හැකි වටිනාකම් 4 ක් සඳහන් කරන්න.

# 2 මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක්

**මෙසියස් වහන්සේ සම්බන්ධ බයිබලීය අදහස් හා එහි සන්දර්භය පිළිබඳවත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නම් මෙසියස් වහන්සේ තුළින් අපගේ දිවි පෙවෙත පරිපූර්ණ කර ගත හැකි ආකාරය පිළිබඳවත් වටහා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**යෙසායා 9: 1-7, 11: 1-9**

මෙසියස් (මෙසායා) යනුවෙන් අප භාවිත කරන වචනය හෙබ්‍රෙව් බසින් "මෂියාහ්" යන්න ය. එහි අරුත "ආලේප කරනු ලැබූ තැනැත්තා" යන්න ය. මේ වචනය ග්‍රීක් බසින් "ක්‍රිස්ටොස්" යනුවෙන් පරිවර්තනය වී තිබේ. මින් අදහස් කරන්නේ ආලේපය ලත් තැනැත්තා දෙවියන් වහන්සේ විසින් විශේෂ කාර්යභාරයක් ඉටු කිරීම සඳහා කැඳවන බව යි.

**දැන් අපි මෙසියානු සංකල්පයේ විකාශනය ගැන සලකා බලමු.**

ඉශ්රායෙල් ඉතිහාසය තුළ ආලේපනය ලැබූ එක් ජන කණ්ඩායමක් වන්නේ පූජකයන් ය. ආරොන් සහ ඔහුගේ පුත්‍රයන් ආලේප තෛලයෙන් ආලේපනය කරනු ලැබීම නික්මයාම 29: 7 හි අපි කියවමු. එසේ ම දිවැසිවරුන් ද ආලේප කරනු ලැබූහ. මේ බව සඳහන් රාජාවලිය 19: 16 වැනි පදය දිවැසිවරුන් හා රජවරුන් ආලේප කරනු ලැබීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් අපට දෙයි. "නිම්ෂිගේ පුත් ජේහු ඉශ්රායෙල්වරුන්ගේ රජු වශයෙන් ආලේප කරන්න. එලීෂා නුඹ වෙනුවට දිවැසිවරයකු ලෙස ආලේප කරන්න".

දාවිත් රජතුමාගේ කාලයේ දී රජවරුන් ද මෙලෙස ආලේප කිරීම සිදු විය. ඒ අනුව අපට මෙසියායනික සංකල්පය තුළ පහත සඳහන් විශේෂ ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකි ය.

**රජකම හා බැඳුණු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ**

### (i) දාවිත් රජ පරපුරෙන් පැමිණෙන මෙසියස් වහන්සේ පිළිබඳ ඉඟිය

යෙසායා දිවැසිවරතුමා දාවිත් රජ පරපුරෙන් මෙසියස් වහන්සේ පැමිණෙන බව පූර්ව දැනුම් දීමකින් ඉඟි කරන බව පෙනේ. ඒ නිසා දාවිත් රජතුමාගේ පරපුරට විශේෂ ස්ථානයක් හිමි වේ. දෙවියන් වහන්සේ දාවිත් තෝරා ගෙන ඔහු සමග ගිවිසුමකට එළඹුණ සේක. මේ අනුව මෙසියානු ආගමනය දාවිත් රජ පරපුරෙන් සම්පූර්ණත්වයට පත් වෙයි. (යෙසායා 9: 7)

### (ii) මෙසියස් වහන්සේගේ රාජ්‍යය සදාකාලික බව

දාවිත්ගේ පෙළපත සදහට ම පිහිටුවනු ලැබේ. නොයෙක් වධ වේදනා මැද දාවිත්ගේ රජ පෙළපතින් පහළ වන මෙසියස් වහන්සේ දෙවියන් වහන්සේගේ සාම රාජ්‍යය පිහිටුවනු ඇත.

### (iii) සාධාරණත්වය හා යුක්තිය පැවතීම

මෙසියස් වහන්සේ තම රාජ්‍යත්වය ඉස්මතු කරන්නේ යුක්තිය හා සාධාරණත්වය පදනම් කරගෙන ය. මේ අනුව යුක්තිය හා සාධාරණත්වය, එම සාම රාජ්‍යයේ මූලික අංග වෙයි. ( යෙසායා 11: 5)

ක්‍රිස්තුස් හෙවත් මෙසියස් වහන්සේගේ කාර්යභාරය සලකන විට එතුමා සාමාන්‍ය රජකුගෙන් වෙනස් කෙනෙක් බව බයිබලයෙන් අපට පෙනී යයි. උන්වහන්සේගේ අරමුණ සදාකාලික සාම රාජ්‍යයක් බිහි කිරීම යි. (යෙසායා 9: 7)

### (iv) බරක් වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කිරීම

යෙසායා දිවැසිවරතුමාගේ කාලයේ දී දකුණුදිග ජුදා රාජ්‍යයට අසිරියාවෙන් බලවත් තර්ජන එල්ල වී තිබුණි. ඒ නිසා ඉශ්රායෙල් සෙනග දැඩි පීඩනයකට ලක්වී සිටියහ. මෙසියස් නම් රජතුමා පිළිබඳ බලාපොරොත්තුව සෙනගට දුන් යෙසායාතුමා උන්වහන්සේ බර වූ විය දණ්ඩ කඩා දමා විමුක්තිය උදා කර දෙන බව පවසයි. (යෙසායා 9:4)


### (v) අසිරිමත් උපදේශකයාණෝ

බයිබලීය රාජ්‍ය සංකල්පය, නිතර ම රජතුමා බලයෙන් පමණක් නොව ඥානයෙන් ද පිරි කෙනෙකු ලෙස ඉදිරිපත් කරයි. හෙතෙම ප්‍රඥාවෙන් පූර්ණ ය. මෙසියස්තුමා සිය උපදේශනයෙන් ද තම ජනතාව මෙහෙයවයි. (යෙසායා 9: 6)

### (vi) සාමයේ කුමාරයාණෝ

රාජ්‍යයක පැවැත්මට අවශ්‍ය ම වන්නේ ජනතාව වාද භේද දුරලා සාමයෙන් හා ප්‍රීතියෙන් ප්‍රමුදිතව ජීවත්වීම යි. මේ සාමය, බාහිර ලෙස ප්‍රශ්න, කරදරවලින් තොරවීම පමණක් ම නොවේ. එය මිනිස් හදවතේ අභ්‍යන්තර වශයෙන් ඇතිවන පරිවර්තනීය සාමයකි. (යෙසායා 9: 6) එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන බව (යෙසායා 9:7) දැක්වීමෙන් මෙසියස් වහන්සේගේ රාජ්‍යයේ සුවිශේෂී බව තව දුරටත් පැහැදිලි වේ.

**මෙසියස් වහන්සේ තුළින් ලැබෙන ආලෝකය.**



ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන්, උන් වහන්සේ මෙසියස් වහන්සේ හෙවත් ක්‍රිස්තුන් වහන්සේ ලෙස හඳුනාගත් බව ශුභාරංචියේ දැක්වේ. (ශු.මාක් 8: 27--/30). ක්‍රිස්තුන් වහන්සේ තමන් මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස හඳුන්වා ගනිමින් ප්‍රකාශ කළේ තමන් වහන්සේ, පැමිණියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටත් බොහෝ දෙනකු උදෙසා සිය දිවි පූජා කිරීමටත් බව ය. (ශු. මාක් 10:45)

උන්වහන්සේගේ ජීවිත පූජාව නිසා ලෝ වාසි සැමට පාපයෙන් මිදීමත්, ඒ තුළින් පරිපූර්ණ ජීවිතයක් ලබා ගැනීමටත් පුළුවන. මේ පූර්ණ ජීවිතය තුළ මිනිසා දෙවියන් වහන්සේ හා සම්බන්ධ වී අන් අය හා සමග පූර්ණ සාමයෙන් යුතුව ජීවත් වෙයි. පැමිණෙන්නට යන මේ සාම රාජ්‍යයේ සාමකාමී හා සංහිඳියාවෙන් පිරුණු දිවි පෙවෙත ගැන ඉතා මනහර විස්තරයක් යෙසායා 11: 1--9 කොටසින් අපට පැහැදිලි වෙයි.

මෙසේ මෙසියස් වහන්සේගේ ජීවිතය හා පූජාව නිසා මිනිසා සියලු අන්දමේ වහල් බැඳීම් හා පීඩනවලින් නිදහස ලබයි. එනම් පාපයෙන් ද රෝගවලින් ද දේශපාලන හා සමාජගත පීඩනවලින් ද නිදහස ලැබීම යි. මේ සියල්ල අපට උදාකර දෙන්නේ මෙසියස් වහන්සේ ය. එනම්, ක්‍රිස්තුන් වහන්සේ ය.

මෙසියස් වහන්සේගෙන් සියලු ආකාර නිදහස ලබන ඇදහිලිවන්තයා දේව රාජ්‍යයේ වටිනාකම් සිය ජීවිතයෙන් විදහා දක්වයි. දේව ගරු බිය, යුක්තිය හා ධර්මිෂ්ඨකමට කැපවීම හා සාමය පිහිටුවීම මෙවැනි ජීවිතයක පරමාර්ථ වෙයි. මෙවන් ජීවිතයක් ගත කිරීමෙන් පූර්ණ කිතුනු දිවියක් ලෝකයට ප්‍රකාශ වනු ඇත.

**ක්‍රියාකාරකම්**

01. යෙසායා 11: 1--9 සඳහන් වන පරිදි මෙසියස් වහන්සේ උදා කරන සාම රාජ්‍යයේ පවතින ලක්ෂණ පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

02. වර්තමාන කාලයේ මෙසියානික රාජ්‍යය පහළවීමට බාධා කරන කරුණු 4 ක් සඳහන් කරන්න.

# 3 යහපත් බැටළු එඬේරා

**දෙවියන් වහන්සේ අපගේ යහපත් එඬේරාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේ තුළ තිබූ එඬේර චරිත ලක්ෂණ අපගේ ජීවිතවලට අදාළ කර ගත හැක්කේ කෙසේ දැයි විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

එසකියෙල් 34: 11-19, ගීතාවලිය 23, ශු. ජොහාන් 10: 7-16

### එඬේරුන් සම්බන්ධව බයිබලයෙන් හෙළි වන කාරණා

බොහෝ ඉශ්රායෙල් ජනතාව එඬේර වෘත්තියේ නිරත වූහ. සමහරු බැටළු පට්ටි හිමිකරුවන් වූ අතර, බොහෝ අය ඔවුන් යටතේ වැඩ කළහ. සුළු පරිමාණයේ බැටළු රැළවල් අයිති එඬේරු ද මේ අතර සිටියහ. ආබෙල්, ජාකොබ් හා ඔහුගේ දරුවන්, දාවිත් වැනි අය එඬේර ජීවිත ගත කළ අය වූහ.

ඉශ්රායෙල්වරු දෙවියන් වහන්සේ තම එඬේරාණන් ලෙස සැලකූහ. (උත්පත්ති 48: 15) ක්‍රි. පූ. 10 වන ශත වර්ෂයේ පමණ ලියනු ලැබූ යේ යැයි අනුමාන කරන ගීතාවලිය පුස්තකයේ මේ අදහස වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කර තිබේ. (ගීතාවලිය 23.) එසේ ම දෙවියන් වහන්සේ සිය සෙනග තුළින් බලාපොරොත්තු වන නායකත්ව භූමිකාව ඔවුහු එඬේර රූපකය ඇසුරෙන් සිතූහ. (එසකියෙල් 34: 11--16).

නව ගිවිසුම තුළ ජේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් ලෙස ඉගැන්වේ. (ජොහාන් 10: 7--9). මේ සියලු සඳහන් කිරීම් හා ඉගැන්වීම් තුළ දෙවියන් වහන්සේ අපට දක්වන ප්‍රේමයත්, ඒ නිසා ම අපට සලසන පෝෂණය හා ආරක්ෂාවත් අන්තර්ගත වී තිබේ. එසේ ම දෙවියන් වහන්සේ සිය සෙනග තුළින් ඒ වගකීම් බලාපොරොත්තු වන බව ද පැහැදිලි ය.

### එඬේර චරිත ගුණාංග

මෙම පාඩමට අදාළ ශුද්ධ ලියවිලි පාඨ ඇසුරෙන් අපි එඬේර චරිත ගුණාංග පිළිබඳව අවබෝධ කර ගනිමු. මේ චරිත ගුණාංග එඬේර කාර්යභාරය හා බැඳී පවතී.

#### (අ) පෝෂණය

බැටළුවන්ට අවශ්‍ය ආහාර හා ජලය සැපයීම එඬේරාගේ මූලික කාර්යයකි. එඬේරාණෝ, බැටළුවන් "සුනිල් තණ බිම් මත සතප්වා" (ගීතා 23: 2) ඔවුන් "හොඳ තෘණවලින්" (එසකියෙල් 34: 14) පෝෂණය කරන්නාහ.

#### (ආ) මග පෙන්වීම රැක බලා ගැනීම හා සොයා ගෙන ඒම

එඬේරා නිතර ම බැටළුවන් සමග ම සිටියි (ගීතා 23: 4). මේ භූමිකාව පිළිබඳව එසකියෙල් 34: 16 පදය මතක තබා ගැනීම ඉතා වැදගත් ය. "මම නැති වූ බැටළුවා සොයන්නෙමි. මුළාව ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි.

තුවාල වූ බැටළුවාගේ තුවාල බඳින්නෙමි. ලෙඩ වූ බැටළුවන් රැකබලා ගන්නෙමි". සිය දණ්ඩෙන් හා සැරයටියෙන් මග පෙන්වන එඬේරා ගැන ගීතාවලියේ 23:4 කථා කරයි. ඔහු නැති වූවන් සොයා බලා තුවාල වූ දුබල වූ බැටළුවන් රැකබලා ගැනීමේ වගකීම් ඉටු කරන එඬේරත්වය ගැන එහි අවධාරණය කරයි.

## ඇ) ආරක්‍ෂා කිරීම හා ජීවිතය කැප කිරීම

මේ කාර්යය ද එඬේරකුගේ කාර්යභාරයේ වැදගත් එකකි. දාවිත් රජතුමා 'මරණය වැනි ගණ'ඳුරු රුදුරු නිම්නය මැදින් ගියත්' (ගීතාවලිය 23: 4) යනුවෙන් සඳහන් කරයි. දිව්‍ය එඬේරාණෝ සිය බැටළුවන් සමග සිට ඔවුන් ආරක්‍ෂා කරන්නාහ. එසේ ම 'සතුරන් ඉදිරියේ දී මංගල බොජුනක් පිළියෙල කර දීම' යනුවෙන් අදහස් වන්නේ බැටළුවන් හට (ජනතාව) දේව ආරක්ෂාව මුළුමනින් ලැබෙන හෙයින් නිදහසේ බිය සැක නැතිව කල් ගෙවිය හැකි බව යි. මින් මතුවන වැදගත් ම කාරණය නම් බැටළුවන් වෙනුවෙන් එඬේරා සිය ජීවිතය පරදුවට තබා කටයුතු කරමින් සිය ජීවිතය පවා ඔවුන් වෙනුවෙන් පූජා කිරීම යි. (ජොහාන් 10:11)

## (ඈ) හඳුනා ගැනීම

එඬේරකුගේ ඊළඟ ගුණාංගය නම් බැටළුවන් වෙත දක්වන සංවේදී බවත් ඔවුන් ගැන ඇති ගැඹුරු අවබෝධයත් ය. මේ සම්බන්ධයෙන් ජොහාන් තුමා ජේසුස් වහන්සේ සිය පියාණන් ඉතා ගැඹුරු ලෙස හඳුනන්නාක් මෙන් එඬේරාණන් ද සිය බැටළුවන් හඳුනන බව පවසයි. බැටළුවෝ ද එඬේරාගේ කටහඬ හඳුනති. (ජොහාන් 10: 4, 14--15) මෙයින් එඬේරාණන් හා බැටළුවන් අතර පවතින ගැඹුරු අභ්‍යන්තරික සම්බන්ධතාව පැහැදිලි වෙයි.



දැන් අපි එඬේරත්වය තුළ

(I) අපි එඬේරුන් ලෙස කටයුතු කළ යුතු ආකාරය

හා

(ii) බැටළුවන් ලෙස ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සිත් යොමු කරමු.

## එඬේරුන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු.

### (අ) එඬේර ප්‍රේමය:

එඬේරකු බැටළුවන් ගැන ක්‍රියා කරන්නේ ප්‍රේමය පෙරදැරිව ය. බැටළුවන් පෝෂණය කරන්නේත් ඔවුන්ට ආරක්ෂාව සලසන්නේත් ඔවුන් සොයා යන්නේත් එසේම ඔවුන්ගේ තුවාල බඳින්නේත් ප්‍රේමය නිසා ය. අපත් නායකයන් ලෙස ක්‍රියාකරන විට අධිකාරිත්වයක් ප්‍රකාශ කිරීමට වඩා අපේ භාරයට දී සිටින අය ගැන ක්‍රියා කළ යුතු වන්නේ ප්‍රේමය පෙරදැරිව ය.

### (ආ) කැපවීම හා වැයවීම

කැපවීම හා වැයවීම ප්‍රේමයේ මූලිකාංග වේ. ජේසුස් වහන්සේ සිය දිවිය යාගයක් ලෙස පූජා කරන තරමට කැප වූ සේක. (ජොහාන් 10: 15). අපත් අපගේ ආත්මාර්ථකාමී පිළිවෙත් පසෙක ලා සමාජයේ සිටින අය වෙනුවෙන් කැපවීමෙන් හා වැයවීමෙන් සේවය කිරීම අවශ්‍ය වේ.

### (ඇ) සේවකත්වය:

අපගේ යහපත් එඬේරාණන් වන්නේ දෙවියන් වහන්සේ මය. ඒ නිසා දෙවියන් වහන්සේ තුළ ඇදහිල්ලෙන්, උන්වහන්සේ හා බැඳී පැවතෙමින් සමාජයට සේවය කිරීම වැදගත් ය. ජොහාන් 10: 16 පදය මෙලෙස සඳහන් කරයි. "තව ද මේ රැළට අයිති නොවූ අන් බැටළුවෝ ද මට ඇත්තාහ." මේ අනුව එඬේරාගේ රැළ යනු අප පමණක් ම නොවන අතර, අපට පරිබාහිරව සිටින අන්‍ය බැටළුවන් (අන් අය) වෙත ද අපගේ සේවය විහිදුවාලිය යුතු බව අවධාරණය කරයි.

## බැටළුවන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු.

### (අ) එඬේරාගේ හඬට ප්‍රතිචාර දැක්වීම.

යහපත් එඬේරා වන ජේසුස් වහන්සේගේ හඬ හඳුනාගෙන උන් වහන්සේ පසුපස යන්නට තීරණය කිරීම මගින් වංක එඬේරුන් පසුපස යෑම වැළකෙයි. (ජොහාන් 10: 4--5)

### (ආ) එඬේරාගේ හඬට පිටුපෑමෙන් සිදුවන අන්තරාය

"දොරටුව මම ය, මා තුළින් යමෙක් ඇතුළු වන්නේ ද, ඔහු ගලවනු ලැබ, ඇතුළට හා පිටතට ගොස් ආහාර ලබන්නේ ය" (ජොහාන් 10: 8).

ජේසුස් වහන්සේගේ කැමැත්තට අනුකූල වීමෙන්, බැටළුවන් වන අප අන්තරාදායක තත්ත්ව වලින් මිදේ. එහෙත් දේව කැමැත්තට යටත් නොවීමෙන් අපගේ ජීවිතය බොහෝ විට විනාශය හා අන්තරාදායක තත්ත්ව කරා ගමන් කරනු ඇත.

### (ඇ) විශ්වාසවන්ත බැටළු එඬේරාණන් හට කීකරු වීම

"මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය, සපුරා ම එය ලැබෙන පිණිස ය"

බැටළු එඬේරාණන්ට කීකරු වීම හා විශ්වාසවන්ත ව සිටීම තුළ බැටළුවන් වන අප හට පූර්ණ ජීවනය අත්දැකීමේ අවස්ථාව හිමි වෙයි.

අයහපත් එඬේරුන් බොහෝ දෙනෙකු අප වටා සිටිය හැකි ය. එවැනි අය ක්‍රියා කරන ආකාරය තේරුම් ගනිමින්, යහපත් එඬේරාණන් කෙරෙහි පමණක් විශ්වාසවන්ත ව සිටීම වැදගත් ය.

මක් නිසා ද අයහපත් එඬේරුන්ගේ අරමුණ විනාශකාරී ය. (ජොහාන් 10: 10)

"සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් පමණකි".
(ජොහාන් 10: 12).

"එඬේරකු නො වන, එසේ ම බැටළුවන්ගේ අයිතිකාරයා ද නොවන කුලීකාරයා වෘකයා එනු දැක බැටළුවන් හැර දමා පළා යන්නේ ය"

ඉහත සියලු කරුණු දැන ගැනීම තුළින් ජේසුස් වහන්සේ අපගේ එක ම යහපත් එඬේරාණන් බව පැහැදිලි වේ. තව ද අපි උන්වහන්සේගේ රැළෙහි බැටළුවන් ලෙස උන්වහන්සේට විශ්වාසවන්තව සිටිය යුතු බවත් මින් හෙළි වේ. රැළෙන් වෙන් ව ආත්මාර්ථකාමී වීමෙන් ලෝකයේ නපුරාට හසු වන බව අවබෝධ කර ගනිමින් අපි අපගේ කිතුනු ජීවිතය අර්ථවත් කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. පහත සඳහන් බයිබල් කොටස් කියවා යහපත් බැටළු එඬේරාණන්ගේ ලක්ෂණ ගීතාවලිය 23 පරිච්ඡේදය හා එසකියෙල් 34: 1--8 හා 15-------18 ඇසුරෙන් ගොනු කරන්න.

2. දේව වචනයේ සඳහන් එඬේර චරිතාංග සිය ජීවිතයෙන් දැක්වූ ඔබ දන්නා මෑත කාලීන නායකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.

# 4 දුක් උසුලන සේවකයාණෝ

**අප බලාපොරොත්තු වන්නේ දුක් උසුලන සේවකයාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළින් අපගේ ජීවිත සවිමත් කර ගැනීමයි. ඒ සඳහා ප්‍රවේශයක් ලෙස නොයෙකුත් දුක් විඳීම් මැදින් ගමන් කළ අය පිළිබඳවත් යෙසායාතුමන්ගේ විග්‍රහය පිළිබඳවත් ප්‍රායෝගික අභියෝග පිළිබඳවත් සලකා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ජෝබ් 1 පරිච්ඡේදය, ජෙරමියා 38: 1-13, යෙසායා 42: 1-4**

ගුරුතුමී : අද අපි ඇදහිල්ල නිසා දුක් වින්ද කිහිපදෙනකු අතරින් ජෝබ් හා ජෙරමියා ගැන සාකච්ඡා කරමු.

ශෙහාන් : අපි හරි ආසයි ජෝබ්ගේ කථාව දැනගන්න.

ගුරුතුමී : අපි දැන් ජෝබ් පළමුවෙනි පරිච්ඡේදය පෙරළා ගනිමු.

**කියවා බලමු.**

**ජෝබ් 1 පරිච්ඡේදය**

ගුරුතුමී : මේ බයිබල් කොටසින් පැහැදිලි වන්නේ දෙවියන් වහන්සේ ජෝබ්ගේ ඇදහිල්ල ශක්තිමත් බව දැනගෙන සිටිය බව යි.

ප්‍රවීන් : ඇයි එහෙම නම් එයාට ගොඩාක් කරදර ආවේ?

ගුරුතුමී : ඒ බව තමයි මම දැන් විස්තර කරන්න යන්නේ. එයාගේ ගේ දොර, ඉඩකඩම්, දරුවන්, මෙහෙකරුවන්, බැටළුවන්, ඔටුවන් යනාදි සියලු දේ එයාට අහිමි වුණත් මේ සියල්ලට ම වඩා දෙවියන් වහන්සේ ගැන ස්ථිර විශ්වාසයක් ජෝබ්ට තිබුණා. සියලු දේපළ වස්තුව සාතන් විසින් අහිමි කළත් ජෝබ් දෙවියන් වහන්සේ කෙරෙහි තැබූ ඇදහිල්ල සොලවන්නට සාතන්ට බැරි වුණා.

ගීතිකා : ඒත් ජෝබ් සාතන්ගේ ක්‍රියාවට යටත් වුණේ නැති එක නම්, හරි පුදුමයක් නේ ද?

ගුරුතුමී : ඔව්, ජෝබ් සාතන්ට යටත් වුණේ ම නැහැ. පසුව මුළු ඇඟ පුරා ම ඔහුට දරුණු ලෙස කුෂ්ඨයක් පවා හැදුණා. ඒත් වැරදිලාවත් ඔහු දෙවියන් වහන්සේට දොස් කීවේ නැහැ.

ශෙහාන් : හරි පුදුමයි, මෙච්චර දුක් කරදර ඇති වුණත් සියල්ල අහිමි වුණත් එයාගේ ඇදහිල්ල අඩු වුණේ ම නැති එක නම් හරිම පුදුමයක්!

ගුරුතුමී : ඒ ගැන තමයි අද අපි ඉගෙන ගන්නේ. ජෝබ්ට සාතන් පහර දෙන්න පහර දෙන්න ජෝබ් දෙවියන් වහන්සේට තවත් ළං වෙනවා. පැමිණි සියලු දුක් වේදනා කිසි විටක ඔහු, ඔහුගේ ඇදහිල්ලට බාධාවක් කර ගත්තේ නැහැ.

ප්‍රවීන් : ඒක නම් හරි ම ශ්‍රේෂ්ඨ ඇදහිල්ලක් නේ ද ?

ගුරුතුමී : ඒ වගේ ම අපි දැන් ජෙරමියා ගැනත් දැන ගනිමු. ප්‍රවීන් පුතා කියවන්න බලන්න ජෙරමියා පොතේ 38 වන පරිච්ඡේදය

**කියවා බලමු.**

**ජෙරමියා 38 පරිච්ඡේදය**

ගුරුතුමා : ශෙහාන් කියන්න බලන්න, දැන් කියවූ බයිබල් කොටස පිළිබඳ පොඩි විස්තරයක්.

ශෙහාන් : මෙය බැබිලෝනියාවේ අධිරාජ්‍යයාගෙන් ජුදා දේශයට තර්ජන තිබුණ කාලයක සිදු වුණ දෙයක්. ජෙරමියා දෙවියන් වහන්සේගේ වචනය ජුදා ජනතාව වෙත ඉදිරිපත් කළා.

ගුරුතුමී : බොහොම හොඳයි. බයිබල් කියවීමට හොඳින් ඇහුම්කන් දී තිබෙනවා.

ගීතිකා : ජෙරමියා ජුදා ජනතාවට දුන් විශේෂ පණිවුඩය මොකක් ද?

ගුරුතුමී : ඔහු අනාවැකියක් කීවා. ජුදා සෙනග බැබිලෝනියට රැගෙන යන බව. ඒ ගැන පැවසූ විට මොකක්ද සිද්ධ වුණේ කියලා, ප්‍රවීන් කියන්න බලන්න.

ප්‍රවීන් : ජුදා අධිපතීන් විසින් ඔහු හිරගෙදර තිබුණු මඩ පිරුණු ළිඳකට දමා දවස් ගණනක් කිසිම කෑමක් නැතිව තැබුවා. පසුව රජතුමා ඔහු ගැන පණිවුඩයක් ලැබුණාට පසු ඔහු ළිඳෙන් ගොඩ ගන්නා ලෙස අණ කළා. ජෙරමියා මරණින් බේරුණා.

ගුරුතුමී : හරියට හරි. ඒක ඇත්ත. අපි මෙයින් ඉගෙන ගන්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කරන්නට සිදුවන විට, අපට දරා ගන්නට බැරි දුක් කරදරවලට මුහුණ දෙන්නට සිදුවන බව. ඒත් අපි දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් යුතුව ස්ථිර ව ජීවත් වන විට දෙවියන්වහන්සේ අපත් සමග ඒ සෑම දුක් අවස්ථාවල දී ම ඉන්න බව පැහැදිලි යි.

## දුක් විඳින සේවකයාණෝ (යෙසායා 53: 12, 42: 1-4)

ජුදෙව් ජනතාව මෙසියස් වහන්සේ එනතුරු බලා සිටියහ. මෙය මීට කලින් පාඩමක අපි අධ්‍යයනය කළෙමු. ඔවුන් මෙසියස් හෙවත් ආලේප ලත් තැනැත්තා සම්බන්ධයෙන් නිතර බලාපොරොත්තු වුණේ රාජකීය හා දේශපාලන භූමිකාවකි. දාවිත් වැනි රජවරුන්ගෙන් ඔවුන් බලාපොරොත්තු වූ විශේෂ ගුණාංගයන් හා හැකියාවන් තිබුණි. එහෙත් යෙසායා දිවැසිවරයා ජනතාවගේ බලාපොරොත්තුවලට හාත්පසින් වෙනස් වූ භූමිකාවක් ගැන කථා කළේ ය.

කීර්තිය හා බලය වෙනුවට යටහත් පහත්කම, ඉවසීම හා දුක් දැරීම යන චරිත ලක්ෂණවලින් යුක්ත කෙනකු ගැන අපට යෙසායා දිවැසිවරයා වරින් වර සිය දිවැසාවලියේ කරුණු දක්වයි. අපගේ ශුද්ධ ලියවිලි පාඨ දෙකේ ම දුක් විඳින සේවකයාණන් ගැන සඳහන් කරුණු අපි සම්පිණ්ඩනය කරමු.

- එතුමාණෝ දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය ලබා සිටී. (යෙසායා 42:1)
- සැර පරුෂ ගති ලක්ෂණ වෙනුවට මෘදු ලීලාවකින් සැරසී සිටියි. (යෙසායා 42: 2)
- දුක් පීඩාවට ලක්වූවන් තවත් පීඩාවලට ලක් නොකරයි. (යෙසායා 42: 3)
- අධෛර්ය නොවන මෙහෙකරු, කලකිරීමට ලක් නොවී, යුක්ති සහගත ලෙස ක්‍රියා කරයි. (යෙසායා 42: 4)
- සේවකයාණන් අපගේ පාපයේ අශෝබන බව සිය හදවතින් හා මුහුණින් දරන නිසා, සේවකයාණන්ට සිත් ඇදගන්නා රූපයක් නැති බව යෙසායාතුමා සිතුවම් කරයි. (යෙසායා 52: 02)
- දුක හා වද වේදනා දරයි. (යෙසායා 53: 3)
- අප වෙනුවෙන් ලද පහරවලින් අපට සුවය ලැබී තිබේ. (යෙසායා 53: 5)
- මරණය, අපගේ පව් කමා කරන පූජා වීමේ මරණයකි. (යෙසායා 53: 10)
- පව්කරුවන්ගේ පව් දරා ගනිමින් මැදහත්කාරකම් කරයි. (යෙසායා 53: 12)

මෙම සියලු ලක්ෂණවලින් පැහැදිලි වන්නේ මේවා මෙසියස් වහන්සේගේ එනම් ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම සම්බන්ධ පූර්ව ඡායාවක් සහිත දිවැසි වාක්‍ය බවයි.



## දුක් විඳින සේවකයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ

යෙසායා පොතෙන් හුවා දක්වන දුක් විඳින සේවකයාණන්, මෙසියස් වහන්සේ පිළිබඳ රූපකයේ සැබෑ ස්වභාවය හෙළිදරව් කරන්නකි. දුක් විඳින සේවකයාණන්ගේ කාර්ය භාරය සම්පූර්ණ කරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ බව නව ගිවිසුම අපට සාක්ෂි දරයි.

යෙසායා 5: 41 පදයේ සඳහන් මේ කරුණු මතෙව් 8: 17 පදයේ මෙසේ සඳහන් වී තිබේ. එනම් "උන් වහන්සේ අපගේ දුබලකම් දරාගත් සේක. අපගේ රෝ දුක් බර උසුලාගත් සේකැ යි යෙසායා දිවැසිවරයා විසින් කියන ලද කීම ඉටුවන පිණිස යි"යනුවෙනි. මෙම පදයෙන් විස්තර වන දුක් විඳින සේවකයාණන් වන ජේසුස් වහන්සේ සැබෑ ලෙසින් ම දුක් විඳ කුරුසිපත් වී මරණයට නියම වූ බව ශුභාරංචි පොත් හෙළි කරන අතර, එය දේව කැමැත්ත අනුව සිදු වූවක් ම විය. එම දුක් විඳීමේ ප්‍රතිඵලය වූයේ උන්වහන්සේගේ විජයග්‍රාහී උත්ථානය යි.

ඉන් පැහැදිලි වන්නේ ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින සේවකයාණන් ලෙස දේව කැමැත්තට භාර වීමෙන් තමන්ට වන අවදානම ගැන නොසලකා පසුබට නොවී, ධෛර්යයෙන් යුතුව මුළු ලෝකය උදෙසා ජීවිතය පිදූ බව යි.

## දුක් විඳින සේවකයාණන් හා අපි

දුක් විඳින සේවකයාණන්ගේ කාර්ය භාරය අපට දෙයාකාරයකින් අදාළ වේ.

- ❖ උන්වහන්සේගේ දුක් විඳීම කරණ කොටගෙන අපට මිදීම හා සහනය ලැබෙන නිසා අපි උන්වහන්සේ හා ඇදහිල්ලෙන් බැඳී ක්‍රියා කළ යුතු ය. එවිට උන්වහන්සේගේ දුක් විඳීමේ පූර්ණ ආනිසංසය අපට ලැබේ.

- ❖ මමත්වය නසා ගනිමින් පරාර්ථකාමී සේවකත්වයකට ඇතුළු වීම අවශ්‍ය ය. ඒ තුළ කුරුසි මාර්ගය අනුගමනය කිරීමෙන් අපි ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත ආදර්ශය අනුව ක්‍රියා කරමු. ලෝකයෙන් පැමිණෙන විවිධ පීඩාවන්, අපවාද, දුක් කරදර සියල්ලට ධෛර්යයෙන් හා ඇදහිල්ලෙන් මුහුණ දෙමින් ගමන් කරමු. දුක් විඳීම හා පූජාවීම අපගේ සේවයේ අනිවාර්ය අංගයකි. අප, දේව බලය තුළ ශක්තිමත් කිතුනුවන් බවට පත් වන්නේ එවිට යි. එසේ අපගේ ජීවිතයට පැමිණෙන දුක් පීඩා විඳ දරා ගනිමින් දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමට අපි අදිටන් කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

01. යෙසායාතුමාගේ පොතේ 42:1--4 දක්වා ඇති කොටසේ දුක් විඳින සේවකයාණන්ගේ ලක්ෂණ හතරක් ලියන්න

02. පහත සඳහන් පුද්ගලයින් පිළිබඳව කරුණු සොයා බලා ඔවුන්ගේ ජීවිතවලින් අදාළ කරගත හැකි යහපත් ගුණාංග දෙක බැගින් ලියන්න.



නෙල්සන් මැන්ඩෙලා මහතා



මයිකල් රුද්‍රිගු පියතුමා

# 5 ප්‍රේමයෙන් දිවි ගෙවමු

ප්‍රේමය විශ්වීය පණිවුඩයක් ගෙන දෙන වචනයකි. සකල විශ්වයේ අධිපතියාණන් වන දෙවියන් වහන්සේ "ප්‍රේමය" වන අතර, උන්වහන්සේ එම ප්‍රේමය ලොවට දායාද කළ සේක. මෙලෙස දායාද කළ ප්‍රේමය දෙවියන් වහන්සේ හා මිනිසා අතරත්, දෙවියන් වහන්සේ හා මැවීම අතරත්, මිනිසා හා මැවිල්ල අතරත්, එකිනෙකට සම්බනධ වන ගැඹුරු අර්ථවත් දේව දායාදයකි. මෙම පාඩමෙන් එම ප්‍රේමයේ වටිනාකම තහවුරු කර ගැනීම අපේක්ෂිත ය.

1 කොරින්ති 13, පිලිප්පි 2: 1-2, එපීස 3:17-19, මාර්ක් 12:29-33

මිනිසා කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොව ආරම්භයේ දීම විද්‍යමාන විය.

මිනිසාගේ අකීකරුකම හා තෘෂ්ණාව හේතු කොටගෙන, දේව ප්‍රේමයෙන් ඈත්වීම සිදු විය.

මේ නිසා මිනිසාගේ සිත දූෂණය විය. එහෙත් දෙවියන්වහන්සේ මිනිසාට දක්වන ප්‍රේමය කිසි ලෙසකින්වත් අඩු නොකළ බව ශුද්ධ බයිබලයෙන් පෙනේ.

දේව ප්‍රේමයෙන් ඈත් වීම කරණකොට ගෙන මිනිසා දූෂිත තත්ත්වයට පත්වීමට මූලික වූ කරුණු පහත රූපය තුළින් අවබෝධ කර ගනිමු.



ප්‍රේමය පිළිබඳව පාවුලුතුමා කොරින්ති වාසීන්ට ලියූ හසුනේ 'ප්‍රේම පාරමිතාව'


**කියවා බලමු.**

**1 කොරින්ති 13:1-13**

මිනිසුන්ගේ හා දේව දූතයන්ගේ භාෂාවලින් කථා කළත්,
දිවැසි වැකි දෙසීමේ වරම් තිබුණත්,
සියලු අභිරහස් ගැන අවබෝධය ද
සකල ඥානය ද තිබුණත්,
බලවත් විශ්වාසයක් තිබුණත්
දන් දීම සඳහා සියල්ල වෙන් කළත්,
**ප්‍රේමය නොමැති නම්**
මම ඝෝෂා කරන සාණ්ටාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට හෝ සමාන වන හිස් තැනැත්තෙක් වෙමි.

දැන් අපි ප්‍රේමය අපගේ ජීවිතවලට කොතරම් අවශ්‍ය වන්නේ දැයි සොයා බැලීමට යොමු වෙමු.

**ප්‍රේමය**




**සදහට ම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව ප්‍රේමයයි.**

ඉහත සඳහන් ලක්ෂණ අනුව 'ප්‍රේමය' යන වචනයේ ගැඹුරු බව හා අර්ථවත් බව අපට පෙන්නුම් කරන අතර, කිතුනු ජීවිතයට ඇති ප්‍රේමයේ පදනම මින් විග්‍රහ කෙරේ.

අප දැන් ජේසුස් වහන්සේ ප්‍රේමය සම්බන්ධව වදාළ එමෙන්ම ශ්‍රේෂ්ඨතම ආඥාව ලෙස දක්වා ඇති පහත සඳහන් බයිබල් කොටසට අපගේ අවධානය යොමු කරමු.

**කියවා බලමු.**

**ශු. මාක් 12:29-33**

**එහි ප්‍රධාන කොටස් දෙකකි.**

**1. තමාගේ මුළු ජීවිතයෙන්ම දෙවියන්වහන්සේට ප්‍රේම කිරීම.**

මින් අදහස් වන්නේ පුද්ගලයකු මුළු පුද්ගලභාවය තුළින් ම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම උන්වහන්සේගේ කැමැත්ත බවයි.

**2. තමාට මෙන් ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම.**

පුරාණ ජුදෙව්වරුන් අතර, අසල්වැසියන්ට ප්‍රේම කිරීම ඔවුන් තේරුම් ගත්තේ තමන්ගේ ම ජාතියේ සහ ආගමේ අයට පමණක් ප්‍රේමය දැක්වීමෙන් ය. නමුත් ජේසුස් වහන්සේ ජුදෙව්වකු ලෙසට මෙයට නව අර්ථ කථනයක් ගෙන දුන් සේක. ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව අසල්වැසියා යනු තමා වටා සිටින අවශ්‍යතාවෙන් පෙළෙන ඕනෑ ම කෙනකු බව පැහැදිලි ය. එම ප්‍රේමයට සීමාවක් නොමැත.

**එපීස 3: 17-19 දැන් අපි සැලකිල්ලට ගනිමු. එහි පාවුල්තුමා අපට පවසන්නේ,**

***සියලු සැදැහැවතුන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ<br>දිගත්, පළලත්, උසත්, ගැඹුරත් වටහාගෙන<br>ශක්තිය ලබා ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අවබෝධ කරගෙන<br>දෙවියන් වහන්සේගේ පරිපූර්ණතාවෙන් පූර්ණ වන පිණිස ද<br>යාච්ඤා කරන ලෙසයි.***

ප්‍රේමයේ පදනම මත තම ජීවිතය ගොඩනැගී ඇති විට එය **යාච්ඤාවෙන්** වඩා සවිමත් වන බව පාවුලුතුමා එපීස වැසියන්ට පෙන්වා දෙයි. එවැනි ජීවිතයකට ක්‍රිස්තුස් වහන්සේ සිත් තුළ වාසය කරන්ටත් ප්‍රේමයේ ස්ථිරව පිහිටා සිටින්ටත් **ඇදහිල්ල** අවශ්‍ය වේ. එසේ ම සියලු සැදැහැවතුන් සමග සාමූහික ව ක්‍රිස්තුස්වහන්සේගේ සීමා රහිත ප්‍රේමය අවබෝධ කර ගැනීම ද වැදගත් වෙයි. මෙසේ අපගේ ජීවිත ප්‍රේමයෙන් මුල් බැස ස්ථිර ව පිහිටා සිටින විට පූර්ණ ජීවිත බවට පත් වේ.

යම් පුද්ගලයකුට තම ජීවිත කාලය තුළදී විවිධ වයස් සීමාවන් පසු කිරීමට සිදු වේ. ඒ අනුව ප්‍රේමය අත්විඳින්නට අවස්ථාව උදාවේ. ප්‍රථමයෙන්ම යම් පුද්ගලයෙක් ළදරුවකු, දරුවකු හැටියට, අන් අයගේ ආදරය ලැබීමට යොමු වේ. අප බලාපොරොත්තු වන ප්‍රේමය ද, පෙරළා අප ඔවුන් වෙත දක්වන ප්‍රේමය ද ඉතාමත් සුන්දර ය. ඒ තුළින් ලබන සුරක්ෂිත බව, රැකවරණය දරුවකුහට ඔවුන් නව යොවුන් වියට එළඹෙන තෙක් ම අත්‍යවශ්‍ය ය. මේ කාලය තුළ අපට වඩා වයසෙන් වැඩි අත්දැකීමෙන් පූර්ණ වැඩිහිටියන්ටත්, ගුරුවරුන්ටත්, කීකරු ව කටයුතු කිරීමට සිදු වේ. විශ්වාසය, තේරුම් ගැනීම නිවැරදි බව ආදී ලක්ෂණ පෙරදැරිව කටයුතු කළහොත් වැඩිහිටියන් හා ගුරුවරුන්ගේ ප්‍රේමය දිනාගත නො හැකි ද? එම ප්‍රේමය තුළ නව යොවුන් වියේ දරුවකුගේ නිවැරදි මග සලකුණු වී ඇත.

පාසල් දිවියේ සුන්දර ම කාල පරාසය නව යොවුන් වියට අයත් වේ. මෙහි දී තම මිතුරු මිතුරියන්ට වඩා විශ්වාසවන්ත වූ කෙනකු නොමැති යැයි සිතා කටයුතු කරන බොහෝ අවස්ථාවන් අපගේ දිවිය තුළ දක ගත හැකි ය. නමුත් තම සම වයස් මට්ටමේ සිටින්නාවූ මිතුරකුට හෝ මිතුරියකට යම් ගැටලුවක් ඇති වුවහොත් අප ඔවුන්ගේ උදව්වට පැමිණිය යුතු ය. එවැනි අවස්ථාවක දී ක්‍රිස්තුස් වහන්සේට අයිති අප ඔහුට හෝ ඇයට බුද්ධිමත්ව තීරණ ගැනීමට උදව් වීම ප්‍රේමයේ ගුණාංගයක් බව තේරුම් ගැනීම වැදගත් වේ.

අප ජීවත් වන සමාජයේ, සභාවේ සහ පවුලේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වය ම සිටී. ජේසුස් වහන්සේ එවැනි සමාජයක අපට ජීවත් විය යුතු ආකාරය මනාව පෙන්වා දෙන සේක. පුරුෂ පාර්ශ්වය විසින් ස්ත්‍රී පාර්ශ්වය පහත නොහෙළා ප්‍රේමයෙන් පිළිගත යුතු බව පවසන සේක. උන්වහන්සේගේ ප්‍රේමය සමාජය විසින් පහත හෙළු ස්ත්‍රීන්ට ද දැක්වූ සේක. අප ද ප්‍රේමයේ තිබිය යුතු අසීමාන්තික ගුණාංගය තේරුම් ගෙන එකිනෙකාට ගෞරවයෙන් සැලකීම කළ යුතු ය. එය ප්‍රේමයේ පදනම යි.

ප්‍රේමය වඩාත් අර්ථ ගැන්වෙන්නේ වැය වීම තුළ ය. ජේසුස් වහන්සේගේ ජීවිතය, සේවය, දුක් විඳීම, මරණය තුළ ද ගැබ්ව ඇත්තේ පරිත්‍යාගි වූ ක්‍රියාකාරී ප්‍රේමය යි. සැබෑ ප්‍රේමය නම් එයයි. ප්‍රේමය ලොවට විදහාපාන අප ද දේව ප්‍රේමය කරණකොට ගෙන වැය වීමේ ප්‍රේමයකින් දිවි ගෙවීමට වග බලාගත යුතු ය.

මෙසේ කිතුනු අපගේ ජීවිත පැවැත්මෙන් නැගෙන ප්‍රේමයේ සිසිල් දිය දහරා මගින් සමාජය පුරා පවතින වෛරයේ, කුරිරුකමේ ගිනි ජාලා නිවා දැමිය යුතු ය. ක්‍රිස්තුස් වහන්සේ තුළින් දිස්වූ දෙවියන් වහන්සේගේ ප්‍රේමය ලොවට බෙදන්නට ක්‍රියාකාරී ප්‍රේමය යොදා ගනිමු.

**ක්‍රියාකාරකම**

1. කිතුනු අපගේ ජීවිත පදනම වන දේව ප්‍රේමය පිළිබඳ ඔබ උගත් ප්‍රායෝගික කරුණු 3 ක් ලියා දක්වන්න.

2. තම ජීවිතයෙන් ප්‍රේමය විදහා පෑ නූතන සමාජයේ චරිත දෙකක් අගයන්න.

# 6 සාමයට කැපවෙමු

"සාමය" අපි කවුරුත් අගය කරන්නෙමු. එයට හේතුව වන්නේ සාමය අපට නිදහස් බවක් හා 'සිතට අස්වැසිල්ලක් දනවන හැඟීමක් ඇති කරවන බැවිනි. එහෙයින් සාමය පිළිබඳව කථා කරන සැම විට ම යුක්තිය සම්බන්ධ කාරණා හා එකට බැඳී පවතින බවත් විශාල කැපකිරීමක් තුළින් පමණක් සාමය අත්දකිය හැකි බවත්, මෙම පාඩමෙන් අවබෝධ කරගැනීමට අපේක්ෂිත ය.

ශු. මතෙව් 5:9-12, යෙසායා 9:6-7

ජේසුස් වහන්සේ වදාළ කන්ද උඩ දේශනයේ දී සාමය ඇති කිරීම සම්බන්ධව අවධාරණය කරයි. එසේ කරන විට උන්වහන්සේ යුක්තිය උදෙසා පීඩා විඳීම සම්බන්ධව ද කථා කරයි. ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනයේ දී ප්‍රකාශ කළ වදන් විමසා බලමු.

**සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝ ය.**
**ඔවුහු දෙවියන් වහන්සේගේ**
**පුත්‍රයෝ යයි කියනු ලබන්නෝ ය.**
**යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝ ය.**
**ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.**
**ශු. මතෙව් 5:9-12**

මෙම වදන්වලින් පැහැදිලි කරන්නේ, සාමය උදෙසා වෙහෙසවී ක්‍රියා කිරීම දෙවියන් වහන්සේට ප්‍රසන්න කටයුත්තක් බවයි. ඒ සඳහා කැපවීමක් කළ යුතුයි. මෙම කැප කිරීම උසස් කැප කිරීමක් වන්නේ, තම ජීවිතය ගැන පවා නොතකා ක්‍රියා කරන විට ය. ඇතැම් අවස්ථාවල සාමය කඩවීමට පුද්ගලයකුගේ මුවින් නික්මෙන එක් වචනයක් හේතුපාදක වන්නට පුළුවනි. එසේ නම් සාමය බිඳී යන ක්‍රියාවලින් වැළකී සිටීම දේව අභිමතය යි. එම නිසා නිවසේ දී, පවුලේ දී, පාසලේ දී පමණක් නොව, තමා වෙසෙන සමාජය සහ වටපිටාව තුළ ද එය දෘශ්‍යමාන වීම මනුෂ්‍යත්වයට මඟ පාදන කාරණයක් වෙයි.

රට රටවල් වශයෙන්, ජාතීන් වශයෙන් කුලල් කා ගනිමින්, මනුෂ්‍ය ස්වභාවයට උචිත නොවන ලෙස ජීවිත හා දේපළ විනාශ කර ගනිමින්, එදිරිවාදිකම් හා පළිගැනීම් සිදු කිරීම දේව අභිමතයට එරෙහිව යන්නකි. එබැවින් සාමය ඇති කිරීමට වෙහෙසෙන සැවොම දෙවියන් වහන්සේගේ දරුකම උරුම කර ගන්නා බව ජේසුස් වහන්සේ පැවසූ කාරණය එදා මෙන් ම අදට ද ඉතා වැදගත් වන්නකි.

සාමය ඇති විය යුත්තේ කිසිම පුරවැසියකුට අසාධාරණයක් ඇති නොවීම පිළිබඳව සහතිකය කරණකොට ගෙන ය. ජේසුස් වහන්සේ යුක්තිය හා සාධාරණත්වය මත පදනම් වූ සාමය මෙලොවට උදාකර දුන් සේක. ඒ බව ජේසුස් වහන්සේ ලොව පහළ වීමට පෙර සිටම දිවැසිවර යෙසායා විසින් ප්‍රකාශ කර තිබුණි.

කියවා බලමු.

## යෙසායා 9:6-7

එම වදන්වලට අනුව එතුමාණන් විසින් පිහිටුවන රාජ්‍ය තුළ

සාමයට කෙළවරක් නොමැති බවත්
එය ස්ථිරව ම පිහිටුවන බවත්
එහි යුක්තිය හා ධර්මිෂ්ඨකම
රජකම් කරන බවත් සඳහන් ය.

ඉහත කරුණු පිළිබඳව ගැඹුරින් කල්පනා කරන විට යුක්තිය තුළින් සාමය උදාවන බවත්, යුක්තිය ඇති කිරීමට නම් ධර්මිෂ්ඨකම අත්‍යවශ්‍ය බවත් පැහැදිලි ය. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ධර්මිෂ්ඨකමින් රාජ්‍ය පාලනය කළ විවිධ රජවරුන් පිළිබඳ කථා අපි අසා ඇත්තෙමු.

ධර්මිෂ්ඨකමින් බිහිවන රාජ්‍ය පාලනය තුළ, යුක්ති ගරුක භාවය ඇතිවීම ප්‍රධාන ලක්ෂණයකි. ''යුක්තිය හා ධර්මිෂ්ඨකම රජයන විට සාමය ද රජයන බව" යෙසායා දිවැසිවරයා තවත් අවස්ථාවක ප්‍රකාශ කර ඇත. බහු ආගමික, බහු වාර්ගික හා බහු සංස්කෘතික වටපිටාවක් තුළ දිවි ගෙවන අප ද සහජීවනය තුළින් මෙය ඉෂ්ඨ කිරීමට කැප විය යුතු වේ.

සම්පූර්ණ වූ සාමයක් තුළ දිවි ගෙවීමට සෑම අයෙක් ම කැමැත්තක් දක්වති. ''**ශාලෝම්**'' යන හෙබ්‍රෙව් වචනය භාවිතා කරමින් සාමය පැතීමට ජුදෙව්වන් හා මුල් කිතුනුවෝ පුරුදු වී සිටි බව සඳහන් වේ. ''**අයිරේනියා**'' නමැති ග්‍රීක වචනයෙන් ද අදහස් කරන්නේ සම්පූර්ණ සාමය යි. මෙම කරුණුවලින් අදහස් වන්නේ පූර්ණ සාමය යනු පරිබාහිර ව අත්දැකිය හැකි ලක්ෂණයක් පමණක් නොවන බව යි. එසේ ම එය අභ්‍යන්තරික වශයෙනුත් අපගේ ජීවිත තුළ ඇති විය යුත්තක් බව පැහැදලි ය. එවිට සමාජය තුළ සිතුම් පැතුම් හා ආකල්පමය ලෙස ඇති වන පූර්ණ වෙනස හේතු කොට ගෙන, සාමකාමී ජන සමාජයක් ස්ථාපිත වනු ඇත.

ලෝකය පුරා සාමය ඇති කිරීමට මුල් වූ පුද්ගල චරිත බොහෝ ඇත. ආර්ථික, සමාජයීය, දේශපාලනමය හා ආගමික වශයෙන් ඇප කැප වෙමින් සාමය ස්ථාපිත කිරීමට ඔවුන් වෙහෙස දරා ඇති බව පැහැදිලි ය.

# ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා



ලක් කිතු සසුන තුළ සාමය වෙනුවෙන් ද ජනතාවගේ යහපත වෙනුවෙන් ද තම ජීවිතය පවා කැප කළ පූජකවරයකු ලෙස චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා හඳුන්වා දිය හැකි ය.

එතුමාගේ සම්පූර්ණ නම මාෂල් ක්‍රිස්ටි ප්‍රනාන්දු ය. එතුමාගේ උපත 1941 අගෝස්තු 09 වන දා මඩකලපුවේ දී සිදු වූ අතර 1972 දී නිල පූජකවරය ලබා මුලින් ම මඩකලපුවේ සහ ත්‍රිකුණාමලේ ප්‍රධාන දෙව් මැදුරුවල සහායක පියතුමා ලෙස සේවය කරන ලදි. 1981 ළමුන්ට නියම වී තිබූ වැඩ කොටස් ඉතාමත් අශාවෙන් හා උනන්දුවෙන් නිම කිරීමට උත්සාහ ගත් එතුමාට පූජක දිවියට පැමිණෙන ලෙස දුන් ආරාධනය ප්‍රතික්ෂේප නො කර පූජකවරයකු ලෙස තම සේවය ආරම්භ කළ බව සඳහන් වේ.

'පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහායි' යන උදාර ආකල්පය තුළ සිංහල, දමිළ, මුස්ලිම් යන ජන කොටස් වෙනුවෙන් තම ලැගුම් ගෙය පවා එතුමා පරිත්‍යාග කළ බව සඳහන් වේ. විවිධ ජන කොටස් අතරට ගොස් සුහදශීලි ව මෙම ගැටලු සාකච්ඡා කරමින් සෑම ජන කොටසක් සමග ම එකට වාසය කළ එතුමා සාමය ඇති කිරීමට විශාල වෙහෙසක් ගත් පියතුමකු ලෙසට ප්‍රසිද්ධ ය.

සභාව තුළ වෙසෙන පූජකයා තනතුරු හා බලය තුළ කටයුතු කිරීමට යාමේ දී ජනතාවට කළ යුතු සේවය පූජකවරුන්ගෙන් පැහැර හැරෙන බව දුටු මෙතුමා එය වළක්වාලමින් උපරිම වශයෙන් ජනතාවට තම සේවය ලබා දී ඇත. බොහෝ ප්‍රදේශවල පූජකවරුන්ට නැවතීමට ලැගුම් ගෙවල් නොමැති විට ජනතාව අතර ඔවුන්ට රැඳී සිටීමට හැකි ලෙස ඒවා නිර්මාණය කළ බව සඳහන් ය. "කිසිවෙක් තමාට ස්වාමියාණෝ කියා නොගන්න. නායකයා සේවකයා විය යුතුය." යන්න එතුමාගේ සේවයේ පදනම විය.

දේවස්ථාන මෙහෙවරෙන් ඔබ්බට ගිය සමාජ මෙහෙවර පිළිබඳ එතුමාගේ ම මිතුරු පූජකවරුන්ගේ විවේචනයට පාත්‍ර වුව ද ජන හිතවාදී සේවයට එතුමා වඩාත් ඇලුම් කළ බව පෙනිණ.

"මම ක්‍රිස්තියානි පූජකයෙක්. මම දෙවියන් අදහන්නෙක්. මම මිනිසුන්ගේ ජීවිතවලට ආදරෙයි. ඝාතනය මම හෙළා දකිමි," යනුවෙන් එතුමා දැඩි ලෙස ප්‍රකාශ කළ නිසා එතුමන්ට 1988 ජූලි 5 වන දින මඩකළපුවේ දෙව් මැදුරේ දී පැවති දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යයට සහභාගි වෙමින් සිටිය දී ම තම ජීවිතය අනපේක්ෂිත ලෙස පූජා කිරීමට සිදු විය.

# ගරු තිස්ස බාලසූරිය පියතුමා



සමාජ සාධාරණත්වය ගොඩනැගීම තුළ සාමය ස්ථාපිත කිරීමට කැප වූ තවත් එක් පියතුමකු ලෙස තිස්ස බාලසූරිය පියතුමන් හැඳින්විය හැකි ය. මරදානේ සමාජීය හා සාමයික කේන්ද්‍රයේ අධ්‍යක්ෂ ගරු සිරිමෙවන් තිස්ස බාලසූරිය පියතුමා ආර්ථික, සමාජීය හා දේශපාලන වශයෙන් මෙරටට විශාල මෙහෙයක් කර ඇත්තෙකි. උතුරු මැද පළාතේ කහටගස්දිගිලියේ දී 1924 අගෝස්තු 29 වන දින උපත ලද මෙතුමා පැවිදි කතෝලික පූජකවරය පතා නිමල මරිය නිකායේ පෙර පුහුණු ආයතනයකට බැඳුණේ 1945 දී ය. කිතුනු ලේඛන කලාව තුළ ප්‍රබලයෙකු වූ එතුමා ක්‍රිස්තුස් වහන්සේ දේව රාජ්‍ය ප්‍රකාශ කළ ශාස්තෘන් වහන්සේ කෙනෙක් ලෙස හඳුන්වා දී ඇත. වෛරය හා මිථ්‍යාවබෝධය පැරදවිය හැක්කේ හුදු ප්‍රේමයෙන් ම නොව සතුරන්ටද ප්‍රේම කිරීමෙන් හා සමාව දීමෙන් පමණක් බව තම කෘතීන් තුළින් එතුමා ප්‍රකාශ කර ඇත.

රට තුළ පවතින එක්සත්කම,නිදහස, සංවර්ධනය හා සමාජ සාධාරණත්වය තුළින් ජාති, ආගම් හා සමාජ අතර සමගිය හා සාමය ඇති කරගත හැකි බව එතුමා තරයේ විශ්වාස කළේ ය.

පැල්පත්වාසීන් පිළිබඳවත් ඔවුන්ගේ දිළිඳුකම පිළිබඳවත් තැවුණු එතුමා මූලික මිනිස් අවශ්‍යතාවක් වන නිවාස ප්‍රශ්න විසඳීමට ද, ආර්ථික සංවර්ධනය තුළ රැකියා සැපයීමේ අවශ්‍යතාව ද සඳහා වැඩසටහන් දියත් කිරීම තුළින් සමාජ සාධාරණත්වයට නව මං විවෘත කිරීමට දායක වී තිබේ. එතුමා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ආදර්ශ ලෝක ආගමික සමාජයක් මෙහෙයවීමට යොදාගත හැකි බව ප්‍රකාශ කළේය. ජේසුස් වහන්සේ තුළ පැවති මානව විමුක්තිය අපට උත්තරීතර ආදර්ශයක් බව එතුමා වැඩි දුරටත් පෙන්වා දුන්නේය.

යුක්තිය උදෙසා පීඩා විඳින අය මෙන් ම සාමය උදෙසා ක්‍රියා කරන අය ද මේ ලෝකයේ දී තදබල පීඩාවන් මැද්දේ ගමන් කරන අය බව පැහැදිලි වන අතර, දෙවියන් වහන්සේගේ දරුකමේ උරුමය තුළ ඔවුන්ට ඇතිවන උසස් ජීවිතය අප අවබෝධ කර ගත යුතු ය.

මුළු ලොව පාපයෙන් ගලවා ගන්නා පිණිස මාංශවත් ව මෙලොවට වැඩම කළ දේව පුත්‍රයාණෝ **"සාමයේ කුමරා"** ලෙස බයිබලයේ හඳුන්වනු ලබයි. එතුමා පීඩිත ජනතාව එයින් මුදවා, ද්වේශ සහගත සිත් ඇත්තන්ගේ සිත් මෘදු කොට, වෛරය ඇති තැන ප්‍රේමය දැක්වූ සේක. තවද තම ජීවිත ක්‍රියාකාරිත්වය තුළින්, ප්‍රේමය මත ම පදනම් වූ ලොවට දුන් සාමය එතුමාණෝ කුරුසියේ දිවි පිදීම දක්වා ම ගමන් කරමින් ලොවට

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ලොවට දුන් සාමය වැදගත් වන්නේ අප එකිනෙකා එම සාමයේ ආදර්ශය බෙදන්නට මූලික වීමෙන් බව බයිබලයේ ඉතා පැහැදිලිව ඉදිරිපත් වන සත්‍යයකි. සාමය ඇති කිරීමට මුල් වන සියලු ම කාරණා කෙරේ සිත යොමු කිරීම මගින් අප අන් අයගේ ජීවිත ආලෝකවත් කිරීමට වැය වීම දෙවියන් වහන්සේගේ කැමැත්ත බව තේරුම් ගනිමු.

**ක්‍රියාකාරකම**

1. කන්ද උඩ දේශනයේ සඳහන් ඉගැන්වීම් අපගේ ජීවිතවලට අදාලවන වැදගත් වන අවස්ථා අගයන්න.

2. සාමය ඇති කිරීම පිණිස කිතුනු දරුවන් ලෙස අපට ගත හැකි ක්‍රියාමාර්ග 3 ක් ලියා දක්වන්න.

# 7 කමාව අත් දකිමු


**මානව සංහතිය තුළ පැවතිය යුතු දේව ගුණාංගයක් ලෙසට කමාව හැඳින්විය හැකි ය. ජේසුස් වහන්සේ ප්‍රායෝගික ව තම ජීවිතයෙන් පෙන්වූ කමාව, තේරුම් ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ශු. මතෙව් 6: 12, 18: 21-35, එපීස 4: 32**

උදෑසන අවදි වූ මොහොතේ සිට නින්දට යන තුරු මිනිසා තම අරමුණු ඉටු කර ගැනීම සඳහා වෙහෙසෙයි. එම දිවි පෙවෙත තුළ තම පියා, මව, අඹුදරුවන්, ඥාතීන්, හිතවතුන් පමණක් නොව, තමන් ගැන වුව ද නිසි ලෙස සිතා කටයුතු කිරීමට ඔහුට/ඇයට කාල වේලාවක් නොමැත. ඒ දැඩි තරගකාරී, සංකීර්ණ ගමන තුළ දී මිනිසා සතු වටිනාකම් ගිලිහී ගොස් අනෙකාගේ දුකට සංවේදී වන්නට අවස්ථාවක් නොලැබීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

මෙම සියලු කාරණාවල දී මිනිසා සැප පහසුව පසුපස හඹා යන අතර, දුක් කරදරවලට මුහුණ දීමට අකමැති ය. මේ නිසා පරාර්ථකාමීව ගත කළ යුතු ජීවිත වෙනුවට යහපතින් හෝ අයහපතින් ඔහු/ඇය තම අවසාන ඉලක්ක ජය ගැනීමට වෙහෙස වීම කනගාටුදායක වේ.

යම් සමාජයක යහපැවැත්ම රඳා පවතින්නේ එම සමාජය තුළ යහපත් වටිනාකම් රැඳී පවතී නම් පමණි. එම වටිනාකම් අතර වැදගත් ගුණාංගය කමාව දීම වේ.




දුම්රියේ ක්‍රියාකාරිත්වය ආරම්භ වන්නේ එහි ඇති එන්ජිම ක්‍රියාත්මක වීමෙන් ය. එවිට ඒ හා සම්බන්ධව පවතින සියලු ම මැදිරි ද ක්‍රියාත්මක වේ. ඉන්ධන වැය කරමින් දුම්රියේ ක්‍රියාකාරිත්වය ආරම්භ වන්නාක් මෙන් කමාව දීමත්, කමාව ගැනීමත් තුළින් සමාජය තුළ සෙසු වටිනාකම් ස්ථාපිත වෙයි. දුම්රියක මැදිරි එකිනෙක හා සම්බන්ධ වී තිබෙන්නා සේ ම කමාව තුළින් ඇතිවන වටිනාකම් එකිනෙක බැඳී පවතින බවත් මෙයින් අපට අවබෝධ කර ගත හැකි ය.

මේ අනුව නිරන්තරයෙන් වැරදි කිරීම මනුෂ්‍ය ගතියකි. ඒ නිසා දේව ගුණාංගයක් වන කමාව දානය තුළින් සමාජය වඩාත් යහපත් කළ හැකිය. මෙය සමාජයට සැබෑ ලෙසින් ම දේව ගුණාංගයක් ලෙසට පෙන්වූයේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසිනි. කමාව පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම නම් කමාව දීමත්, කමාව ගැනීමත් සිදු කළ යුතු බවයි. කමාව පිළිබඳව බයිබලයේ මෙසේ සඳහන් වී ඇත.

කියවා බලමු.

**ශු. මතෙව් 6: 12**

මෙය ස්වාමින්වහන්සේ අපට ඉගැන්වූ යාච්ඤාවේ කමාව පිළිබඳ සඳහන් වී ඇති වදන් ය. අප දිනපතා යදින මෙම යැදුමේ කමාව දීම සහ ගැනීමේ වැදගත්කම ගැන ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට ඉගැන්වූ බව පැහැදිලි ය. මෙම යාච්ඤාව අප පවුලේ යාච්ඤාවක් ලෙස කරන නිසා සැම විට ම මේ වැකිය තුළ අන්‍යයන් සඳහා වන අපගේ වගකීම ඉස්මතු කරයි. මේ නිසා කිතුනු අප, මෙම යාච්ඤාව ඔප්පු කරන සැම විටම අපට කමාව ලබා ගැනීම සඳහා, අප විසින් අන් අයට කමාව ලබා දිය යුතු බව වටහා ගැනීම ඉතා වැදගත් ය.

කමාව ගැන ඉගැන්වූ ජේසුස් වහන්සේ, එය ඉගැන්වීමට ම පමණක් සීමා නොවී, කුරුසි පූජාවේ දී තමන්ට වරද කළ අයට කමාව දීම තුළින් එය ප්‍රත්‍යක්ෂ කළ සේක.

ජේසුස් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක වන පේදුරුතුමා ප්‍රකාශ කළේ ජුදෙව්වන්ගේ පිළිගැනීමට අනුව තමන්ට වරද කරන සහෝදරයාට සත්වරක් දක්වා කමාව දිය යුතු බවය.

කියවා බලමු.

**ශු. මතෙව් 18: 21-22**

ජේසුස් වහන්සේ අපේක්ෂා කළ කමාව දීම සත්වරක් දක්වා පමණක් නොව එහි සීමාවක් නොමැති බවත් මෙයින් අදහස් කෙරේ. මෙය කිරීම ඉතා අපහසු දෙයක් බව පෙනී ගියත් සැබෑ ලෙසින් ම අපට කමාව දීමේ ගැඹුරු අර්ථය වටහා ගැනීමට හැකි නම් අපට වරද කරන අයට සමාව දීමට අපට හැකි වේ. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඉගැන්වූ ලෙස අප ජීවිතය ඒ වෙනුවෙන් හැඩගස්වා ගැනීමට කටයුතු කරමු.

## දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ



තම ජීවිතයේ දී වෛරයට ද්වේශයට කමාව දානය කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයන් ගැන මෙනෙහි කිරීමේ දී කමාව දීමේ උතුම් ක්‍රියාව තම ජීවිත කාලය තුළ දී ම පෙන්වූ පුද්ගලයකු ලෙස වර්ෂ 1920 මැයි 18 දින පෝලන්තයේ උපත ලද දෙවන ජුවාම් පාවුළු පාප්වහන්සේ හැඳින්විය හැකි ය. 1981 මැයි මස 13 දින තුර්කි ජාතික අලි අග්කාර් නැමති දක්ෂ වෙඩික්කරුවාගේ වෙඩි පහරට එතුමා ලක් විය. රුදුරු වෙඩි උණ්ඩයේ ඉලක්කය වැරදුණි. එවිට දෙවන ජුවාම් පාවුළු පාප් වහන්සේ ප්‍රතිචාරයක් වශයෙන් අලි අග්කාර් රඳවා සිටි සිර මැදිරියට ගොස් "ඔබ කළ වරදට මම කමාව දෙමි." යනුවෙන් පවසමින් ඔහුට පවා කමාව දානය කළහ.

# ගරු පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා



ලක් සභා ඉතිහාසය තුළ කමාවේ ජීවිතයකට යොමු වූ තවත් එක් දේවගැතිතුමකු පිළිබඳ මෙසේ සඳහන් ව ඇත. එතුමාණෝ පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා ය. 1840 දී මෙතොදිස්ත සභාවේ පීටර් ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමා මොරටුවේ ලක්ෂපතියට නුදුරු අඟුලාන ප්‍රදේශයේ ඇති කළ සුභාරංචි විප්ලවය ඉතිහාසයේ සටහන් වී ඇත. ගමේ වැසියෝ ආශාවෙන් ඔහුගේ සුභාරංචි පණිවුඩය ඇසූ නමුදු සමහරු මෙම කටයුත්ත ගැන නොරිස්සූ හෙයින් ඇති වූ එක්තරා සිද්ධියක් මෙසේ සඳහන්ව ඇත.

දිනක් සුපුරුදු ලෙස ජෙරාඩ් ද සිල්වා දේවගැතිතුමන් අඟුලානට එන වේලාව බලා එක් තැබෑරුමක් ළඟ සැඟවී සිටි කිහිප දෙනෙක් ගොමවලින් ගැසීමට සූදානම්ව සිටියහ. වෙනදා එන වේලාවට වඩා ප්‍රමාද වුවත් ඇඳිරි වැටීගෙන එන වෙලාවේ දැවැන්ත පෝනියෙකු පිට නැගී එන තැනැත්තා මෙතුමා යයි සිතා ඔවුහු ගොමවලින් එතුමාට ගැසූහ. නමුත් පුදුමයෙකි. ඒ අශ්වාරෝහකයා කෝපයෙන් ඔවුන්ට පෙරලා පහර දුනි. පෝනියා ද ඔවුන්ට පහර දුන්නේ ය. අවසානයේ ඔවුනට පැහැදිලි වූයේ ඔවුන් ගොමවලින් පහර දී ඇත්තේ ඉංග්‍රීසි ජාතික පානදුරේ පොලිස් මහේස්ත්‍රාත්වරයාට බව ය. ඔවුන් හිර භාරයට ගන්නා ලදී. ද සිල්වා දේවගැතිතුමා ඔවුන් බැලීමට සිරගෙට ගොස් ඔවුන්ට කරුණාවෙන් කථා කළේ ය. සමාව දානය කළේ ය. පසුව ඔවුහු සිරගෙදරින් නිදහස් වී ආ සැණින් ම ඇදහිලිවන්ත කිතුනුවන් බවට පත් වූ බව ද සඳහන් වේ.

කමාව දීමේ උතුම් ගුණාංගය තම ජීවිතාදර්ශය තුළින් ලොවට ප්‍රකාශ කළ ජේසුස් වහන්සේ කිසි පවක් නො කළ සේක.

මිනිසා දෙවියන් වහන්සේගෙන් ඈත් වීමේ පාපය අවසන් කර, දෙවියන් වහන්සේ හා සමග සම්බන්ධ කිරීමේ උතුම් කාර්යය ජේසුස් වහන්සේ කමාව දීම තුළින් සම්පූර්ණ කරනු ලැබුයේ තම කුරුසියේ පූජාව තුළිනි. කිතුනුවන් වන අප හට තම වැරදි පිළිබඳ පසුතැවී අලුත් ජීවිතයක් ඇරඹීමට හැකි බව ස්නාවක ජොහාන්තුමා ආරම්භ කළ මනස්ථාපනයේ බව්තීස්මයෙන් තව දුරටත් පෙන්වා දෙයි.

වරදකට කමාව ලැබීමත්, කමාව දීමත් තුළ, එකිනෙකා අතර එතෙක් නොතිබුණු විශ්වාසනීයත්වයක් ගොඩ නැගේ. එසේ කමාව දීමත්, කමාව ලැබීමත්, දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් ලෙස පැහැදිලි වෙයි.

කමා වීමේ වැදගත්කම පෙන්වාදීම සඳහා ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමාවක් දෙස බලමු.

## කමා නොවූ දාසයා පිළිබඳ උපමාව

කියවා බලමු.

**ශු. මතෙව් 18: 21-35**

විශාල ණය බරකින් සිටි දාසයෙක් තම ණය ප්‍රමාණය ගැන ඉවසමින් කමාව දෙන්නැ යි තම ස්වාමියාගෙන් ඉල්ලීම.

ස්වාමියා දාසයාට අනුකම්පා කර ඔහු ණය බරින් නිදහස් කිරීම.

කමාව ලැබූ දාසයා ඉන් පසු  තමාට ණය වූ පුද්ගලයකු හමු වූ පසු එය නො ගෙවූ බැවින් ඔහු හිර අඩස්සියට පැමිණවීම.

එය ඇසූ ස්වාමියා තම දාසයා පිළිබඳ කෝප වී ඔහුට දඬුවම් කිරීම ..... ආදි අවස්ථාවන් පිළිබඳ සඳහන් ය.

**මෙම උපමාව මගින් ලැබෙන ආදර්ශය**

- කමාව දීමට අප ක්‍රියා කළ යුතු බව
- කමාව දීම දේව ගුණාංගයක් බව
- කමාව ඉල්ලීම තිවටකමක් නො වන බව
- කමාව අප කාටත් අවශ්‍ය බව
- කමාව දීමට හා කමාව ලැබීමට නැඹුරු වන අප දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන බව
- කමාව දීම හා ලැබීම තුළ ජීවිතය අලුත් වීමකට පත් වන බව

දෙවියන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ තුළින් අපට ලබා දුන් කමාව අප අන්අයට දානය කිරීමෙන් කිතුනුවන් වන අපි සමාජයට ආදර්ශයක් වෙමු. කමාව දීමටත්, කමාව ලැබීමටත් ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම්**

1. කමාව දානය කිරීම පිළිබඳ ක්‍රිස්තුස් වහන්සේ වදාළ ඉගැන්වීම් මොනවා ද ?

2. කිතුනු දරුවකු ලෙස කමාව ලබා ගැනීමටත්, කමාව දානය කිරීමටත් ඔබට යොමුවිය හැකි අවස්ථා 3 ක් ලියා දක්වන්න.

# 8 ඒකත්වයෙන් දිවි ගෙවමු

**අපගේ කිතුනු ඇදහිල්ල හා විශ්වාසය මත පදනම් ව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළ ඒකාබද්ධ ව සමාජය තුළ ජීවත් වීම වැදගත් වේ. කිතුනුවන් ලෙස ඒකත්වයෙන් දිවි ගෙවීමට අවශ්‍ය මග පෙන්වීම ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

ශු. ජොහාන් 15: 1-16, 17: 20-23, ගලාති 3: 28-29, එපීස 2: 14-16, 4: 16

විශ්වය තුළ පවතින පරිසර රටාවන් තුළ ඇති නොයෙකුත් විවිධත්වයන් මනහර ය. සත්ත්ව ලෝකයේ ඇති විවිධත්වයන් මෙන් ම මානව සමාජය තුළ, ජාතීන් අතර භාෂාවන් අතර, ආගම් අතර, ඇති විවිධ ලක්ෂණ මැද අපි ජීවත් වෙමු.

මෙම සියලු විවිධත්වයන් වටහා ගෙන, එම විවිධත්වවල ඇති අන්‍යෝන්‍ය සහජීවනය සහ යහපැවැත්ම උදෙසා කටයුතු කිරීම මානව වර්ගයා සතු කාර්යය විය යුතු වේ.



අප නෙත ගැටෙන මල් ගොමුවක් පිළිබඳව මෙනෙහි කරමු. පිපී පරවී ගියත් ඒ එක් එක් මලින් ඉටුවන සේවය ඉතා වැදගත් ය. හැඩයෙන් වෙනස් වුවත් පාට, සුවඳ විවිධ වුවත්, එක්ව තම වටිනා මෙහෙය ඉටුකිරීමේ වැදගත්කම තුළින් විවිධත්වය තුළ ඒකත්වයේ ඇති වටිනාකම විදහාපාන්නක් බව පැහැදිලි ය. අප ජීවත් වන පරිසරයට ඇතුළු වන විට අප අත්දකින මේ මුළු ලෝකයේ ඇති විවිධත්වය වටහා ගැනීම වැදගත් ය. අද ලෝකය විශ්ව ගම්මානයක් ලෙසට හඳුන්වා දී තිබේ. අප අපට ම කොටු වූ පටු ආකල්ප රටාවලින් මිදී පුළුල් දැක්මක් සහිත ව ජීවත් වීම අවශ්‍ය වේ.

විවිධත්වය තුළ ගොඩනැගෙන දැඩි සම්බන්ධතාවත් ඒ තුළ ඇති ශක්ති සම්පන්න භාවයත් කිතුනු දිවියේ පැවැත්මට අවශ්‍ය බව අප වටහා ගත යුතු වේ.

කියවා බලමු.

## ශු. ජොහාන් 15: 1-16

මෙය ජේසුස් වහන්සේ වදාළ උපමාවකි. මෙහි ගැබ්වන කාරණා මෙසේ ය. මිදි වැල ජේසුස් වහන්සේ ය. අතු කිතුනු අප ය. උද්‍යාන පාලකයාණෝ දෙවිපියාණන් වහන්සේ ය. උද්‍යාන පාලකයාණන් වන දෙවියන් වහන්සේ, තම පුත් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ තුළින් අප දේව සම්බන්ධතාවට ඇතුළු කරන සේක. ඒ සම්බන්ධතාව නිසා ම අප ක්‍රියාකාරි කිතුනුවන් ලෙස ලෝකයේ ජීවත් වීම දෙවියන් වහන්සේගේ කැමැත්ත යි. අත්ත මිදිවැලට යාවී නැත්නම් එල දැරීමට ඊට නොහැකි සේ, ජේසුස් වහන්සේ හා ඒකාබද්ධ වීමට යමෙකුට නොහැකි වන්නේ නම්, නියම කිතුනුවෙකු ලෙස දිවි ගෙවීමට

නො හැකි ය. කිතුනුවකු වශයෙන් නිසි ලෙස ඵල දැරීමට අප ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි මෙම බයිබල් කොටස අනුසාරයෙන් බලමු.

ඵල නො දරන සියලු අතු කපා හරින සේක.

ඵල දරන අතු පාහින සේක.

ඵල නොදරන අතු යනු, ජේසුස් වහන්සේට බද්ධව සිටියත්, දේව ගුණාංග ලෝකයට නො දීමට කටයුතු කරන අයයි. එවැනි අතු දේව රාජ්‍යයට ප්‍රයෝජනයක් නො වන අතු බව පෙනේ.

"යම් තැනැත්තෙකු මා තුළ නොසිටින්නේ නම් ඔහු අත්තක් මෙන් පිටතට දමනු ලැබ වියළී යයි." (ජොහාන් 15ඃ 6) ඵල දරන සියලු අතු යනු දේව රාජ්‍යයේ පැවැත්මට ප්‍රයෝජනවත් ලෙස දිවි ගෙවන අයයි. "ඔවුන් බහුල ලෙස ඵල දරන පිණිස, පවතින බව" යනු දෙවියන් වහන්සේ, උන්වහන්සේගේ රාජ්‍යයේ කාර්ය භාරය සඳහා අප යොදා ගැනීමයි. අපගේ ජීවිතවල ඇති ඵල දැරීමට ඇති බාධා ඉවත් කොට උන්වහන්සේට ම ප්‍රයෝජනවත් ලෙස අප යොදා ගැනීම එහි අරමුණයි.

දැන් අපි ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවේ වැදගත් කොටසකට අවධානය යොමු කරමු.

**කියවා බලමු.**

**ශු. ජොහාන් 17ඃ 20-23**

අද ලෝකය තුළ දිවි ගෙවන මිනිසුන් ඒකත්වය තුළ දිවි ගෙවීමට කැමැත්තක් නො දක්වන බව පෙනේ. රටක් රටකට, ජාතියක් ජාතියකට විරුද්ධ ව ලෝකය පුරා පවතින යුධ ගැටුම් එය සනාථ කිරීමට කදිම නිදසුනකි. මේ නිසා මිනිස් හදවත් තුළ පවතින වෛරය, ක්‍රෝධය, පළිගැනීම වැනි අයහපත් සිතුවිලි ඒකත්වයෙන් දිවි ගෙවීමට බාධාවක් වී ඇත.

මෙහි සඳහන් වන ඒකත්වය යන වචනය තුළින් දෙවියන් වහන්සේ හා ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අතර සම්බන්ධය පෙන්වා දේ. එසේ ම සභාවක් ලෙස කිතුනු අප ජේසුස් වහන්සේ සමග ඒකත්වයකින් සිටිය යුතු ය. මේ අනුව බලන කල දෙවියන් වහන්සේගේ කැමැත්ත නම්, කිතුනු අප උන්වහන්සේ අදහා ගෙන ජීවත් වීම යි. එමෙන් ම සභාවක් ලෙසට අප උන්වහන්සේ තුළ ඇති වන ඒකත්වය තුළින්, අප ජීවත් වන සමාජයට එම වටිනා ආදර්ශය හෙළිදරව් කිරීම ය.

ඒ අනුව අපට කිතුනුකම බෙදීම් වලට යටත් කිරීමට නොහැකි බව පෙනේ. ක්‍රිස්තුන් වහන්සේ උදෙසා සාක්ෂි දරන පිණිස ගොඩනැගුණු ශුද්ධ වූ සභාව අද වන විට විවිධ හේතූන් මත බෙදී වෙන් වී ඇත. ගැලවීමේ සැලැස්ම මානව සංහතිය වෙත ගෙනයන පිණිස මිහිපිට ගැලවීමේ ලකුණක් ලෙස පේදුරු අපෝස්තුළුතුමාගේ නායකත්වයෙන් ස්ථාපිත කළ ශුද්ධ සභාව, භේද වීම ජේසුස් වහන්සේ බලාපොරොත්තු වන්නක් නොවේ. ජේසුස් වහන්සේ අනුගාමී වන්නන්ගේ එකමුතු වීම උදෙසා උන්වහන්සේ යාච්ඤා කළ සේක. අද අප සැම දෙනාගේ වගකීම වන්නේ ක්‍රිස්තුස් වහන්සේ අදහමින් ඒකත්වයකට සාක්ෂි දරන ක්‍රිස්තු අනුගාමිකයන් ලෙස ජීවත් වීම යි.

කිතුනු සභාව නිකාය හැටියට බෙදී සිටීමත්, විවිධ කාරණා මුල් කර ගෙන වෙන් ව සිටින්නට උත්සාහ දැරීමත් හේතු කොට ගෙන, ක්‍රිස්තුස් වහන්සේ හා අප අතර ඇති ඒකත්වයේ ආදර්ශය සමාජය තුළ පළුදු වෙයි.

අප ඒකත්වයකින් යුතුව සිටින විට දෙවියන් වහන්සේගෙන් ක්‍රිස්තුස් වහන්සේ ලද තේජශ්‍රිය සම්පූර්ණත්වයට පත් වෙයි. (ජොහාන් 17: 22)

සියලු සභාවල තිබෙන යහපත් දේ මුල් කරගෙන සැබෑ කිතුනු සාක්ෂියක් දරන්නට අපට අපහසු නැත. මෙයින් අදහස් වන්නේ නිකායක් හැටියට අපගේ ඇති විවිධත්වය තුළට කොටු නොවී, පටු සීමාවෙන් බැහැර ව සභා එකමුතුවක් කරා ගමන් කළ හැකි බවයි.

වර්තමානයේ ජීවත් වන අප, සභා එකමුතුව සඳහා උත්සාහ දරන සංවිධාන ලෙසට ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL), ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය (TCL), ශ්‍රී ලංකා බයිබල් සමාගම (CBS), තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA) , තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA), ක්‍රිස්තියානි කම්කරු සහෝදරත්වය (CWF) නම් කළ හැකිය. මෙවන් ආයතන නිසා ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සභාව නිකායන් හැටියට බෙදීමකට ලක් නොවී එක ම කිතුනු ප්‍රජාවක් ලෙසට හඳුනා ගත හැකි ය.

ශ්‍රී ලංකා බයිබල් සමාගම රෝමානු කතෝලික සභාව ඇතුළුව ලංකාවේ සියලුම කිතුනු නිකායන් එකතු ව සැදුම් ලත් මණ්ඩලයකින් සමන්විත ව සිටීම, සමාජයට දී ඇති වටිනා ආදර්ශයකි. මේ අනුව ලංකාවේ ප්‍රධාන වශයෙන් සිංහල හා දෙමළ බයිබලය පරිවර්තනය කිරීම සඳහා මෙම සෑම කිතුනු නිකායක් ම සම්බන්ධ ව සිටියි. පහත බයිබල් කොටසේ සඳහන් වන ඒකත්වයේ පණිවිඩය සැබෑ ලෙසින් ම වර්තමාන ලෝකයට සුවිශාල ආදර්ශයක් ගෙන දෙයි.

**"ඔබ සියල්ලන් ක්‍රිස්තුස් වහන්සේ තුළ එක්කෙනෙකු මෙන් සිටින නිසා**
**ජුදෙව් ග්‍රීක භේදයවත්, දාස නිර්දාස භේදයවත් ස්ත්‍රී පුරුෂ භේදයවත් නැත.**
**ඔබ ක්‍රිස්තුස් වහන්සේට අයිති නම්**
**ඔබ ආබ්‍රහම්ගේ වංශයට අයිති ව**
**පොරොන්දුව ලෙස උරුමක්කාරයෝ ද වන්නාහු ය."**
**ගලාති 3: 28-29**

එසේ ම ලෝකයේ විවිධ රටවල් ගැන කල්පනා කරන විට එක ම ආගම අදහන එක ම ජාතියකට අයත් රටවල් ඇත්තේ අතලොස්සක් බව පෙනී යයි. යුද හා වාර්ගික ගැටුම් පවතින රටවල් ඒ ඒ විවිධත්වයන් තුළ ගැටුම් ඇතිකර ගෙන තිබෙන බව පෙනේ. ඊට මූලික හේතුව වී තිබෙන්නේ, එකිනෙකාට මෙන් ම විවිධ පිළිවෙත්වලට ගරු කිරීමට ඇති නොකැමැත්ත යි. එහි අසුභවාදී ලක්ෂණය නම් තමන්ගේ මතය සහ තමන්ගේ පිළිවෙත් පමණක් පැවතිය යුතු බව සිතන ආකල්පයත් ඒ තුළින් අන් අය යටත් කරමින් පාලනය කිරීමට දරන උත්සාහයත් ය. ශ්‍රී ලාංකිකයන් වශයෙන්, ආගම, ජාතිය කුමක් වුවත් අප එක ම රටක ජීවත් වන්නෙමු. අප රටේ පවතින බහු සංස්කෘතික රටාව තුළින් ගොඩනැගෙන සාරධර්ම සෑම කෙනෙකුගේම අභිවෘද්ධිය සඳහා අර්ථවත්ව භාවිත වීම ජාතික සමගියට අනුබල ලබා දෙන්නෙකි.

මේ සඳහා ආදර්ශය දිය යුත්තේ කිතුනු අප ය. එහි දී අපට ජනවර්ග හෝ ස්ත්‍රී පුරුෂ භේද හෝ පංති කුල භේද හෝ තිබිය නො හැකිය.ශ්‍රී ලංකාවේ කිතුනු සභාව තුළ ප්‍රධාන ජන වර්ග දෙකක් ම සිටීම විශේෂිත ය. එහෙයින් එම විවිධත්වය ප්‍රයෝජනයට ගනිමු. සභාව තුළ මෙන් ම රට තුළ ද සංහිඳියාවෙන් යුතු ඒකත්වයක් ගොඩ නැඟීමට වගකීමක් පැවරී තිබෙන බව ද තේරුම් ගනිමු. මෙසේ අපි ක්‍රිස්තුන් වහන්සේට අයිති දරුවන් වන පිණිස විවිධත්වය හා වෙනස්කම් මධ්‍යයේ ඒකත්වයේ සහෝදරත්වයෙන් බැඳී කටයුතු කරමු.

කියවා බලමු.

## එපීස 2: 14-16

පාවුලුතුමා එපීස වාසීන්ට ලියන ලද මෙම ලිපියේ ජුදෙව් හා විජාතීන් අතර තිබිය යුතු බැඳීම අවධාරණය කරමින් විස්තර කරයි.

**එම බයිබල් පාඨයේ ඇති කරුණු සැකෙවින් මෙසේ දක්වමු.**

ජේසුස් වහන්සේ මිනිසත් බව ලබා ගෙන යුදෙව්වන් හා විජාතීන් අතර තිබූ වෛරය ඇති කළ මැද බිත්තිය කඩා දැමූ බව.

විජාතීන් වෙන් කිරීම පිණිස තිබූ නීති රීති ඇතුළත් ව්‍යවස්ථාව අවලංගු කළ බව.

කුරුසිය කරණකොට ගෙන වෛරය නැති කර දෙවියන් වහන්සේ උදෙසා මෙම ජාතීන් දෙක ම එක ම ශරීරයක් වන පිණිස සමගි කළ බව.

මේ සියල්ල ජේසුස් වහන්සේ කුරුසියේ දිවි පිදීම තුළින් සනාථ විය. කිතුනු සභාව ව්‍යාප්ත වී ගිය ද අන්‍ය ජාතීන්ට සභාවට ඇතුළත් වීමට අවකාශ නොලැබුණි. එසේ වූයේ ජුදෙව් ව්‍යවස්ථාව අනුව චර්මඡේදන පිළිවෙත අනුගමනය නොකළ නිසා ය. එය ජනතාවට බාධාවක් බව පෙනී ගිය අවස්ථාවේ පාවුලුතුමා එය සමථයකට පත් කළේ ය.

දේව වරප්‍රසාදය තුළ ගැලවීම ලැබූ තැනැත්තන් බාහිර පිළිවෙත් කරණකොට ගෙන විජාතීන් ලෙස වෙන් කළ නොහැකි බව පාවුලු තුමා ප්‍රකාශ කළේ ය.

**"හිස වන උන්වහන්සේ කරණකොට ගෙන<br>මුළු ශරීරය, ඊට සපයා ඇති එක එක<br>අවයවයෙන් සන්ධි කොට ඒකාබද්ධ කරනු ලැබේ.<br>එක එක අවයව ඊට යුතු ලෙස ක්‍රියා කළ විට<br>මුළු ශරීරය ප්‍රේමයෙන් වැඩී වර්ධනය වේ."<br>එපීස 4:16**

ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් හා ස්වර්ගාරෝහණයෙන් පසු එක්වූ ඇදහිලිවතුන්ගෙන් ගොඩනැගුණු කිතුනු සභාවේ හිස වන්නේ ක්‍රිස්තුස් වහන්සේ ය.

විවිධ නිකාය යනු උන්වහන්සේට සම්බන්ධව සිටින විවිධ අවයවයි. නිකාය විවිධ වුව ද ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය කරණකොට ගෙන එක ම අරමුණක් තුළ සභා එකමුතුවක් ගොඩනැගිය හැකිය. මෙය වත්මන් කිතුනුවන් හැටියට අප තේරුම් ගෙන ක්‍රියා කරමු.

**ක්‍රියාකාරකම්**

1. බහු ආගමික හා බහු වාර්ගික රටක් තුළ දිවි ගෙවන අප හට නව ගිවිසුමෙහි ඉගැන්වීම් තුළින් විවිධත්වය තුළ ඒකත්වය වර්ධනය කළ හැකිවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

2. පාසල තුළ විවිධ ජාතීන්ට හා ආගම්වලට අයත් අය සමග කිතුනුවන් ලෙස මනුෂ්‍යත්වය අගය කරමින් ක්‍රියාකළ හැකි අවස්ථා 02ක් දක්වන්න.

# 9 බලාපොරොත්තුව හා සදාතන ජීවනය

**අපගේ ජීවිත අරමුණු ඉතා ප්‍රයෝජනවත් ලෙස, මෙලොව හා මතු ජීවිතයට යා කෙරෙන්නේ කෙසේද යන්න පිළිබඳවත් අප තුළ තිබිය යුතු ආත්මික වටිනාකම් පිළිබඳවත් අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය**

**පිලිප්පි 3: 7-11, රෝම 5: 1-6, 1 පේදුරු 1:13-21**

සෑම කෙනෙකු තුළ ම බලාපොරොත්තුවක් ඇති වීම ස්වභාවික ය. බලාපොරොත්තු ඇතිව ජීවත් වීමේ දී සමහර අවස්ථාවලදී ඒවා සම්පූර්ණ කරගැනීමට අසීරු කාරණා ය. එසේ වන්නේ අසීමිතව බලාපොරොත්තු පොදි බැඳ මේ ජීවිත ගමන යන්නට උත්සාහ කරන විටය. ලෞකික බලාපොරොත්තු අපට වැඩි වන තරමට, ඒවායින් යම් ප්‍රමාණයක් ඉටු නො වුනහොත් අපට කලකිරීමක් හා කණස්සල්ලක් ඇතිවෙයි. මෙසේ වූ විට අපේ ජීවිත කඩා වැටීමට ලක් වෙයි. සමහර විටක අප බලාපොරොත්තු නොවූ කාරණා සිදු වන විට, ප්‍රීතිය ද එසේම සමහර විට කනගාටුවද ඇති විය හැකි ය.

කිතුනුවන් ලෙසට අප මෙම තාවකාලික ලෞකික බලාපොරොත්තු ඉක්මවා යන උසස් බලාපොරොත්තු කෙරේ සිත යොමු කිරීම අවශ්‍ය ය.

අප පැරණි ගිවිසුම දෙස බලන කල ආබ්‍රහම්ගේ ජීවිතය මේ සඳහා නිදසුනකි. ආබ්‍රහම්ට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව මත ආබ්‍රහම් ඇති කර ගත් ස්ථිර බලාපොරොත්තුව නිසා, ඔහුට විශාල කැපකිරීමක් මෙන් ම ඉවසීමක් ද ඇති කර ගත යුතු විය.

"නුඹේ මව් බිම ද, නුඹේ නෑදෑයන් ද නුඹගේ පියාගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන දේශයට යන්න." කියා (උත්පත්ති 12: 1) දෙවියන් වහන්සේ පැවසූ විට ආබ්‍රහම් ඒ අණට කීකරුව ගමන ආරම්භ කරන ලදී. ඔබ දැනටම පෙර පාඩමක මෙය අධ්‍යයනය කර ඇත.

එමෙන් ම මෝසෙස් මිසරයේ දුක් විඳිමින් සිටි ජනතාව ඉදිරියේ තැබූ බලාපොරොත්තුව ඉටු කර ගැනීම සඳහා කාන්තාරය මැදින් කටුක ගමනක යෙදුණි. ඔව්හු එසේ යාමට කැමති වීම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය මත රැඳුණු බලාපොරොත්තුව නිසා සිදු වූවකි.

ආබ්‍රහම් සහ මෝසෙස් තමන්ගේ පෞද්ගලික බලාපොරොත්තු ඉවත දමා දෙවියන් වහන්සේ ඔවුන්ට ඇති කළ බලාපොරොත්තු කෙරේ රැඳෙමින් වෙහෙස වී ක්‍රියා කළහ. දෙවියන්වහන්සේ ඔවුන් සමග අවසානය දක්වා සිටි බව දේව වචනයෙන් පැහැදිලි වෙයි.

කිතුනුවන්ගේ බලාපොරොත්තුව තම කම ඉස්මතු කරමින් ආත්මාර්ථකාමීත්වයෙන් ගත හැකි බලාපොරොත්තුවක් නොවේ. එය සෑම විටම දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට පෙලඹෙන බලාපොරොත්තුවකි. මෝසෙස්තුමා විශාල සෙනඟක් කැටුව පාළුකරය මැදින් ගමන් කළේ, දෙවියන් වහන්සේ ඔවුන්ට ප්‍රදානය කිරීමට පොරොන්දු වූ දේශය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. එය මුළු ජනතාවක් තුළම ඇති වූ සාමූහික බලාපොරොත්තුවකි.

කිතුනු අපගේ බලාපොරොත්තුව වන්නේ ක්‍රිස්තුස් වහන්සේ යි. උන්වහන්සේ කෙරේ විශ්වාසය තබන කිතුනුවන්ගේ බලාපොරොත්තුව උන්වහන්සේ සමග ඒකත්වයට පැමිණීමය. මෙම බලාපොරොත්තුව සම්පූර්ණ වන දිනයක් පැමිණෙන්නේ ය. මෙහි අධිකාරිත්වය ඇත්තේ දෙවියන් වහන්සේට ය. මේ නිසා එම මහඟු බලාපොරොත්තුව මත තම ජීවිත රඳවා ගැනීමට උත්සාහ ගත යුතුවේ.

කියවා බලමු.

**රෝම 5:1-6**

"එපමණක් නොව, පීඩා විඳීමෙන් ඉවසීම ද ඉවසිල්ලෙන් තැන්පත් බව ද තැන්පත් බවින් බලාපොරොත්තුව ද උපදින බව දැන, අප විඳින පීඩාවල දී වුව ද අපි ප්‍රීති ප්‍රමෝද වෙමු. එබඳු බලාපොරොත්තුවකින්, කිසිම කලකිරීමක් ඇති නොවේ. මන්ද අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක." (රෝම 5:4--5)

පීඩා විඳින විට ප්‍රීති ප්‍රමෝද විය හැක්කේ කාහට ද? එසේ කළ හැකි යමෙකු ඇත්නම් ඔහු හෝ ඇය ක්‍රිස්තුස් වහන්සේට හිමි වූවකු වෙයි. එම උසස් බලාපොරොත්තුව ඉෂ්ට කර ගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ දේව ප්‍රේමය අපට ප්‍රදානය කරන සේක.

ඒ සඳහා කිතුනුවාට නොයෙක් අත්දැකීම්වලට මුහුණ දීමට සිදු වෙයි. පාවුල්තුමා රෝම වාසීන්ට විස්තර කරන මෙම බලාපොරොත්තුව තුළ ඇත්තේ ඉවසීම යි. අපගේ බලාපොරොත්තුව මරණයත් සමග නිමා නොවේ. ඒ බව ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයත්, මරණයත්, උත්ථානයත් තුළින් පෙන්වා දිය හැකි ය.

මේ අනුව බලන කල දෙවියන් වහන්සේ අපගේ ජීවිතයට උරුම කර දෙන උසස්ම තිළිණය වන්නේ සදාකාල ජීවනය යි.

(පහත සඳහන් බයිබල් පාඨද ඔබේ වැඩිදුර අධ්‍යයනට උපකාර වනු ඇත.)

| | |
|---|---|
| ශු. ජොහාන් 17:2 | "මන්ද ඔබ විසින් පුත්‍රයාණන්ට දෙන ලද සියල්ලන් හට සදාකාල ජීවනය දෙන පිණිස සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආධිපත්‍ය ඔබවහන්සේ පුත්‍රයාණන්ට දුන් සේක. |

| | |
|---|---|
| ශු.ජොහාන් 17:3 | "සදාකාල ජීවනය මේ ය.<br>එක ම සැබෑ දෙවිඳුන් වන ඔබ ද,<br>ඔබ විසින් එවන ලද තැනැත්වහන්සේ වන<br>ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ද දැනගැනීම ය." |

අප බලාපොරොත්තු වන සහ අපට උරුම වන සදාතන ජීවනයේ සම්පූර්ණත්වය ජේසුස් වහන්සේ තුළින් අපට ලැබේ. එය ඉෂ්ට කර ගැනීම පිණිස අප තුළ ඇති විය යුතු ජීවිත පරිවර්තනය සඳහා අවශ්‍ය කරුණු තුනක් ගැන දැන් විමසා බලමු.

**කියවා බලමු.**

**පිලිප්පි 3:7-11**

## 1. ධර්මිෂ්ඨකම

ඉහත බයිබල් පාඨය ඉදිරිපත් කිරීමෙන් පාවුලුතුමා, ධර්මිෂ්ඨකමේ ජීවිතයක් අත්පත් කර ගැනීම පිණිස අත්‍යවශ්‍ය කාරණා මෙසේ දක්වයි.

පාවුල්තුමා කිතුනුවකු වීමට පෙර විශ්වාස කළේ ව්‍යවස්ථාව පිළිපැදීමෙන් පමණක් සියල්ල උරුම කර ගත හැකි බවයි. නමුත් දෙවියන් වහන්සේ ඔහුට අවබෝධ කරනු ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහීම කරණකොට ගෙන ධර්මිෂ්ඨ ජීවිතයක් උරුම වන බවයි.

මාගේ කැමැත්ත

ක්‍රිස්තුන් වහන්සේ අත් කර ගැනීම

උන්වහන්සේ සමග ඒකාබද්ධ වීම

ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහීම

ඇදහිල්ල නිසා ධර්මිෂ්ටකම

## 2. ශුද්ධකම

**කියවා බලමු.**

**1 පේදුරු 1:13-21**

**ශුද්ධකමේ ජීවිතය**

ක්‍රිස්තුන් වහන්සේ මරණයෙන් උත්ථාන කොට මහිමයට පත් කළ දෙවියන් වහන්සේ ඇදහීම.

තෘෂ්ණාවලට වහල් නො වී කීකරු දරුවන් මෙන් හැසිරීම.

නිෂ්ඵල ජීවිත මාර්ග වලින් මිදීම.

හැසිරීමෙන් ශුද්ධ ව සිටීම.

ක්‍රිස්තුන් වහන්සේගේ දිවි පිදීම තුළින් තම කම නැසීම.

දේව ගරු බියෙන් ගත කිරීම.

## 3. උතුම් ප්‍රීතිය

**කියවා බලමු.**

**රෝම 5:2**

"තව ද ඇදහිල්ලෙන් අපට ලැබී ඇති මේ දේව වරප්‍රසාදයට පිවිසෙන මඟ අපට සලසා දුන්නේ උන්වහන්සේ ය. ඒ නිසා අපට හිමි වන්ට යන දේව මහිමයේ බලාපොරොත්තු ගැන අපි අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමු."

අපි මේ ලෝකයේ නොවැදගත් කාරණා කෙරේ සිත යොදවමින් ප්‍රීතිය ලබන්නට උත්සාහ කරමු. එනමුත් අපට නැති නොවන ප්‍රීතිය ලබා ගැනීමට, සදාතන ජීවනය උරුම කර දෙන ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වීම අවශ්‍ය ය.

කිතුනු අපි ක්‍රිස්තුන් වහන්සේ නො දුටු නමුත් උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු. අපි උන්වහන්සේ දැන් නො දකින නමුත් උන්වහන්සේ අදහා ගන්නෙමු. එම ඇදහිල්ල නිසා ම, අපගේ ආත්ම ගලවනු ලබයි. එවිට කියා නිමකළ නොහැකි, තේජාන්විත මහා ප්‍රීතියකින් අපි ප්‍රීති ප්‍රමෝද වන්නෙමු. අපගේ ජීවමාන බලාපොරොත්තුව එය මය.

මෙම කරුණු අවබෝධ කර ගැනීමෙන්, අපට පැහැදිලි වන්නේ සදාකාල ජීවනය උරුම කර ගැනීම පිළිබඳවය. එම කාරණයේදී ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන්, අපගේ මෙලොව ජීවිතය පරිවර්තනීය ජීවිතයක් කරා ගෙන යා යුතු වෙයි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා අප තුළ ඇති විය යුතු ධර්මිෂ්ඨකම, ශුද්ධකම හා පරිපූර්ණ ප්‍රීතිය සදාතන ජීවනය කරා අප ගෙන යන මූලික සිද්ධාන්ත වෙයි. මෙලොව අප ගත කරන මරණීය ජීවිතය අමරණීය වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග ඒකාබද්ධ වීමෙනි.

**ක්‍රියාකාරකම්**

1. සදාතන ජීවනය කරා යොමු වීමට අවශ්‍ය කාරණා විස්තර කරන්න.
2. ඔබට ඇති විවිධ බලාපොරොත්තු ලැයිස්තු ගත කරමින්, ඒවා කිතුනු බලාපොරොත්තුවලට කෙතරම් අනුකූලදැයි සාකච්ඡා කරන්න.

# 10 මුල් කිතුනු සභාවෙන් ආදර්ශයක්

**මුල් කිතුනු සභාවේ ආරම්භය, මෙහෙවර හා ආදර්ශය පිළිබඳව විමසා බලමින් කිතුනු ජීවිතයේ වර්ධනය සඳහා ඉන් ලැබෙන මග පෙන්වීම් යොදාගත හැකි අයුරු අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ක්‍රියා 2: 1-3, 2: 37-47, 4: 32-37, 5: 12-16, 6: 1-7**

'**සභාව**' යන්න පිරිසක් රැස්වන ස්ථානයක් හැඳින්වීම සඳහා ව්‍යවහාර කෙරේ. කුඩා පිරිසක් හෝ විශාල පිරිසක් එක් රැස්වන කළ ඔවුන් සභාවක් ලෙස හැඳින්වේ.

කිතුනු සභාව කිතුනුවන්ටම ආවේණික වූවකි. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් උන්වහන්සේ ලොවට ප්‍රකාශ කරමින් එකතුවන සැමදෙනා තුළින් කිතුනු සභාව ගොඩනැගී තිබේ.

කිතුනු සභාව තුළ විවිධ නිකාය පැවතිය ද සැවොම එක ම ස්වාමින් වහන්සේ තුළ පෝෂණය ලබති.

දෙවියන් වහන්සේ විසින් නියම කරන ලද මතු දිනයකදී දේව රාජ්‍යය පරිපූර්ණත්වයට පත්වේ. ඒ දවස උදාවන තුරු නව දේව ජනතාව වශයෙන් පෙනී සිටිනුයේ ශුද්ධ සභාව යි.

## මුල් කිතුනු සභාවේ ආරම්භය

අවස්ථාව: ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් (කිතුනු පාස්කුවෙන්) දින පනහකට පසුව පැවති පෙන්තකොස්ත මංගල්‍යය ජුදෙව් කෘෂිකාර්මික මංගල්‍යයකි.

විශේෂත්වය → ජුදෙව්වරුන් සිය අස්වැන්නේ ප්‍රථම ඵල පිදීමට ජෙරුසලමට පැමිණීම

රැස්වූ ස්ථානය → ජෙරුසලමේ උඩුමහල - යාච්ඤාවෙන් එකතු වූ ශ්‍රාවකයන් ඇතුළු සැම


විශේෂ සිදුවීම → ශුද්ධාත්ම දානය

විශේෂ ලක්ෂණ →
- සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් අහසින් නික්මීම (ශුද්ධාත්ම බලය ප්‍රකාශ වීම)
- ගිනි දලු වැනි දිව් බෙදී ගොස් එකිනෙකා මත පිහිටීම (ශුද්ධාත්ම බලය දැනීම)
- සැවොම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව අන්‍ය භාෂාවලින් කතා කිරීම (ශුද්ධාත්ම බලය තුළ ජ්වලිතකම)

ප්‍රතිඵල → පෙන්තකොස්ත දින 3000ක් පමණ සෙනග බව්තීස්මය ලබා සභාවට එකතු වීම.

මුල් කිතුනු සභාවේ ආරම්භයේදී සිදුවූ ශුද්ධාත්මදානයට අදාල සිදුවීම් අධ්‍යයනය කළ අපට, ජීවිතයේ ප්‍රමුඛ ස්ථානය දෙවියන් වහන්සේට පිදීමටත්, යාච්ඤාවෙන් එකමුතු ව කල් ගත කිරීමටත් එමගින් දිරියක් ලැබේ. තවද දේව පොරොන්දුව ඉටුවන තෙක් විශ්වාසයෙන් හා අපේක්ෂාවෙන් කල් යැවීමටත්, දෙවිඳුන්ගේ වැඩ සිටීමට ජීවිතය තුළ අවකාශ සැලසීමටත් මග පෙන්වීමක් ලබා දෙයි.


එමෙන් ම ශුද්ධාත්ම බලයෙන් පූර්ණව නව ජීවනයක් අත්දැකීමට නිතැතින් අප යොමු කෙරේ.




## 1. නමස්කාරික ජීවිතයේ නියැලීම

පෙන්තකොස්ත අත්දැකීමෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ නව ජීවයක් ලද කිතුනුවෝ සිය අධ්‍යාත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට එම නව අත්දැකීම ඉවහල් කර ගත්හ. ඔවුහු,

- දිනපතා නොකඩවා එක්සිත් ව දේව මාලිගාවේ රැස්වීමෙන්,
- ගෙයින් ගෙට ගොස් රොටි කැඩීමෙන්,
- සහභාගිකම පැවැත්වීමෙන්,
- යාච්ඤාවේ නිරත ව කල්ගත කිරීමෙන්,
- ප්‍රේරිතවරුන්ගේ ඉගැන්වීමෙහි පැවතීමෙන්,
- දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමෙන්,
- දේව භයෙන් හා ගෞරවයෙන් කල් ගත කළහ.



## 2. ධර්මදූත සේවයේ යෙදීම

ශුද්ධාත්ම ආගමනය සිදු වූ පෙන්තකොස්ත දින ප්‍රථම දේශනය ඉදිරිපත් කළ පේදුරුතුමා මුල් සභාවේ ධර්මදූත මෙහෙවර දියත් කළේය.

සියල්ලෝම පසුතැවී සිත් හරවාගෙන පව් කමාව ලබන පිණිස ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම ස්නාපනය ලැබිය යුතු බවත් එවිට ඔවුන් ශුද්ධාත්ම දීමනාව ලබන බවත් ඔහු අවධාරණය කළේය. පේදුරුතුමා ඇතුළු අන් ශ්‍රාවකයන් සැම දෙනාම මුල් කිතුනු සභාවේ ධර්මදූත මෙහෙය ඉදිරියට ගෙන යමින් එය මනාව පෝෂණය කළ ආකාරය දැක ගත හැකි වේ. ඒ තුළින් ගැලවීම ලබන්නන් වූ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් සමන්විත ඇදහිලිවන්ත සභාව දිනෙන් දින වර්ධනය වූ බවට ක්‍රියා පොත සාක්ෂි දරයි.

මෙසේ වර්ධනය වෙමින් සභාව ගමන් කළ මග දෙස බලන කළ පහත අංශ දෙක තුළින් සිය සාක්ෂිය ලොවට ප්‍රකාශ කළ බව මනාව පැහැදිලි වේ.

(අ) ධර්මදාන මෙහෙවර (ආ) සුබ සාධන මෙහෙවර

### (අ) ධර්මදාන මෙහෙවර ඉටු කිරීම

ධර්මදාන මෙහෙවර ඉටු කිරීම සම්බන්ධයෙන් ක්‍රියා පොත පහත කරුණු සඳහන් කරයි.

- දේශනා කිරීම තුළින් සුභාරංචි සේවය ව්‍යාප්ත කිරීම.
- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම ස්නාපනය කිරීම තුළින් පසුතැවිලි වීමේ ජීවිත ගත කිරීමට දිරිමත් කිරීම.
- බොහෝ අරුම පුදුම හා ලකුණු තුළින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාස ඇදහිල්ල වර්ධනය කරගැනීම.
- ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳව ප්‍රබල ලෙස සාක්ෂි දැරීම.
- රෝගාතුර වූවන් හා දුෂ්ටාත්මයන්ගෙන් පීඩිත වූවන් සුව කිරීම තුළින් ජනතාවට සුව සහනය සැලසීම.

### (ආ) සුබ සාධන මෙහෙවර

ශුද්ධාත්ම දානයෙන් නව ජීවනයක් අත්දුටු මුල් ඇදහිලිවතුන් සිය ජීවන රටාව හා ආකල්ප ක්‍රිස්තු කේන්ද්‍රීය ක්‍රමයට හැඩගස්වා ගත් ආකාරය අපට පැහැදිලි වේ. තමා සතු දේපළ හා වස්තුව සම්බන්ධයෙන් නව ක්‍රමයක් අනුගමනය කරමින් ඔවුහු, සුබසාධන සේවයට, නව අරුතක් එක් කළහ.

**ඇදහිලිවතුන් සියල්ලෝ එක් වී හැම දෙය ම පොදුවේ තබා ගත්හ.**
**ඔවුන් තමන්ගේ ඉඩකඩම් හා දේපළ විකුණා**
**එකිනෙකාගේ වුවමනාවේ හැටියට සියලු දෙනා අතර බෙදා ගත්හ.**
**ක්‍රියා 2: 44-45**

**මින් මතු වන වැදගත් වටිනාකම් පහත දැක්වෙන සේ ඉදිරිපත් කළ හැකි ය.**

- සුබසාධන සේවයට අනුබල ගෙන දෙන පොදු ප්‍රතිපත්තියක් හා බෙදා ගැනීමේ ප්‍රතිපත්තියක් මුල් සභාව තුළින් ක්‍රියාත්මක වීම.
- කිතුනු සමාජයට සමානාත්මතාව හා සහජීවනය යන වැදගත් වටිනාකම් එක්වීම.
- ඇදහිලිවන්ත සමූහයා එක්සත්ව, එක්සිත්ව විසීම.
- තමන් සතු දෙයින් කිසිවක් තමාගේ ම යැයි නො පැවසීම.
- තම තමන් අතර ප්‍රීතියෙනුත්, ත්‍යාගවන්ත සිතිනුත් ආහාර වැනි දෑ බෙදාගැනීම.
- සියල්ල පොදුවේ තබාගැනීම.
- තමා සතු වතුපිටි/නිවාස වැනි දේ විකුණා මුදල් ප්‍රේරිතයන්ට භාරදීම. බාර්ණබස් නම් ලත් ජෝසප්ගේ ආදර්ශය. (ක්‍රියා 4: 31--37)
- ප්‍රේරිතයන් එම මුදල් නිසි ලෙස කළමනාකරණය කරමින් එකිනෙකාගේ වුවමනාවේ ප්‍රකාරයට බෙදා දී අවශ්‍යතා පිරිමැසීම.

මුල් සභාවේ මෙම නව සුබ සාධන මෙහෙවර ඉදිරියට ගෙන යාමේ දී ඉස්මතු වූ ගැටලු සහගත තත්ත්වයන් ද දැකිය හැකි විය.

| | |
|---|---|
| ගැටලුව: | දිනපතා සහනාධාර දීමේදී ග්‍රීක් වැන්දඹුවන් නොසලකා හැරීම පිළිබඳව ඉදිරිපත් වූ පැමිණිල්ල. |
| එහි දී ගත් පියවර: | අපෝස්තුළුවරුන් විසින් අනෙකුත් ගෝල සමූහයා සමග සාකච්ඡා කිරීම |
| සාකච්ඡාව: | අපෝස්තුළුවරුන් විසින් දෙව් දහම දේශනා කිරීම අතපසු කොට සහනාධාර බෙදීමේ කටයුතුවල නිරත වීමේ තත්ත්වය මග හරවා ගත හැකි අයුරු. |
| අවසාන විසඳුම: | සහනාධාර දීමේ කටයුත්ත නිසි පරිදි ඉටුකිරීම සඳහා උපස්ථායක කණ්ඩායමක් පත් කිරීම. |
| එම තනතුරට පත්වන්නන් සඳහා සුදුසුකම්: | යහපත් යැයි පිළිගත්, ශුද්ධාත්මයෙන් හා ප්‍රඥාවෙන් පූර්ණ වීම. |
| සහනාධාර සේවයට තෝරාගත් උපස්ථායක කණ්ඩායම: | ස්තේපන්, පිලිප්, ප්‍රොකොරස්, නිකනොර්, තීමොන්, පර්මේනස් හා නිකොලොස් |
| පත්කිරීමේ ක්‍රියා පිළිවෙළ: | හත් දෙනකුගෙන් යුත් කණ්ඩායම ප්‍රේරිතයන් වෙත ඉදිරිපත් කිරීම<br>ප්‍රේරිතයන් එම කණ්ඩායම වෙනුවෙන් යාච්ඤා කිරීම.<br>ඔවුන් මත අත් තැබීම |

සුබසාධන සේවයේ ගැටලුවලට මුහුණ දී එම අභියෝග ජයගත් මුල් සභාවේ එම ක්‍රියාදාමය තුළින් මතු වූ වටිනාකම් මෙලෙස දකිමු.

- ගැටලු ඇතිවීමේ දී ඒ සඳහා විසඳුම් සෙවීමට ක්ෂණික ව ක්‍රියාත්මක වීම.
- සමානාත්මතාව උසස් කොට සැලකීම.
- ශුද්ධාත්ම බලය තුළ නිවැරදි තීරණ ගැනීම.
- සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම.
- දේව වචනය දේශනා කිරීමට මූලිකත්වය දීම.
- යාච්ඤාවෙන් දේව මග පෙන්වීම ලබා ගැනීම.
- දෙවියන් වහන්සේ ලබා දී ඇති විවිධ හැකියාවන් සභාවේ අභිවෘද්ධිය සඳහා යෙදවීම.

ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් දිරිය හා සවිය ලබා සියල්ලන්ගේ ප්‍රසාදයට පත්වෙමින් දිනපතා වර්ධනය වූ මුල් කිතුනු සභාව වත්මන් කිතුනු සභාවට හා කිතුනු සැම දෙනාටම ගෙන දෙන්නේ ප්‍රබල අභියෝගයකි. එමෙන්ම ආදර්ශයකි. සභාවේ නමස්කාරික ජීවිතය, ධර්මදූත සේවය තුළ ධර්ම දානය හා සුබ සාධනය සවිමත් කර ගැනීම වැනි වූ මුල් කිතුනු සභාවේ වටිනාකම් වත්මන් කිතුනු සභාව විසින් ද යොදා ගැනීම අත්‍යවශ්‍ය වන බව පැහැදිලිය. එසේ ම පෞද්ගලිකව කිතුනු ජීවිත සවිමත් කර ගැනීම සඳහාද ඉන් ලැබෙනුයේ මහඟු ආදර්ශයකි.

**ක්‍රියාකාරකම්**

1. මුල් කිතුනු සභාවේ වටිනාකම් අතුරෙන් ඔබ වඩාත් අගය කරන වටිනාකම් 5 ක් ලියා දක්වන්න.
2. 'මුල් කිතුනු සභාවේ නව සුබ සාධන ක්‍රමය වත්මන් කිතුනු සභාවට ආදර්ශයකි' නිදසුන් මගින් පහදන්න.
3. වත්මන් ශ්‍රී ලංකාව තුළ ධර්මදාන මෙහෙවර හා සුබසාධන මෙහෙවර ඉටු කිරීමේදී මුහුණ පෑමට සිදුවන අභියෝග හා ඒවා ජයගත හැකි අයුරු පැහැදිලි කරන්න.

# 11 ඵලදායි මෙහෙවරක්

**ශුද්ධාත්ම බලය තුළ දිරිමත් වන මුල් සභාවේ ප්‍රගමනය වෙනුවෙන් අපෝස්තුළුවරුන්ට නායකත්වය දුන් පේදුරුතුමා සිය ධර්මදූත මෙහෙවර ඉටුකළ ආකාරයත්, සේවයේ අභියෝග සඳහා මුහුණ දුන් අයුරු හා එමගින් කිතුනුවන්ට ලබා ගත හැකි මග පෙන්වීම් ද විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

ක්‍රියා 2:14-36, 3:1-10, 4:12-23, 10:1-33, 12:1-19

ජේසුස් වහන්සේගේ ශ්‍රාවක කණ්ඩායමේ සාමාජිකයකු වූ සීමොන් පේදුරු විශේෂ චරිතයකි. ජේසුස් වහන්සේ මුලින් හමු වූ අවස්ථාවේ 'සීමොන්' යනුවෙන් උන්වහන්සේ ඔහු අමතන ලදී. කිතුනු සභාව ඔහු මත ගොඩ නගන බව දන්වමින්, 'පර්වතය' යන අර්ථය ඇති කේපස් නමින් උන්වහන්සේ ඔහු හඳුන්වා දුන් සේක. වෘත්තියෙන් ධීවරයන් වූ පේදුරු හා ඔහුගේ සොහොයුරු අන්ද්‍රෑ, ශ්‍රාවකත්වය සඳහා ජේසුස් වහන්සේ දුන් කැඳවීමට නිසි ප්‍රතිචාර දක් වූ බව පැහැදිලි ය.

"බිය නොවන්න. මෙතැන් සිට ඔබ මිනිසුන් දිනනු ඇත." (ශු. ලූක් 5:10) යනුවෙන් ජේසුස් වහන්සේ කළ ප්‍රකාශයට ඔවුන් කීකරුවෙමින් උන්වහන්සේගේ සේවයට හවුල් කරුවන් හා සාක්ෂිකරුවන් විය.

ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණන් බව ප්‍රකාශ කළ ප්‍රථම ශ්‍රාවකයා සීමොන් පේදුරු ය. ඔහු ජේසුස් වහන්සේගේ මෙහෙවර තුළ විශේෂිත සිදුවීම්වල දී සාක්ෂිකරුවකු බව ශුභාරංචි සාක්ෂි දරයි.

ජේසුස් වහන්සේ නාඳුනන බව තෙවරක් ම පේදුරු ප්‍රකාශ කළේය. එහෙත් ඔහු තුළ කෙතරම් දුර්වලතා පැවතිය ද ඔහු ජේසුස් වහන්සේට බොහෝ සෙයින් ප්‍රේම කරන බව උන් වහන්සේ දැන සිටි සේක.

ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව මුල් සභාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ පේදුරුතුමා ය.

පෙන්තකොස්ත සිද්ධියෙන් පසුව සභාවේ ඇති වූ නව පිබිදීම තුළ ජේසුස් වහන්සේගේ මෙහෙවර ඉදිරියට ගෙන යෑමට පේදුරුතුමා ක්‍රියා කළ ආකාරය අපි දැන් විමසා බලමු.

### දේශනා කිරීමේ මෙහෙවර (ක්‍රියා 2:14-36)

අසරණව, බලාපොරොත්තු විරහිතව සිටි ශ්‍රාවකයන් පෙන්තකොස්ත දින ශුද්ධාත්ම බලය ලබා ප්‍රාණවත් වූ අයුරු පිළිබඳව පසුගිය පාඩම තුළින් අපි ඉගෙන ගතිමු. ශුද්ධාත්ම බලයෙන් පේදුරු තුමා කළ දේශනය කිතුනු සභාව බලගැන්වීමක් විය. එම දේශනය සැකෙවින් මෙසේ ය.

- ❇ පළමුව එතුමා නිර්භීත ලෙස සියලු බාධක මැද තම දේශනය සඳහා පසුතලය සකසයි.
- ❇ ඒ සඳහා පුරාණ ගිවිසුමේ සඳහන් අනාවැකි නිසි පරිදි හුවා දක්වමින් කරුණු ඉදිරිපත් කරයි.
- ❇ ජේසුස් වහන්සේ පිළිබඳ සිය අත්දැකීම් ඇසුරෙන් කථා කරයි.
- ❇ ක්‍රිස්තුස් වහන්සේ සම්බන්ධව දාවිත් කළ පෙර ප්‍රකාශනයක් පුරාණ ගිවිසුම ඇසුරින් සනාථ කරයි.
- ❇ අත්දැකීම් ඇසුරෙන් ලැබූ විශ්වාසයේ ස්ථාවරය ප්‍රකාශ කරයි.
- ❇ විශ්වාසයේ සත්‍යය තුළින් අභියෝගයක් ජනතාවට ලබා දෙයි.

**පේදුරුතුමාගේ ප්‍රබල දේශනය තුළින්**

දිව්‍යසිවර ඉගැන්වීම්හි සත්‍ය පසක් කර දීම,
ජේසුස් වහන්සේගේ මෙහෙවරයෙහි වටිනාකම පහදා දීම,
දේව සැලැස්මේ උතුම් බව ප්‍රකාශ කිරීම,
පසුතැවීම තුළින් විශ්වාසය තහවුරු කිරීම,

ජේසුස් වහන්සේගේ ජීවිතයට, මරණයට හා උත්ථානයට සාක්ෂිකරුවකු වෙමින් පේදුරුතුමා කළ දේශනා තුළින් මේ වන විට අධෛර්යයට පත් ව සිටි අනුගාමිකයෝ නව පණක් ලැබූහ. එතුමාගේ සේවයෙන් ආදර්ශයක් ලබමින් වත්මන් කිතුනුවන් ගැලවීම පිළිබඳ සුබ අස්න ලෝකය වෙත ගෙන යෑමේ මහඟු වගකීම ඉටු කිරීම සඳහා කැප වී ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ.

**සුවකිරීමේ මෙහෙවර - ක්‍රියා 3:1-10**

සුදර්ශන දොරටුව අසල සිටි උපන්දා පටන් කොර ව සිටි මිනිසකු සුව කිරීම ක්‍රියා පොතට අනුව අපෝස්තුළුවරුන් විසින් සිදු කරනු ලැබූ ප්‍රථම සුව කිරීම යි. මෙය සිදු කරන ලද්දේ පේදුරුතුමා හා ජොහාන්තුමා විසිනි. සුදර්ශන දොරටුව නම් ජෙරුසලම් දේව මාලිගාවට පිවිසෙන එක් දොරටුවකි.

එහි රැඳී සිටි උපතින්ම කොර වූ මිනිසකු සිඟමන් ඉල්ලමින් යමක් බලාපොරොත්තු වෙයි.

පේදුරුතුමා සහ ජොහාන්තුමා "රන්වත් රිදීවත් මට නැත. එහෙත් මට ඇති දේ ඔබට දෙමි. නමුත් නාසරීය ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ඇවිදින්න" යයි ඔහුට පවසයි.

එකවර ම ඔහු ඇවිදින්ට පටන් ගනියි.

ශුද්ධාත්ම බලය ලැබූ පේදුරුතුමා ජේසුස් වහන්සේගේ නාමයෙන් සුව කිරීමේ සේවයේ නියැලීම තුළින් එලදායී මෙහෙවරක් කළ බව මෙම සිදුවීම තුළින් අවබෝධ වේ. මෙම සුවකිරීමේ මෙහෙවර තුළ අපට පහත සඳහන් කාරණා ආදර්ශයට ගත හැකිය. ඒවා නම්

පේදුරුතුමා දුර්වල මිනිසා කෙරෙහි සංවේදී වෙමින් තම ශක්තියෙන් පමණක් ඔහුට උදව් කළ නොහැකි බව පෙන්වයි. එහෙත් ජේසුස් වහන්සේගේ අධිකාරීත්වය තුළින් මුදලට ලබා ගත නොහැකි සුවයක් ලබා දිය හැකි බව පවසයි.

සහනය ලද තැනැත්තා දේව බලය විස්මිත බව අවබෝධ කර ගැනීම තුළ දෙවියන් වහන්සේට ප්‍රශංසා කරයි. බාධක මැද ජේසුස් වහන්සේගේ නාමයෙන් නිර්භීත ලෙස සේවය කරීමට යොමු වෙයි. මෙහි දී දෙවියන් වහන්සේ වෙතින් ලැබෙන සුවය ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික යන සියලු අංගවලින් පරිපූර්ණ වන බව සනාථ වෙයි.

### අභියෝග ඉදිරියේ නිර්භීත සේවය (ක්‍රියා 4: 12-23, 12: 1-19)

පේදුරුතුමා හා ජොහාන්තුමා මන්ත්‍රණ සභාව ඉදිරියට ගෙනයනු ලැබූ කල ජේසුස් වහන්සේගේ නාමයෙන් ප්‍රාතිහාර්ය නොකිරීමටත් දේශනා නොකිරීමටත් අණ ලැබී ය.

එහෙත් පේදුරුතුමා හා ජොහාන්තුමා අභියෝග ඉදිරියේ නොසැලී නිර්භීතව තම අදහස් ඉදිරිපත් කළ අයුරු තේරුම් ගනිමු.

**කියවා බලමු.**

**ක්‍රියා 4:19-20**

සාමාන්‍ය මිනිසුන් වශයෙන් සිටි ඔවුන්ට සැවොම මවිත කරන අභියෝගාත්මක සේවාවක් ඉටු කිරීමට හැකි වූයේ කෙසේ ද ?

**ශුද්ධාත්ම බලය තුළ බලවත් වීමෙන් හා ශුද්ධාත්ම දිරිය හා සවිය ලැබීමෙනි.**

ඒ අනුව, අවස්ථාවට උචිත වදන් කතා කිරීමටත්, අවස්ථාවට උචිත ලෙස ක්‍රියා කිරිමටත් ශුද්ධාත්මයාණන් වහන්සේ මග පෙන්වන බව පැහැදිලි වේ.

### පේදුරුතුමා මුහුණ දුන් අභියෝග.

ජුදෙව්වරුන්ගේ ප්‍රසාදය ලබා ගැනීම සඳහා ක්‍රියා කළ හෙරොද් රජ පේදුරු අල්ලා සිරගත කොට ඔහු දැඩි මුරකාවල් මැද තැබී ය.

සිරගෙයි දී දැඩි මුරකාවල් මැද ඔහු නිදා සිටියදී දේව දූතයෙක් පැමිණ ඔහු අවදි කරවී ය. ඔහු මුදවාගෙන නගරයේ වීථියට ආ විට, දේව දූතයා නොපෙනී ගියේ ය.

අභියෝග ඉදිරියේ පේදුරු ලැබූ ප්‍රාතිහාර්යාත්මක ගැලවීම විස්මයජනක ය. සභාවේ යාච්ඤා පේදුරුතුමා වෙනුවෙන් එසවිණ. අපිත් අභියෝග හමුවේ ශුද්ධාත්ම බලය ලැබ පසුබට නොවී, ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් නිර්භීත ලෙස සේවය කරමු.

### තරාතිරම් නොබලා එළදායී මෙහෙවරක් (ක්‍රියා 10:1-33)
### රෝම ශතාධිපති කොරනේලියස්ගේ පසුබිම

මොහු රෝම හමුදාව ගොඩනැංවීමට ක්‍රියා කළ කෙනෙකු ලෙස ප්‍රසිද්ධ ය. පලස්තීන කායිසාරියේ ස්ථානගත ව සිටි රෝම සොල්දාදුවන් 100 දෙනකුට අණ දෙන නිලධාරියා ලෙස ක්‍රියා කරන ලදී.

කොරනේලියස්, නොකඩවා දෙවියන්වහන්සේට යාච්ඤා කළේ ය. එසේම සෙනගට බොහෝ සේ දන් දුන්නේ ය. සිය නිවසේ වැසියන් සමග දේව නමස්කාරයේ යෙදුණේය. ඔහු ජුදෙව් නොවූ විජාතික කෙනෙකි. ත්‍යාගශීලී තැනැත්තෙකි, ගෞරවාන්විත පුද්ගලයෙකි, දේව ප්‍රසාදය ලැබූ කෙනෙකි.

ජොප්පාවෙහි සම් පදම්කරුවකු වූ සීමොන්ගේ නිවසේ නවාතැන් ගෙන සිටි පේදුරුතුමා දුටු දර්ශනයට පසු පේදුරු කොරනේලියස්ගේ ගෙදරට පිටත්ව ගියේ ය.

කියවා බලමු.

## ක්‍රියා 10: 11-17

**මෙම දර්ශනය තුළින් දෙවියන්වහන්සේ පේදුරුතුමාට ඉගැන්වූයේ කුමක් ද?**

- ❊ දේව හඬට ප්‍රතිචාර දැක්විය යුතු බව.
- ❊ මිනිස් නීතියට වඩා දෙවියන් වහන්සේගේ නීතියට ප්‍රමුඛස්ථානය දිය යුතු බව.
- ❊ කිසිවෙකුගේ තරාතිරම් නොබැලිය යුතු බව.
- ❊ දෙවියන් වහන්සේට නිරතුරුව ම කීකරු විය යුතු බව.
- ❊ සේවය අවශ්‍ය සැමට ම ඕනෑම විටක සේවය කිරීමට ඉදිරිපත් විය යුතු බව.

ජුදෙව්වෝ පෙන්තකොස්ත දින ශුද්ධාත්ම බලය හා ක්‍රියාකාරිත්වය අත්දුටහ. නව ගිවිසුමේ සඳහන් වන පරිදි ප්‍රථම වතාවට විජාතීන් ශුද්ධාත්ම බලය අත්දුටු පළමු සිදුවීම ලෙස මෙය දැක්විය හැකි ය. එම නිසා පේදුරුතුමා විසින් කොරනේලියස්ට හා ඔහුගේ පවුලේ අය වෙත සුබසුන ගෙන දී ශුද්ධාත්මය ලැබෙන ලෙස ඔවුන් පිට අත් තැබීම විශේෂ සිදුවීමකි. එය තුළින් සියළු ජාතීන් හට දෙවියන් වහන්සේගේ සාධාරණත්වය හෙළිදරව් වේ.

ඵලදායී කිතුනු මෙහෙවරක් සඳහා ශුද්ධාත්ම බලයෙන් යුතුව නිර්භීතව, අභියෝග ජය ගනිමින්, තරාතිරම් නොබලන සේවයක යෙදීම කිතුනුවාගෙන් අපේක්ෂා කෙරේ. ඒ සඳහා පේදුරුතුමාගේ ආදර්ශය ඉතා වැදගත් වේ.

**ක්‍රියාකාරකම්**

1. පේදුරුතුමාගේ ජීවිතයෙන් චරිතායනය කළ හැකි ගුණාංග පෙළගස්වන්න.

2. "අර්ථවත් මෙහෙවරක් සඳහා පේදුරුතුමාගෙන් ආදර්ශයක්" යන මාතෘකාව යටතේ කිතුනු පුවත් පතකට ලිපියක් රචනා කරන්න.

# 12 ජීවිත වෙනසක්

**කිතුනු සභාවට අද්විතීය මෙහෙවරක් ඉටු කළ පාවුලුතුමා විජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස හඳුන්වනු ලබයි. එතුමාගේ ජීවිත පසුබිම හා ජීවිත වෙනස්වීම අධ්‍යයනය කිරීම මගින් ක්‍රිස්තුස් වහන්සේ තුළ සැබෑ ජීවිත වෙනසක් ඇති කර ගැනීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ක්‍රියා 7: 57-60, 8: 1-3, 9 පරිච්ඡේදය, 22: 3-5, 27-28 23: 6**

කිතුනු සභාව නංවාලීමට හා බොහෝ ජනතාවක් ක්‍රිස්තුස් වහන්සේ වෙත ගෙන ඒමට ශු. පාවුලුතුමා කරන ලද මෙහෙවර අතිවිශිෂ්ට වේ. අපෝස්තුළුවරුන් දොළොස් දෙනාගෙන් කෙනකු නොවුව ද, පාවුල් තුමා විජාතීන්ගේ අපෝස්තුළුවරයා බව සැම දෙනාගේ ම පිළිගැනීමයි. නව ගිවිසුමේ ග්‍රන්ථ 27 අතුරින් 13 ක් ම රචනා කිරීමෙන් හා සභාවන් ස්ථාපිත කිරීමෙන් කිතු සසුනේ ඉදිරි ගමන සඳහා පාවුලුතුමා විසින් ඉටු කරනු ලැබූ අද්විතීය මෙහෙවර සඳහා මඟ පෑදුණු අයුරු විමසා බලමු.

## සාවුල් හෙවත් පාවුලු

පාවුලුතුමාට 'සාවුල්' යන හෙබ්‍රෙව් නාමය ද පාවුලස් යන රෝම නාමය හා පාවුලු යන ග්‍රීක් නාමය ද භාවිත වූ බව පෙනේ. ක්‍රියා පොතේ පේදුරුට පසුව වැඩි අවධානයක් යොමු කර ඇත්තේ පාවුල්ගේ සේවයට යි. කිතුනු සභාවට මොහු හඳුන්වා දීමේදී ක්‍රියා පොතේ කතුවරයා වන ලූක්තුමා ඔහුගේ රෝම නාමය භාවිත කරන බව පෙනේ.

### සිලිසියාවේ තාර්සස්හී සාවුල්ගේ පසුබිම

සාවුල් සිලිසියාවේ ප්‍රධාන නගරයක් වූ තාර්සස් නුවර උපත ලැබූ බව පිළිගැනේ. තාර්සස් නගරය මධ්‍යධරණී වෙරළබඩ පිහිටි විශාලතම වාණිජ මධ්‍යස්ථානයක් මෙන් ම ධනවත් නගරයක් ද විය. එය විශ්ව විද්‍යාලවලින් සමන්විත වූ විවිධ ජන කොටස් ගැවසුණු අධික ජනගහනයකින් යුත් නගරයක් විය. එහි විවිධ භාෂා කිහිපයක් භාවිත වූ අතර රෝම අධිරාජ්‍යය පුරා විසිරී සිටි අධ්‍යාපන විශාරදයන් සහ දර්ශනවාදීන් බහුල නගරයක් බවට ද ප්‍රසිද්ධ ය.

මෙම පසුබිම නිසා, පාවුලුතුමාට විවිධ ජාතීන් ආශ්‍රය කිරීමට හැකි වූ අතර, ඔවුන්ගේ සාහිත්‍ය කෘතීන් පිළිබඳවත්, සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස පිළිබඳවත් ග්‍රීක භාෂාව පිළිබඳවත් හසල දැනීමක් ඇති කර ගැනීමට අවස්ථාව ලැබිණි. මෙයින් ලැබූ ආභාසය හේතුකොට ගෙන සාවුල්ගේ දැනුම හා අධ්‍යාපනය වර්ධනය වූ අතර දර්ශනවාදීන්ගේ ඇසුර තුළින් ද ස්තෝයික පඬිවරුන් හමුවීමෙන්ද එය ශක්තිමත් වූවා යැයි සිතිය හැකි ය.

## ජුදෙව් පසුබිම

පාවුලු තුමා භක්තිමත් ජුදෙව්වෙකු විය. බෙන්ජමින්ගේ ගෝත්‍රයට අයත් විය. ජුදෙව්වන් භාවිත කළ හෙබ්‍රෙව් බස හොඳින් දන සිටියේ ය. ජුදා සිරිත් විරිත්වලට දැඩි ඇල්මක් දක්වූවෙකි. ජුදෙව් පිරිමි දරුවකු ලෙස සිනගෝග අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව සැන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකයකු වූ ගමාලියෙල් නම් කීර්තිමත් ජුදෙව් ගුරුවරයා යටතේ උසස් අධ්‍යාපනය ලැබී ය. ග්‍රීක් දර්ශනවාදය, සාහිත්‍ය හා ආචාර ධර්ම ඉගෙනීමට යොමු විය. කුඩා කල සිට හස්ත කර්මාන්තය ලෙස කූඩාරම් කර්මාන්තය දැන සිටියේ ය.

## පරිසිවරයකු ලෙස ආගමික පසුබිම

පරිසිවරු නම් ආගමික කණ්ඩායම අන් සමාජ කණ්ඩායම් වෙතින් වෙන් වූ උසස් ආගමික කණ්ඩායම ලෙස තමන් ම හඳුන්වා ගත් පිරිසක් වූහ. පරිසි යන්නෙහි අර්ථය ‘වෙන් වූ’යන්නයි. පරිසිවරු ජුදා ආගමික නීතිය ජනයාට පිළිගැන්වූහ.

පාවුලුතුමා පරිසි පවුලක උපත ලැබීය. ජුදෙව් ආගමික වත් පිළිවෙත් සහ  නීති රීති හැදෑරීමට යොමු විය. පසු කාලයේ දී පවා කෙන්ක්‍රෙයාවේ දී හිස මුඩු කිරීම (ක්‍රියා 18:18) තිමෝතියස් චර්මඡේදනය කිරීම (ක්‍රියා 16:2) වැනි සිදුවීම් මගින් මෙය වඩාත් පැහැදිලි වේ.

පරිසිවරයකු ලෙස ජුදා ආගමේ පදනම වූ පංච පුස්තකය (ටෝරාව) මනාව හැදෑරීමට එතුමාට හැකි විය.

හෙතෙම ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය වූ සැන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කරන ලදී.(ක්‍රියා 26:10)

පසුකාලීනව ජුදෙව්වන් වෙත සුබ අස්න ගෙන යාමේදී අදහස් හා උදහස් බෙදා ගැනීමටත්, තර්ක විතර්ක කිරීමටත් ඔහුට හැකි විය. එමෙන් ම ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියට යාමට සිදු වූ අවස්ථාවල දී පරිසිවරයකු වීම හරහා වාසිදායක තත්ත්වයක් උදා කර ගැනීමට ද  ඒ නිසා හැකියාව ලැබුණි. (ක්‍රියා 23: 6--9)

## රෝම පුරවැසියකු වීමේ පසුබිම

පාවුලුතුමා උපතින් රෝම පුරවැසිභාවයට හිමිකම් ලද්දෙකි. (ක්‍රියා 22: 27--28) කීර්තිමත් ජුදෙව් පවුලකට අයත් වූ එතුමා සිය පියාණන් ආභාසයෙන් මෙම වරප්‍රසාදයට හිමිකම් කීවේ ය. රෝම රජය තාර්සසහි හැම ධනවත් පවුලක් සඳහා ම රෝම පුරවැසිභාවය ලබා නොදුන්නේය. සාමාන්‍යයෙන්, කීර්තිමත් පවුලක සිවු පරම්පරා දක්වා පුරවැසිභාවය ලබා දෙන ලදී. පාවුලුතුමාගේ පියාගේ පියා වෙතින් රෝම පුරවැසිභාව වරප්‍රසාද මෙතුමාට හිමි වූ බව පැහැදිලි ය. රෝම පුරවැසිභාවය හිමි වූ ජුදෙව් පුද්ගලයකුට පොදුවේ නම් 2 ක් භාවිත විය. එනම් සිය හෙබ්‍රෙව් නාමය හා රෝම නාමයයි. හෙබ්‍රෙව් නාමය මගින් සිය පසුබිම හා උරුමය හෙළි කෙරුණු අතර රෝම නාමය තුළින් රෝම වරප්‍රසාද හෙළිදරව් කෙරිණි. තාර්සස් වැසියකු ලෙස පාවුලුතුමාට පසුකාලීනව රෝම පුරවැසිභාවයේ වරප්‍රසාදය කෙතරම් සිය මෙහෙවර තුළ දී උපකාරී වූයේ දැයි ක්‍රියා පොත හෙළි කරයි. (ක්‍රියා 22: 25--28) රෝම පුරවැසිභාවය හිමි අයකුට ලැබෙන නීති හා සමාජ වරප්‍රසාද භාවිත කරන්නට සේවයේ දී ඔහුට අවස්ථාව සැලසුණේ ය.

# කිතුනුවන්ට පීඩා කිරීම

ජුදෙව්වන් අතර, ක්‍රිස්තුන් වහන්සේ අදහන ලද විශාල පිරිසක් දිනෙන් දින පලස්තීනය සහ අවට ප්‍රදේශවල විසිරී ගිය අතර මෙය ජුදා ආගමට දැඩි බලපෑමක් වූ බව පෙනෙන්නට තිබුණි. දැඩි ජුදෙව් භක්තිකයකු වූ පරිසිවර සාවුල් කිතුනුවන් මර්දනය කිරීමට පටන් ගත්තේ මෙම පරිසරය තුළ ය.

පීඩාව මර්දනය හා මරණය ඉදිරියේ ක්‍රිස්තු අනුගාමිකයෝ, කිසිසේත් ම තම විශ්වාසය අත්හැරීමට සූදානම් නොවූහ. මෙය සාවුල් නමැති පරිසිවරයාගේ දැඩි උදහසට ලක් විය. එනමුත් ක්‍රිස්තු අනුගාමිකයන් වර්ධනය වීමේ අඩුවක් නොවී ය. ඔවුන්ට මුලින් ම "**ක්‍රිස්තියානි**" යන නාමය ලැබුණේ සිරියාවේ අන්තියෝකියේ දී ය. (ක්‍රියා 11: 20) එදා තිබූ එම පීඩා කිරීමේ දරුණු තත්ත්වය තුළ හෙළිවන සාවුල්ගේ ක්‍රියා කලාපය පහත සිද්ධීන් තුළින් මනාව පැහැදිලි වෙයි.

| | |
|---|---|
| ස්තේපන්ට ගල් ගසන අවස්ථාවේ දී එයට සාක්ෂිකරුවකු වෙමින් → | ගල් ගසන්නන්ගේ ඇඳුම් සාවුල් විසින් රැක බලා ගන්නා ලදී. (ක්‍රියා 7: 57--- |
| ස්තේපන් මරා දැමීම පිළිබඳව → | සාවුල් සතුට පළ කරන ලදී. (ක්‍රියා 8:1) |
| ස්තේපන්ගේ මරණය පිළිබඳව සැදැහැවතුන් දුක් වී වැළපෙන අවස්ථාවේ දී → | සාවුල් ගෙයින් ගෙට ගොස් ස්ත්‍රීන් හා පුරුෂයන් අල්ලා සිර භාරයට ගනිමින් සභාව විනාශ කරන්නට වෙර දැරී ය. (ක්‍රියා 8:2--3) |
| ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් වෙත ගොස් → | සාවුල් ඔවුන්ට මරණ තර්ජන එල්ල කළේ ය. (ක්‍රියා 9:1) |
| කිතුනු ස්ත්‍රීන් හා පුරුෂයන් අල්ලා ජෙරුසලමට ගෙන එන පිණිස දමස්කයේ ධර්මශාලාවට ඉදිරිපත් කිරීම සඳහා → | සාවුල් උත්තම පූජකයාගෙන් බලපත්‍ර ලබා ගන්නා ලදී. (ක්‍රියා 9:2) |

**කියවා බලමු.**

**ක්‍රියා 22:4-5**

ජුදා ආගම සුරැකීමට ක්‍රියා කරමින් සිටි සාවුල් විස්මයජනක අත්දැකීමක් හරහා ජීවිත පරිවර්තනයට යොමු විය. ඒ සඳහා පහත සඳහන් කරුණු බලපෑ බව පෙනේ.

1) පීඩා මැද කිතුනුවන් තුළ තිබූ ස්ථිර ඇදහිල්ල

2) කිතුනු සභාවේ ප්‍රථම වේද සාක්ෂිකයා වූ ස්තේපන්තුමා මරණයට නිර්භීතව මුහුණ දෙමින් දුන් ජීවිත ආදර්ශය ද ඔහුගේ ජීවිත පරිවර්තනයට බල පෑ බව සිතිය හැකි ය.

"ජේසුස් ස්වාමීන් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනව."

"සමිඳාණන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නො තැබුව මැනව".(ක්‍රියා 7:59--60)

## සාවුල්ගේ ජීවිත පරිවර්තනය

කියවා බලමු.

**ක්‍රියා 9 පරිච්ඡේදය**

**සාවුල් දමස්කය වෙත ගමන් කරයි.**

| | | |
|---|---|---|
| අරමුණ | ➡ | දමස්කයේ කිතුනුවන් අත් අඩංගුවට ගැනීම. |
| විස්මයජනක අත්දැකීම | ➡ | හදිසියෙන් අහසින් ආලෝකයක් ඔහු අවට බැබළීම භ්‍රාන්ත වී බිම වැටීම. හඬක් ඇසීම. 'සාවුල්, සාවුල්, ඔබ මට පීඩා කරන්නේ මන්ද?' (ක්‍රියා 9:4) |
| සාවුල්ගේ ප්‍රතිචාරය | ➡ | 'ස්වාමීනී ඔබ කවරෙක් ද?' (ක්‍රියා 9:5) |
| ඔහු ඇමතූ හඬ | ➡ | 'මම ඔබ විසින් පීඩා කරනු ලබන ජේසුස් ය (ක්‍රියා 9:5) |
| උපදෙස් | ➡ | 'නැගිට නුවරට ඇතුළු වන්න. ඔබ කළ යුතු දේ ඔබට කියනු ලබන්නේ ය'. (ක්‍රියා 9:6) |
| ඔහුගේ දින 3ක අත්දැකීම් | ➡ | ඇස් නොපෙනී සිටීම. නොකා නොබී සිටීම. (ක්‍රියා 9:9) |

**සාවුල් වෙත ගොස් ඔහුට අත් තබන ලෙස අනනියස් ලද දර්ශනය.**

එම දර්ශනයේදී සාවුල්ගේ මෙහෙවර ගැන අනානියස් හැඳින්වූයේ "මාගේ නාමය විජාතීන් ද, රජුන් ද ඉශ්රායෙල් පුත්‍රයන් ද වෙත ගෙන යෑමට මා විසින් තෝරා ගත් භාජනයකි." "ඔහු මාගේ නාමය නිසා කොපමණ දුක් විඳින්නට ඕනෑද කියා"ය. තව ද අනනියස්ගේ අත් තැබීමෙන් පසු සාවුල් පෙනීම ලබා ශුද්ධාත්මයෙන් පූර්ණ වී.

## සිත් හැරීමෙන් පසුව සාවුල්ගේ මෙහෙවර (ක්‍රියා 9: 20-31)

- දමස්කයේ ශ්‍රාවකයන් සමග නතරව සිටීම.
- ජේසුස් වහන්සේ ගැන ධර්ම ශාලාවලදී දේශනා කිරීම.
- ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බව ප්‍රකාශ කිරීම.
- දමස්කයේ ජුදෙව්වන්ගේ විරෝධය මැද නිර්භීත ව කටයුතු කිරීම.
- සාවුල්ට මරණ තර්ජන පැමිණීම.
- ඔහු ළඟ සිටි අය රාත්‍රියේ ඔහු කූඩයක බහා පවුරෙහි විවරයකින් පහළට බස්වා ආරක්ෂා කිරීම.

❋ සාවුල් ජෙරුසලමට පැමිණීම.
❋ ශ්‍රාවකයෝ ඔහු විශ්වාස නො කිරීම.
❋ බාර්ණබස් ප්‍රේරිතයන්ට ඔහු හඳුන්වා දීම.
❋ ග්‍රීක බස කතා කළ ජුදෙව්වන් සමග වාද කිරිම.
❋ මරණ තර්ජන නිසා කායිසාරියට සහ තාර්සස්වලට පිටත් ව යෑම.

මේ සියල්ලට ම මුහුණ දෙමින් සාවුල් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ ව සභාව වේගවත් ලෙස වර්ධනය කිරීමට දායක විය.

**පාවුලුතුමාගේ හිත් හැරීමේ අත්දැකීම තුළ, අපට ලැබෙන ආදර්ශය.**

❋ විවිධ තත්ත්වයන් තුළදී, දෙවියන් වහන්සේ වෙනුවෙන් ක්‍රියා කිරීමට අප තෝරා ගන්නා බව.

❋ කිනම් තත්ත්වයකදී හෝ අවස්ථාවක දී වුව ද අප කැඳවීමේ හඬට කීකරු විය යුතු බව.

❋ අපගේ පෞද්ගලික තීරණවලට වඩා දෙවියන් වහන්සේගේ තීරණ ක්‍රියාත්මක වන බව.

❋ අපගේ දැනුම ගැන ආඩම්බර නොවී, එය දෙවියන් වහන්සේට මෙහෙයවීමට ඉඩ හැරිම.

❋ ක්‍රිස්තුන් වහන්සේ තෝරා දෙන මාර්ගය පහසු නොවන අතර, දුක් ගැහැට වලට ධෛර්යයෙන් යුතුව මුහුණ දීම.

❋ දේව කැමැත්ත ඉටු කිරිමේ දී මුහුණ දෙන අසීරුතාවන්හි දී, ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලයෙන් ශක්තිය ලැබීම.

❋ සැම විටම තමන් කැමති මාවතම තෝරා ගැනීම දේව කැමැත්ත ලෙස සැලකිය නො හැකි බව.

❋ යාච්ඤාව තුළින් ජීවිතයට මුහුණ දීමේ වැදගත්කම.

❋ ජේසුස් වහන්සේ විවිධ සමාජ පසුබිම් තුළ පෞද්ගලිකව මුණ ගැසීමෙන්, ජීවිත නවෝදයක් සිදු වන බව.

එම ජීවිත පසුබිම තුළ ජේසුස් වහන්සේ හඳුනා ගනිමු. උන්වහන්සේට අප තුළ ක්‍රියා කිරීමට ඉඩ දෙමු. උන්වහන්සේ සමග නොබිඳෙන සබඳතාවකට ඇතුළත් වෙමු. සැබෑ ජීවිත නවෝදයක් අත් දකිමු.

**ක්‍රියාකාරකම්**

1) පාවුලුතුමාගේ හැරීම එදා කිතුනු සභාවට බලපෑ අන්දම සැකෙවින් දක්වන්න.

2) 'ක්‍රිස්තුන් වහන්සේ තුළ සැබෑ ජීවිත වෙනසක්' යන මැයෙන් පාවුලු තුමාගේ ජීවිතය ඇසුරින් කථාවක් සූදානම් කරන්න.

# 13 හවුල් නායකත්වයෙන් ජය

පාවුලු හා බාර්ණබස් පළමු ධර්මදූත චාරිකාව තුළ හවුල් නායකත්වයෙන් ක්‍රියා කළ අයුරු අධ්‍යයන කරමින් හවුල් නායකත්වයේ යහපත් ප්‍රතිඵල ජීවිතය තුළ අත්දැකීම සඳහා යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

ක්‍රියා 11:26, 12:25, 13 හා 14 පරිච්ඡේදය 15:1-35

ශුද්ධාත්මයාණන්ගෙන් හා ඇදහිල්ලෙන් පූර්ණ ශ්‍රාවකයකු වූ බාර්ණබස් විසින් සාවුල් ජෙරුසලමේ අන් ශ්‍රාවකයන්ට හඳුන්වා දෙන ලදී. බාර්ණබස් සිරියාවේ අන්තියෝකියට පැමිණි කල දිනෙන් දින වැඩි වර්ධනය වන සභාව පෝෂණය කිරීමේ අවශ්‍යතාව ඔහුට දැනුණෙන් ඔහු තාර්සස් නුවර සිටි සාවුල් සිරියාවේ අන්තියෝකියට ගෙන්වා ගන්නා ලදී. (ක්‍රියා 11:26) ඔවුන් දෙදෙනා එක්ව වසරක පමණ කාලයක් මුළුල්ලේ අන්තියෝකියේ සභාව සංවිධානය කරමින්, ඔවුන්ට උගන්වමින් දේව වචනයෙන් එම සෙනඟ පෝෂණය කරන ලදී.

## සිරියාවේ අන්තියෝකියේ කිතුනු සභාව


මෙම සභාව විජාතික කිතුනුවන් මූලික ව සිටි සභාවකි. එහි දිවැසිවරුන් හා ගුරුවරු සේවය කළහ. ඔවුහු නම් බාර්ණබස්, නීගර් නම් සිමියොන්, සිරේනියේ ලූසියස්, මානායින් හා සාවුල් ය. පළමුවරට "ක්‍රිස්තියානි" යන නාමය ශ්‍රාවකයන්ට දෙනු ලැබුවේ ලැබුවේ මෙම අන්තියෝකිය සභාවේ දී ය. අගබස් නම් දිවැසිවරයකු ලොව පුරා ඇතිවන සාගතයක් පිළිබඳ අනාවැකියක් ඉදිරිපත් කරන ලදී. එම සාගතය ක්ලෞදියස් රජු දවස ඇති වූ විට සිරියාවේ අන්තියෝකියේ සභාවේ සාමාජිකයන් සිය වත්කමේ ප්‍රකාරයට සාවුල් හා බාර්ණබස් අත ජුදයේ සභාවේ සහෝදරයන්ට ආධාර යැවූ බව දක්වේ. තවද මෙම සභාව උපවාසයේ යෙදී යාච්ඤා කිරීමෙන් ශුද්ධාත්ම මඟපෙන්වීම තුළින් සාවුල් හා බාර්ණබස් මත අත් තබා, පළමු ධර්මදූත ගමන ඇරඹීමට ශක්තිය ලබා දුනි.

## හවුල් නායකත්වයෙන් පළමු ධර්මදූත ගමන

කියවා බලමු.

**ක්‍රියා 13,14 පරිච්ඡේද**

- ❊ හවුල් නායකත්වයට කැඳවූවෝ - සාවුල් හෙවත් පාවුලු, බාර්ණබස් හා ජොහාන් නම් ලත් මාර්ක් (සහායක)
- ❊ සිරියාවේ අන්තියෝකියෙන් ඇරඹුම. (ක්‍රියා 13:1--3)
- ❊ සිලූකියෙන් නැව් නැගීම (ක්‍රියා 13:4)
  සිලූකිය සිරියාවේ අන්තියෝකියේ වරාය නගරයයි.
- ❊ සයිප්‍රස් දූපත් සලමිය (ක්‍රියා 13:4--5)
  මෙය බාර්ණබස් උපන් නගරයයි. මෙහි විශාල ජුදෙව් ජනතාවක් සිටි බවට සාක්ෂි ඇත. සාවුල් හා බාර්ණබස් ජුදෙව් ධර්මශාලාවලට ගොස් දෙවියන් වහන්සේගේ


ශුද්ධ පාවුලු තුමාගේ
පළමු වන ගමන
ගලාතිය
අන්තියෝකිය
ඉකෝනිය
ලුස්ත්‍රා
පිසිදිය
පම්පිලිය
දර්බය
සිලීසිය
අන්තාලිය
පර්ගා
නාර්සස්
අන්තියෝකිය
සිලූකිය
සිරිය
මධ්‍යධරණී මුහුද
සයිප්‍රස
සලමිස්
පාපස්

වචනය ප්‍රකාශ කළහ. හවුල් නායකත්වයෙන් යුතුව දේව වචනය ප්‍රකාශ කිරීමේ වැදගත්කම එහිදී තහවුරු විය. මෙහිදී ජොහාන් මාර්ක් ඔවුන්ගේ සහකාරයා විය.

❊ පාපස් (ක්‍රියා 13:6--12)

සර්ගියස් පාවුලස් නමැති බුද්ධිමත් රෝම දේශාධිපතියා සමග හවුලේ ක්‍රියා කළ පෞද්ගලික ඉන්ද්‍රජාලිකයකු විය. මෙහිදී බාර්--ජේසුස් හෙවත් එළිමස් මැගෝස් (ග්‍රීක නම) එම පුද්ගලයා යි. එමෙන්ම ඔහු ජුදෙව් ජාතික බොරු දිවැසිවරයෙකි.සාවුල් හා බාර්ණබස්ට ඔහු මුණ ගැසේ. දේශාධිපතියා සත්‍යය කරා යොමු වීම ඔහු විසින් වැළැක්වීමට උත්සාහ දැරී ය. නායකයකු වශයෙන් සර්ගියස් පාවුලස් ගැනීමට නියමිත වූ නිවැරදි තීරණයට විරුද්ධව වැරදි මග පෙන්වීමක් මෙම ඉන්ද්‍රජාලිකයාගේ හවුල් ක්‍රියාකාරිත්වය වෙතින් ලැබිණ. ඒ සඳහා ඔහුට අම්හිරි අත්දැකීමකට මුහුණ දීමට සිදුවිය. (ක්‍රියා 13: 10--11) මෙම සිදුවීමේ දී -

සර්ගියස් පාවුලස් හා බාර්-ජේසුස් අතර තිබූ වැරදි හවුල් ක්‍රියාකාරිත්වය අපට පැහැදිලි වෙයි.

පාවුලු සහ බාර්ණබස් අතර තිබුණු යහපත් ඒකත්වයේ හවුල් නායකත්වය තුළ නිවැරදි තීරණ ගත් අයුරු පැහැදිලි ය. ක්‍රියා පොතේ සාවුල් ඔහුගේ ග්‍රීක නමින් එනම් පාවුලු ලෙස හැඳින්වීම මෙතැන් සිට ඇරඹේ.

❊ පම්පිලියේ පර්ගාය (ක්‍රියා 13:13)

හවුල් නායකයන් පම්පිලියේ පර්ගායට පැමිණි පසු ඔවුන්ගේ හවුල් සේවකයා වූ ජොහාන් මාර්ක් ඔවුන්ගෙන් සමුගැනීම දැකිය හැකි ය. හවුල් සහායකත්වයෙන් ජොහාන් මාර්ක් හැරී ගියද පසුකාලීනව ධර්මදූත සේවය සඳහා පාවුලු ඔහු වඩා ප්‍රයෝජනවත් ලෙස යොදාගත් බව පැහැදිලි වේ. (කොලොස්සි 4:10)

❊ පිසීදියේ අන්තියෝකිය (ක්‍රියා 13:14--52)

පාවුලු හා බාර්ණබස් ධර්මශාලාවේ සිටි සෙනගට එහි නායකයන්ගේ ඉල්ලීම පරිදි සබත් දවස් කිහිපයක දීම දේව වචනය දේශනා කළහ. මෙහිදී දීර්ඝ දේශනයක් පාවුලු විසින් ඉදිරිපත් කරන ලදී. ඉශ්රායෙල් ඉතිහාසයෙන් පටන් ගෙන ජේසුස් වහන්සේ කළ සේවය දක්වා එම දේශනය මගින් කරුණු ගෙන හැර දක්වන ලදී.

**කියවා බලමු.**

**ක්‍රියා 13: 16-42**

හවුල් නායකත්වය තුළ වගකීමෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව දේශනා කිරීමෙන් ඔවුන් යහපත් ප්‍රතිඵල අත්කර ගත් බව පැහැදිලි ය. ඒවා නම් :--

❖ ඊළඟ සබත් දිනවල දී ද දේශනා කිරීම සඳහා ආරාධනා ලැබීම.

❖ ජුදා ආගමට හැරුණු විජාතික භක්තිවන්තයන්ගෙන් බොහෝ දෙනකු හවුල් සේවකයන්ට එක් වීම.

❖ ඔවුන්ට අවවාදානුශාසනා කිරීමට අවකාශ ලැබීම.

❖ ඊළඟ සබත් දිනයේ නුවරවැසි සියල්ලන් ම දේව වචනය ඇසීමට එක්වීම.

එසේම පාවුලුට හා බාර්ණබස්ට විරුද්ධව පැන නැගුණු අයහපත් බලවේග හවුල් නායකත්වයේ නිර්භීත බව තුළ පරාජය කිරීමට ඔවුනට හැකි විය. සැම විට ම ශුද්ධාත්ම බලය හා ප්‍රීතිය ඔවුන් අත්දකින ලදී.

❊ ඉකෝනිය (ක්‍රියා 14:1--6)

ඉකෝනියේ ධර්මශාලාවට එනම් සිනගෝගයට යෑමට හවුල් සේවකයෝ පසුබට නො වූහ. එහිදී බොහෝ ජුදෙව් හා ග්‍රීක් සමූහ ජේසුස් වහන්සේ අදහාගත්හ. මෙහි දී ඔවුනට එරෙහිව පැන නැගුණු ජුදෙව් බාධක නිර්භීතව ජය ගනිමින් දේව වරප්‍රසාදය තුළ බොහෝ කලක් එහි නැවතී සිටියහ.

එහි දී බොහෝ අරුම පුදුම දේ හා ලකුණු දැක්වීමට ඔවුනට හැකි විය. මෙය හවුල් නායකත්වය තුළ තිබූ එකමුතු භාවය නිසා සිදු වූ යහපත් ප්‍රතිඵල බව කිව හැකි ය.

❊ ලුස්ත්‍රාව (ක්‍රියා 14:8--18)

ජුදෙව්වන්ගේ තර්ජන, ගර්ජන මැද ලුකෝනියාවේ නගරයක් වූ ලුස්ත්‍රාවට පළායමින් ඔවුන්ගේ මීළඟ ධර්මදූත සේවාව ක්‍රියාත්මක විය. උපන් දා පටන් කොරව සිටි මිනිසකුට මෙහි දී සුවය ගෙන දුනි. පාවුලුගේ කථිකත්වයේ දක්ෂතාව කැපී පෙණින.

**හවුල් නායකත්වය තුළින් සුවයේ වරප්‍රසාදය අත්දුටු සමූහයාගේ ප්‍රතිචාරයඃ**

1.“දෙවිවරු මිනිස් වෙසින් අප වෙතට බැස සිටිති.”

2. පාවුලු ප්‍රධාන කථිකයා බැවින් ඔහු හර්මිස් නම් ග්‍රීක් දෙවියකුගේ නාමයෙන් හඳුන්වන ලදී.

3. බාර්ණබස්, සියුස් නම් ග්‍රීක් දෙවියකුගේ නාමයෙන් හඳුන්වන ලදී.

4. ඔවුන්ට ගොන්නු ද මල් මාලා ද ඇතිව පුද පූජා කිරීමට සැරසුණහ.

පාවුලු හා බාර්ණබස් තමන්ගේ වස්ත්‍ර ඉරාගෙන ඔවුන්ට දැක් වූ ප්‍රතිචාරය වූයේ,

**“මනුෂ්‍යයෙනි, ඔබ මේ දේවල් කරන්නේ මන්ද? අපිත් ඔබ හා සමාන මිනිස්සු ය. ඔබ මේ නිෂ්ඵල දේ වලින් දුරු ව අහසත් පොළොවත් මුහුදත් එහි ඇති සියල්ලත් මැවූ ජීවමාන දෙවියන් වහන්සේ වෙතට හැරෙන පිණිස සුබ අස්න ඔබ වෙත ගෙනෙමු. ”**

**ක්‍රියා 14: 15**

මින් අපට පැහැදිලි වන්නේ,

1. හවුල් නායකත්වය තුළ දේව ගෞරවය දෙවියන් වහන්සේට පමණක් ලබා දීම, තමා කිසි ගෞරවයක් අත්පත් කර නොගැනීම හා නිහතමානිත්වය චර්යාවෙන් දැක්වීම.
2. වැරදි ක්‍රියාවන්ට එරෙහිව නැගී සිටීම. (ගොනුන් හා මල් මාලා සමග යාග කිරීමට සූදානම් වීමේදී)
3. ඕනෑම පීඩන තත්ත්වයක් තුළ සුබසුන දේශනා කිරීමට පසුබට නොවීම.
4. මරණීය තර්ජන ඉදිරියේ දී පවා ධෛර්යයෙන් යුතුව ක්‍රියා කළ බව තව දුරටත් සනාථ වීම. (ක්‍රියා 14: 19--20)

❊ දර්බය (ක්‍රියා 14:20--21)

හවුල් නායකත්වයෙන් සුබසුන දෙසීම මගින් බොහෝ දෙනකු ශ්‍රාවකයන් කළ හැකිවීම මෙම නගරය තුළ සේවයේ දී කැපී පෙනෙන විශේෂත්වයයි.

❊ ආපසු ගමන:

ලුස්ත්‍රාවට → ඉකෝනියට → පිසීදියේ අන්තියෝකියට → පම්පිලියේ පර්ගායට (ක්‍රියා 14: 21--24)

❊ අත්තාලියේ දී නැව් නැගීම (ක්‍රියා 14: 25)

❊ හවුල් නායකත්වයේ ගමනාන්තය : සිරියාවේ අන්තියෝකිය (ක්‍රියා 14: 26)

❊ හවුල් නායකත්වයේ වගකීම සම්පූර්ණ කිරිම. (ක්‍රියා 14: 21--28)

සිරියාවේ අන්තියෝකියට පැමිණි කල සභාව රැස්කරවා සිය ධර්මදූත සේවය පිළිබඳ ව සාක්ෂි දැරීම හා සභාව දැනුවත් කිරීම.

**ආපසු ගමනේ දී හවුල් නායකත්වය තුළ පැවති උද්යෝගී ලක්ෂණ.**

❊ දේව රාජ්‍යය උදෙසා දුක් විඳීමේ අවශ්‍යතාව පැහැදිලි කිරීම.

❊ ශ්‍රාවකයන් දිරිමත් කිරීම.

❊ ඇදහිල්ලේ ස්ථිරව පවතින්නට අනුශාසනා කිරීම.

❊ සභාවේ සැදැහැවතුන් කෙරෙහි සභා මූලිකයන් පත් කිරීම

❊ උපවාස කර යාච්ඤාවේ යෙදෙමින් සමිඳාණන් වහන්සේට සැදැහැවතුන් භාරදීම

එම නගරවලදී මුහුණ දුන් සිදුවීම්හි භයානක බව දැන දැන ම හවුල් නායකත්වය නැවත එම නගරවලට පැමිණීමත් එම සභා සංවිධානයට සහාය වීමත් වැදගත් වේ.

**ජෙරුසලම් මන්ත්‍රණ සභාව (ක්‍රියා 15:1-35)**

මෙම මන්ත්‍රණ සභාවේ දී පාවුලු හා බාර්ණබස්ගේ පළමු ධර්මදූත ගමනේ ප්‍රතිඵල සමාලෝචනය කරන ලදී. මන්ත්‍රණ සභාවේ මූලිකත්වය ජේසුස් වහන්සේගේ සහෝදරයෙකු වන ජාකොබ් දරන ලදී.

එහිදී පැණ නැගුණු ගැටලුව →

විජාතීන් චර්ම ඡේදනය කිරීම හා ඔවුන්ට මෝසෙස්ගේ ව්‍යවස්ථා පිළිපැදීමට බලකිරීම සුදුසු ද?

❊ පරිසිවරු අත්‍යවශ්‍ය බව පැවසූහ

❊ පේදුරු හා ජාකොබ් අවශ්‍ය නැත.

මුලසුනේ සිටි ජාකොබ්ගේ තීරණය →

❊ රූප සම්බන්ධ දූෂ්‍යකම් වලින් වැළකීම.

❊ කාමමිථ්‍යාචාරයෙන් වැළකීම.

❊ බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් වැළකීම.

මෙම තීරණය ප්‍රකාශයට පත් කිරීමෙන් ජුදෙව් කිතුනුවන් හා විජාතික කිතුනුවන් අතර ඇතිවූ ගැටුම්කාරී ප්‍රශ්නයක් වැළැක්වීමට පියවර ගත් බව පැහැදිලි ය. ඒ තුළින් ඔවුන් අතර යහපත් සම්බන්ධතාවන් ගොඩ නැඟීමට උත්සාහ දරන ලදී.

## ධර්මදූත ගමනේ සාර්ථකත්වයෙන් ගත හැකි ආදර්ශයන්

හවුල් නායකත්වය තුළ පාවුලු හා බාර්ණබස් අත්පත් කර ගත් යහපත් ප්‍රතිඵල හේතුවෙන් ඔවුන්ගේ ධර්මදූත ගමන සාර්ථක ව නිම කිරීමට හැකි විය. ඉන් ලබා ගත හැකි ආදර්ශ නම්,

- අභියෝග මැද දී වුව ද දෙවියන් වහන්සේ ඔබට මග පෙන්වන ආකාරයෙන් නායකත්වය ගෙන ක්‍රියා කිරීම.

- සැම විටම සාමුහික හැඟීමෙන් කටයුතු කිරීමෙන් අභියෝග ජය ගත හැකි බව.

- විවිධ මතවාද හා මත ගැටුම්වලදීත්, වැරදි අදහස් සමාජය තුළ ප්‍රචලිත වීමේදීත් දේව දරුවකු ලෙස නිර්භීත ව පාවුලුතුමා හා බාර්ණබස්තුමා මෙන් තම භාෂාව හසුරුවමින් ලිපි ලේඛන මගින්, සමාජය දැනුවත් කිරීම.

- සැම මොහොතකම පරාජය හමුවේ වුවද ශුද්ධාත්මයාණන් වහන්සේගේ සවිය ඇතිව පසුබට නොවී ඉදිරියට යෑමට සිත යොමු කිරීමෙන් යහපත් ප්‍රතිඵල අත්කර ගැනීම.

- කණ්ඩායමක් ලෙස වගකීම් දරන විට, තමන්ගේ අත්දැකීම් නැවත සමාලෝචනය කිරීමේ වගකීම දැරීමෙන් ඔබ සමග සිටින සෙසු අය දිරිමත් කිරීම.

කුමන බාධක තිබුණත් ධර්මදූත ගමන සාර්ථක වීමේ තෘප්තිය ඔවුන්ට තිබුණි. දේව මෙහෙවර සාර්ථක ලෙස නිම කරනු ලබන කාහට වුවද මෙම තෘප්තිය ලද හැකිය

**ක්‍රියාකාරකම්**

1 පාවුලුතුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවට අයත් පහත ස්ථානවල සිදුවීම් අතුරින් ඔබට ඉගෙන ගත හැකි පාඩම් දෙක බැගින් සටහන් කරන්න.

අ) පාපස් ආ) පිසීදියේ අන්තියෝකිය

ඇ) ඉකෝනිය ඈ) ලුස්ත්‍රාව

2 "හවුල් නායකත්වයෙන් ක්‍රියා කිරීමට පාවුලුතුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාවෙන් ආදර්ශයක්" යන මැයෙන් කිතුනු පුවත් පතකට ලිපියක් ලියන්න.

# 14 දිරියෙන් යුතු මෙහෙවර

**පාවුලුතුමාගේ දෙවන ධර්ම දූත ගමන තුළ සීලස් සමග නොපසුබට වීර්යයෙන් ක්‍රියා කළ ආකාරය ආදර්ශයට ගෙන දිරියෙන් යුතුව සේවයේ යෙදීම සඳහා යොමු වීම මෙම පාඩම මගින් අපේක්ෂිත ය.**

ක්‍රියා 15:36-41, 16, 17 වන පරිච්ඡේද, ක්‍රියා 18:1-22

## දෙවන ධර්මදූත ගමන

කියවා බලමු.

**ක්‍රියා 15: 36-18:22**

මත ගැටුමක් (ක්‍රියා 15:36-41

පාවුලු ජොහාන් මාර්ක් ගෙන යාමට තදින් ම විරුද්ධ වීම. (පළමු ගමනේ දී පර්ගායේ දී ඔහු හැරී ගිය හෙයිනි.)

බාර්ණබස් තම ඥාති පුත්‍රයා ගමනට හවුල් කරවා ගැනීමට දැඩි මතයක සිටීම.

ප්‍රතිඵලය

**අපොස්තුළුවරු දෙදෙනා අතර දැඩි මත ගැටුම හේතුවෙන් දෙදෙනා වෙන් ව ධර්මදූත ගමන් දෙකක නියැලීම.**


බාර්ණබස් ජොහාන් මාක් සමග සයිප්‍රසයට ගිය බව සඳහන් වේ. (ක්‍රියා 15:39) තීරණ ගැනීමේදී මත ගැටුම් අබිබවා, සේවයට හානියක් නොවන ආකාරයෙන් ඒවා ක්‍රියාත්මක කිරීමට මෙම ධර්මදූත නායකයන්ට හැකියාව තිබිණි. ඔවුන් වෙන් වුවද පාවුලු, බාර්ණබස් සහ ජොහාන් මාක් අතර සම්බන්ධතාව අඛණ්ඩව පැවතුණු බව පාවුලු තුමාගේ ලිපි මගින් පැහැදිලි වේ.(කොලොස්සි 4:10, 2 තිමෝති 4: 11)

## දෙවන ධර්මදූත ගමනට පාවුලු සමග එක්වූවෝ

සභාවේ මූලිකයකු වූ, ජෙරුසලම් මන්ත්‍රණ සභාවේ තීරණය අඩංගු සංදේශය රැගෙන ගිය දිවැසිවර **සීලස්**, ලුස්ත්‍රාවේ හා ඉකොනියේ සහෝදරයන් අතර ප්‍රශංසාව ලැබූ, පාවුලුතුමා විසින් චර්ම ඡේදනය කරනු ලැබූ **තිමෝතියස්,** වෛද්‍යවරයකු වූ, ලූක් සුබ අස්න හා ක්‍රියා පොතේ කතුවරයා වූ **ලූක්** යන තිදෙනා ය.


ශුද්ධ පාවුලු තුමාගේ
දෙවන ගමන
අම්පිපොලිය
පිලිප්පිය
නෙයාපොලිය
නෙසලෝනිකය
බෙරිය
සමොත්‍රාපිය
ත්‍රෝවස
පිරිගිය
ගලාතිය
අන්තියෝකිය
ඉකෝනිය
සිලීසිය
ලුස්ත්‍රා
තාර්සස්
දර්බය
අන්තියෝකිය
සිරිය
එපීසය
මධ්‍යධරණී මුහුද
පිනීසය
කායිසාරිය
ජෙරුසලම
ලිබියා
මිසරය

# පාවුලුතුමාගේ දෙවන ධර්මදූත ගමන




❊ **සිරියාවේ අන්තියෝකිය (ක්‍රියා 15: 36-40)**
මත ගැටුමෙන් පසුව පාවුලු සීලස් ද කැටුව ගමන ඇරඹීම.

❊ **සිරියාව හා සිලිසියාව (ක්‍රියා 15:41)**
පළමු ධර්මදූත ගමනේ ඇරඹූ සභාවන් ස්ථිර කරමින් ගමන් කිරීම.

❊ **දර්බය හා ලුස්ත්‍රාව (ක්‍රියා 16:2-3)**
තිමෝතියස් චර්මඡේදනය කිරීමෙන් පසු ඔහු ද කැටුව යාම.
ආසියාවේ වචනය දේශනා කිරීම තහනම් කරන ලදුව, මසිදෝනියාවට යන ලෙස ශුද්ධාත්මයාණන් ඔවුන්ට මග පෙන්වූ සේක.

❊ **ත්‍රෝවස (ක්‍රියා 16: 8-10)**
"මසිදෝනියට ඇවිත් අපිට ආධාර කරන්න" යැයි මසිදෝනියේ මනුෂ්‍යයකුගේ අයැදීම දර්ශනයකින් පාවුල් දුටුවේ ය .

❊ **පිලිප්පිය (ක්‍රියා 16: 11-40)**
ත්‍රෝවසෙන් නැව් නැගී සමොත්‍රාසියටද, නෙයාපොලිසියටද යාත්‍රා කළ පාවුලු ඇතුළු පිරිස පිලිප්පි නගරයට පැමිණියහ. පිලිප්පියේ විදේශීක ජුදෙව් ජ න සමූහයක් වාසය කළහ. සබත් දිනයේ යාච්ඥාව සඳහා ධර්මශාලා භාවිත නො කොට ඔවුහු ගං ඉවුරේ රැස්වූහ.

## පිලිප්පියේ දී පැමිණි අභියෝග

පිලිප්පි ගං ඉවුරේ දී පාවුලුතුමාට හමු වන බැතිමතුන් කාන්තාවන් ය. ඔවුන්ට දේව වචනය දේශනා කර ධර්මදූත මෙහෙය එහි අරඹන ලදි.

මෙහි දී එම කාන්තාවන් අතර සිටි, තියාතිරා නුවරින් පැමිණි ස්ත්‍රියක වන ලිදියා දම් පාට සායම් වෙළඳාමේ යෙදුණු තැනැත්තියකි. ඇය දෙවියන් වහන්සේට නමස්කාර කළ කෙනෙකි. ඇය ද ඇයගේ ගෙයි වැසි සියලු දෙනාද බෞතිස්මය ලැබූහ. යුදෙව් සමාජය තුළ ස්ත්‍රීන්ට අවහිරයක්ව තිබූ ආගමික හා සංස්කෘතික පිළිවෙත් අභියෝගයට ලක් කරමින් ස්ත්‍රීන් මූලික වූ සභාවක් බිහි විය.

## වහල් තරුණිය

ගුප්ත දෑ හෙළි කළ ආත්මයක් ආවේශ වී පේන කීමෙන් සිය ස්වාමිවරුන්ට බොහෝ ලාභ හිමිකර දුන් වහල් තරුණියක් විය. ඇය පාවුලු හා සීලස්ගේ ක්‍රියාවන් හඳුනා ගනිමින් දින කිහිපයක් ම මොරගසමින් ඔවුන් පසුපස පැමිණියා ය. පාවුලු එම ආත්මයට කථාකොට ඇගෙන් පහව යන ලෙසට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් අණ කරන ලදි. එකෙණෙහි ම එම ආත්මය ඇගෙන් පහවිය.

එම වහල් තරුණියගේ ස්වාමිවරුන් විසින් පාවුලු හා සීලස් වෙළඳාම් පොළට ඇදගෙන ගොස් ප්‍රධානීන් ඉදිරියේ සිටුවා නඩුකාරයන් වෙතට ද ගෙන යන ලදී. මොවුන් නුවර කලඹන බවත් රෝමවරුන්ට පිළිපදින්නට බැරි නීති විරෝධි චාරිත්‍ර උගන්වන බවත් කියමින් චෝදනා කරන ලදී. නඩුකාරයින් ඔවුන්ගේ වස්ත්‍ර ඉරා කෝටුවලින් තලා හිරගෙදර දැමීමට අණ කරන ලදී. හිර ගෙදරදී පාද දඬු කඳන්වල සවි කිරීම වැනි වද හිංසා රැසකට ඔවුහු මුහුණ පෑහ.

ඒ සියල්ල ඉවසමින් පාවුලු හා සීලස් නොපසුබට වීර්යයෙන් ඒවාට මුහුණ දුන් අයුරු ක්‍රියා පොත පෙන්වා දෙයි.

## සිරගත වීමේ දඬුවමට ලක් වූ පාවුලු සහ සීලස්

මධ්‍යම රාත්‍රියේදී ඔවුන් යාච්ඤා හා දෙවිඳුන්ට ගී ගැයීම නිසා සිරකරුවෝ ද ඔවුන්ට ඇහුම්කන් දී සිටියහ. හදිසියේ ඇති වූ පොළෝ කම්පාවෙන් සිරගෙයි අත්තිවාරම් සෙලවී සිරගෙයි දොරවල් ඇරී සියල්ලන්ගේ බැඳුම් ලිහිණි. සිරගෙයි මුලාදෑනියා අවදි ව සිය දිවි නසා ගැනීමට සැරසිණි.

පාවුලු විසින් සිරගෙයි මුලාදෑනියා දිරිමත් කරන ලදී. "ඔබට කිසි අනතුරක් කර නොගන්න. අපි සියල්ලෝ මෙහි ය."

සිරගෙයි මුලාදෑනියා : ගැලවීම ලබන පිණිස මා කුමක් කළ යුතු ද?

පාවුලු : "ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහගන්න. එවිට ඔබ ගැලවෙන්නෙහි ය, ඔබ ද ඔබේ ගෙයි වැසි සියල්ලෝ ද ගැලවෙන්නාහ."

(ක්‍රියා 11: 30--31)

සිරගෙයි මුලාදෑනියා සහ ඔහුගේ ගෙයි වැසි සියල්ලෝ ම දේව වචනය අසා බෞතීස්ම ස්නාපනය ලැබූහ. මෙම ප්‍රාතිහාර්යය තුළින් තව තවත් දිරිමත් වූ ඔවුහු අන් අය දිරිමත් කළහ.

රෝම පුරවැසිභාවය හිමි ව තිබියදීත්, නියමිත හා නිවැරදි විනිශ්චයකින් තොර ව පාවුලු හා සීලස් සිරගත කිරීමේ වරද ඔවුන් විසින් රෝම නිලධාරීන්ට පෙන්වා දුන්හ. මෙසේ නීතිය අයථා ලෙස භාවිත කළ නිලධාරීන්ට විරෝධය පළ කළ ඔවුහු සැබවින් ම සේවයේ දී අභියෝග ජය ගත් බව පැහැදිලි වේ.

**❊ තෙසලෝනිකය හා බෙරියාව (ක්‍රියා 17:1-15)**

තෙසලෝනිකයේ මෙන්ම බෙරියාවේ දී ද ධර්මශාලාවේ දේශනා කළහ. ඒ නිසා ග්‍රීක් ස්ත්‍රී පුරුෂ කිහිප දෙනෙක්ම ඇදහිල්ලට පැමිණියහ. එහෙත් එම ඇදහිලිවතුන් හා ධර්මදූත පිරිස ජුදෙව් පීඩනවලට මුහුණ දුන්හ. මෙහි ප්‍රතිඵලය වූයේ සුබ අස්න පතළ කිරීම සඳහා ඊළඟ නගරය වෙත පාවුලුට යාමට අවස්ථාව ලැබීම යි.

සීලස් හා තිමෝතියස් පීඩන ඇතිවූ නුවරවල තව දුරටත් සේවය කරනු පිණිස නොපසුබට වීර්යයෙන් නැවතී සිටීම වැදගත් ය.

**❊ ඇතන්ස් (ක්‍රියා 17: 16-34)**

පාවුලුතුමාගේ මීළඟ මධ්‍යස්ථානය වූයේ දර්ශනවාදය, අධ්‍යාපනය, සාහිත්‍යය, විද්‍යාව හා කලාවට ප්‍රසිද්ධ නගරයක් වූ ග්‍රීසියේ ඇතන්ස් නුවරයි.

**ඇතන්ස් නගරයේ ධර්මදූත සේවය**

- ❊ ජුදෙව්වන්, භක්තිවන්තයන්, දිනපතා වෙළඳාම්පළේ හමුවූවන් සමග වාද කිරීම.
- ❊ තමා හොඳින් උගත් දේ පිළිබඳව අන් අය හා වාදකිරීමෙන් පසුබිම ගොඩනගා ගැනීම. (ක්‍රියා 17: 17--18)
- ❊ ඇතන්ස් නගරයේ ධර්මදූත සේවය ජුදෙව්වන්, භක්තිවන්තයන්, දිනපතා වෙළඳාම්පළේ හමුවූවන් සමග වාද කිරීම
- ❊ එපිකූරීය දාර්ශනිකයන් - (ජීවිතයේ මූලික අභිප්‍රාය සතුට හා සොම්නස සෙවීම බව විශ්වාස කළ අය.)
- ❊ ස්තෝයික දාර්ශනිකයන් - (ස්වභාව ධර්මය සමග සහයෝගයෙන් තර්කානුකූලව සිතමින් මනා සාමයකින් ජීවත් විය යුතු බව ප්‍රකාශ කළ අය.)
- ❊ අන් අයගේ මත වාදවලට ඉඩ හැරීම.(ක්‍රියා 17:18)
- ❊ අන් අය තුළ කුතුහලයක් ඇති කොට සිය දහම ප්‍රචාරය කිරීමට අවස්ථාව ලබා ගැනීම (ක්‍රියා 17:19--21)

ස්ථානය → අරියෝපගයේ ශාලාව වියත් ග්‍රීක දාර්ශනිකයන් එක්රැස් වන ප්‍රසිද්ධ රැස්වීම් ශාලාවකි.

එම නුවර බහු ආගමික පරිසරය තුළ අන් අයගේ විශ්වාසයන් අගය කිරීම (ක්‍රියා 17:22)

පරිසරය තුළින් ම තම දේශනය ඉදිරිපත් කිරීම සඳහා කාරණය තෝරා ගැනීම

'නාඳුනන දෙවිඳුන්ටය යන පූජාසනය' 'යන්න තුළින් දේව පණිවුඩය දීම. (ක්‍රියා 17: 23)

## ඇතන්ස්හි දේශනය සැකෙවින්

ආගමික පිරිසක් වන ඇතැන්ස් වැසියන්ගේ ආගමික බව ප්‍රයෝජනයට ගනිමින් තම දේශනය ආරම්භයේ දී දෙවියන් වහන්සේ පිළිබඳව දීර්ඝ වර්ණනයක යෙදීම. ඒ හරහා රූප නමස්කාරයේ පුහු බව දැක්වීම. (ක්‍රියා 17: 24--27)

ඇතැන්ස් වැසියන් භාවිත කරන සාහිත්‍යය තුළින් තම දෙසුම පෝෂණය කිරීම (ක්‍රියා 17: 28)

දෙවියන් වහන්සේගේ අසමසම දේවත්වය හා සර්ව බලධාරිත්වය ගැන ප්‍රකාශ කිරීම (ක්‍රියා 17: 29)

මනස්ථාපනය වීමේ අවශ්‍යතාව ධර්මිෂ්ඨ විනිශ්චය හා ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ ඉදිරිපත් කිරීම (ක්‍රියා 17: 30--31)

විවිධ ප්‍රතිචාර සඳහා ඉඩ හැරීම (ක්‍රියා 17: 32)

ඇතැන්ස්හි දී ස්ථානෝචිත ප්‍රඥාවෙන් නොපසුබට වීර්යයෙන් ක්‍රියාකිරීමෙන් පාවුලු තුමා අත්පත් කරගත් දෘශ්‍යමාන ප්‍රතිඵල වන්නේ සමහර ඇතැන්ස් වැසියන් දෙවියන් වහන්සේ අදහා ගැනීමයි. (දියෝනිසියස්, දමරිස් ඉන් ප්‍රධාන වේ. (ක්‍රියා 17: 34)

## ❊ කොරින්තිය (ක්‍රියා 18:1-17)

ග්‍රීසියේ දේශපාලන හා වාණිජමය මධ්‍යස්ථානයෙකි කොරින්තිය. දුරාචාරයට ප්‍රසිද්ධ නගරයක් ලෙස එය හැඳින්වේ.

පාවුලුතුමා — කූඩාරම් කර්මාන්තය — අකිලා සහ ප්‍රිස්කිලා යුවල

පාවුලුතුමා: ජුදෙව් දරුවකු ලෙස පුහුණු වූ කර්මාන්තය කූඩාරම් තැනීම යි. ඔහු වර්ෂ 1, 1/2ක් කොරින්තියේ නැවතී සිටියේ ය. දර්ශනයක් මගින් දෙවියන් වහන්සේ එය ඔහුට දන්වන ලදී.(ක්‍රියා 18:9--10)

අකිලා සහ ප්‍රිස්කිලා යුවල: අකිලා පන්තස්හි උපන් ජුදෙව්වෙකි. මෑත දී කොරින්තියට පැමිණි යුවළකි. ක්ලෞදියස් සියලු ජුදෙව්වරුන්ට රෝමයෙන් අහක් ව යන්නට අණ කළ කාලයේ දී ඔවුහු කොරින්තියට පැමිණියහ. (ක්‍රියා 18:1--2)

දෙගොල්ලන්ම එකට එක්වී එම කර්මාන්තයේ නියැලීම තුළින් තම ආර්ථික අවශ්‍යතා සපුරාගත්හ.. (ක්‍රියා 18:3)

සබත් දිනවල ධර්මශාලාවෙහි වාද කරමින් ජුදෙව්වරුන් හා ග්‍රීක්වරුන් ඇදහිල්ලට පමුණුවාලීමට ක්‍රියා කළේ ය.

පාවුලු, සීලස් හා තිමෝතියස් සමග එක්ව ධර්මය දේශනා කිරීමෙහි ම නිරත විය. නොපසුබට වීර්යයෙන් සිය කර්මාන්තයෙහිත් යෙදුණේ ය.

ජුදෙව්වන් සුබ අස්න ප්‍රතික්ෂේප කළ අවස්ථාවල දී විජාතිකයන් වෙත ගොස් ධර්මය දේශනා කළේ ය.

තීතස් ජුස්තස්, ධර්මශාලා මුලාදෑනියා වූ ක්‍රිස්පස් හා ඔහුගේ පවුලේ අය ගායස් (1 කොරින්ති 1:14), ස්තේපන් පවුලේ අය (1 කොරින්ති 1:16) වැනි කිහිප දෙනෙක් වචනය අසා අදහාගත්හ.

ගලීයෝ අකයියාවේ අධිපතියා ව සිටිය දී ඔහු ඉදිරියට පාවුලු ගෙන එන ලදී. නමුත් පාවුලුට දඬුවම් කිරීමට ගලියෝ එකඟ නොවුණි.

✲ **කෙන්ක්‍රෙයාව (ක්‍රියා 18:18)**

පාවුලු අකිලා ද ප්‍රිස්කිලා ද සමග සිරියාවට යන අතරතුර දී භාරයක් වී සිටි බැවින් කෙන්ක්‍රෙයාවට ගොස් එහි දී හිස මුඩු කර ගත්තේ ය.

එපීසයෙන් නැව් නැග → කායිසාරියට ගොඩ බැස → ජෙරුසලමට ගොස් සිරියාවේ අන්තියෝකිය බලා නැවත ගමන් කරන ලදී.

විවිධ අභියෝග ජය ගනිමින් ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ ස්ථානෝචිත ප්‍රඥාවෙන් පාවුලු, සීලස්, තිමෝතියස් හා ලූක් දෙවන ධර්මදූත චාරිකාව තුළ නොපසුබට වීර්යයෙන් ක්‍රියා කළ ආකාරය කිතුනුවන්ට ආදර්ශයකි.

**ක්‍රියාකාරකම්**

1. පාවුලු තුමාගේ දෙවන ගමන තුළ මුහුණ දුන් අභියෝග, ඒවා ජය ගත් අයුරු විමර්ශනය කර, වර්තමානයේ අප හමුවට පැමිණෙන අභියෝගවලට මුහුණ දීමට ඉන් අනුබලයක් ලබා ගත හැක්කේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

# 15 අභියෝග මැද මෙහෙවර

**පාවුලුතුමාගේ තෙවන ධර්මදූත ගමන එපීසය මූලික කොටගෙන සිදු විය. එහි දී පාවුලුතුමා මුහුණදුන් අභියෝග සඳහා අවස්ථාවෝචිත ලෙස ප්‍රතිචාර දැක්වී ය. එම ආදර්ශයන් අනුගමනය කරමින් ඵලදායි ධර්මදාන මෙහෙවරකට යොමුවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

ක්‍රියා 18: 23 - 21: 19

### තෙවන ධර්මදූත ගමන

මෙම පාඩමෙන් අධ්‍යයනය කෙරෙනුයේ පාවුලුතුමාගේ තෙවන ධර්මදූත ගමනයි. එය එපීසය නම් නගරය මූලික කොටගෙන සිදුවූවකි. එම ගමනට තිමෝතියස්, ත්‍රෝපිමස් හා ලූක් පාවුලු සමග හවුල් වූහ.

ක්‍රි. ව. 53 සිට 54 දක්වා කාලයේ දී කිලෝ මීටර් 4024 ක් පමණ දුරක් ඔවුන්ගේ ගමනට ඇතුළත් වූ බව පෙනී යයි.

කලින් පිහිටුවන ලද සභා ශක්තිමත් කරමින් ගලාතිය හා පිරිගිය පළාත් මැදින් ඔවුහු ගමන් කළහ. (ක්‍රියා 18: 23)

### එපීසය

ප්‍රසිද්ධ වෙළෙඳ නගරයක් වූ එපීසය සුළු ආසියාවේ අග නගරය විය. ලොව පුදුම හතෙන් එකක් ලෙස සැලකෙන ප්‍රසිද්ධ අර්තේමිස්ගේ දේවාලය මෙහි පිහිටා තිබිණි. පාවුලුතුමා වසර 2 ක් පමණ එපීසයේ නැවතී සිටියේ ය. ඔහු විවිධ අභියෝගවලට එහි දී සාර්ථක ලෙස මුහුණ දුන් බව ක්‍රියා පොත සාක්ෂි දරයි.


**කියවා බලමු.**

**ක්‍රියා 18: 24 සිට,9: 10**

### එපීසයේ සිදුවීම්

| | |
|---|---|
| අකිලා හා ප්‍රිස්කිලා - | අපොල්ලොස්ට හමුවීම. ඔහු ව්‍යක්ත කථිකයෙකි, ධර්ම දේශකයෙකි. ස්නාවක ජොහාන්ගේ බෞතිස්මය ගැන පමණක් දැන සිටි කෙනෙකි. අකිලා ප්‍රිස්කිලා ඔහුට දෙවියන් වහන්සේගේ මාර්ගය වඩා හරි ලෙස පහදා දුනි. |
| පාවුල් - | ස්නාවක ජොහාන්ගේ ශ්‍රාවකයන් සහ ග්‍රීක්වරුන් හමුවීම. ස්නාවක ජොහාන්ගේ ගෝලයන්ට ජේසුස් වහන්සේ ගැන පහදා දීම. ඉන් පසුව බෞතීස්ම කරන ලදුව, අත් තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් වෙත පැමිණි විට අන්‍ය භාෂාවලින් කථා කිරීම. ග්‍රීකවරුන්ටද දේව වචනය ප්‍රකාශ කෙරුණි. |

මෙය පාවුලුතුමා එපීසයේ දී ජයගත් අභියෝගයකි


ශුද්ධ පාවුලු තුමාගේ
තුන් වන ගමන
මසිදෝනිය
නෙසලෝනිකය
පිලිප්පිය
බෙරිය
අපොලෝනිය
සමොත්‍රාකිය
බිතිනිය
ත්‍රෝවස
අසොස්
මිතුලේන
පිරිගිය
කියොස්
කොරින්තිය
ඇතැන්ස්
එපීසය
අන්තියෝකිය
ඉකෝනිය
ලුස්ත්‍රා
දර්බය
ගලාතිය
අකයිය
සාමොස්
මිලේතස
කෝස්
සිලීසිය
තාර්සස්
පතාර
අන්තියෝකිය
සිරිය
ක්‍රීතය
රෝදස්
සයිප්‍රස්
මධ්‍යධරණී මුහුද
පිනීසය
තීර්
තොලිමයිස
කායිසාරිය
ජෙරුසලම
මිසරය

කියවා බලමු.

## ක්‍රියා 19: 11-17

සංචාරක ජුදෙව් යකැදුරන් හා ස්කේවාගේ පුත්‍රයන් සත් දෙනකු පාවුලුතුමා තුළින් බොහෝ ප්‍රාතිහාර්ය සිදුවන බව දැක, පාවුලු දේශනා කරන ජේසුස් වහන්සේගේ නාමයෙන් ප්‍රාතිහාර්ය සිදුකිරීමට උත්සාහ කරන ලදී.

මෙම යකැදුරන් විසින් ජේසුස් වහන්සේගේ නාමය වැරදි ලෙස භාවිත කිරීම නිසා තමන්ට ම විනාශය ඇති කර ගති.

**මෙම අභියෝගය හමුවේ අත් දුටු ප්‍රතිඵල**

- ❖ දේව බලය ප්‍රකාශ වීම
- ❖ නපුර හා අසත්‍ය විනාශ වීම
- ❖ ජේසුස් වහන්සේගේ නාමයට ගෞරවය ඇතිවීම
- ❖ යන්ත්‍ර මන්ත්‍ර අභ්‍යාස කළ බොහෝ දෙනෙක් එම මාර්ගවලින් හැරී දෙවියන් වහන්සේ අදහා ගැනීම.
- ❖ දේව වචනය බලවත් සේ වැඩී වර්ධනය වී පැතිර යාම.

කියවා බලමු.

## ක්‍රියා 19: 23-41

"අත්වලින් සෑදූ දෙවිවරු, දෙවිවරු නොවේ ය" යන පාවුලුතුමාගේ ඉගැන්වීම හේතුවෙන්,

අර්තේමිස් දේවාලයේ රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම.

දෙමෙත්‍රියස් නම් රිදී රූප සාදන්නා පාවුලු ඇතුළු කණ්ඩායමට විරුද්ධව කටයුතු කිරීම.

පාවුලුට විරුද්ධව එපීසයේ කෝලාහලයක් හට ගැනීම.

නගර සභා ලේකම් තැන කෝලාහලය සන්සිඳුවීම.

මිථ්‍යා මත රූප වන්දනාවෙන් මිනිසුන් වළක්වා එක ම සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමට ඔවුන් යොමු කිරීමේ අභියෝගයට පාවුලු ඇතුළු පිරිස මුහුණ දුන්හ. එහි දී අත්වලින් සෑදූ පිළිම / රූප නමස්කාරය අර්ථ විරහිත බව පෙන්වා දුනි.

**මෙම අභියෝගය හමුවේ අත්දුටු ප්‍රතිඵල**

මිනිසුන් රූප වන්දනාවෙන් වැළකීම හේතුවෙන් රිදී රූප ව්‍යාපාරයට පහර වැදීම.

එකම සැබෑ දෙවිඳුන් නමස්කාර කිරීමේ වැදගත්කම අවබෝධ කරගැනීම.

# එපීසය අවට නගරවල ධර්මදූත සේවය

**කියවා බලමු.**

**ක්‍රියා 20:1 - 21:19**

එපීසයේ කෝලාහලය සංසිඳුනු පසු පාවුලු එහි සිටි ශ්‍රාවකයන් ධෛර්යවත් කොට ග්‍රීසියට පැමිණ ජුදෙව්වරුන්ගේ පීඩාවන් මැද සේවය කරමින් ගමනෙහි යෙදුණි.
(ක්‍රියා 20: 1--6)

ත්‍රොවසයේ දී යුතිකස්ට ප්‍රාතිහාර්යාත්මක ලෙස නැවත පණ දීමේ සිද්ධිය අභියෝගයක් ලෙස භාර ගති. (ක්‍රියා 20: 7--12)

එපීසයේ සිටි සභා මූලිකයන් මිලේතසයට කැඳවා සිය සේවය පිළිබඳ තොරතුරු ඔවුන් සමග බෙදා ගති. ඔවුන්ට නව ඇදහිලිවතුන්ගේ වගකීම පවරා ඔවුන්ගෙන් සමු ගැනීමේ අභියෝගයට ද මුහුණ දුනි.

අගබස් ප්‍රකාශ කළ තමාට විය හැකි පීඩාව දැන දැන, අධෛර්යයට පත් නොවී ජෙරුසලමට යාමේ අභියෝගයට ද ඔහු මුහුණ දුනි.

මෙසේ පාවුලු හා තම පිරිස තෙවන ධර්මදූත ගමන සාර්ථක කර ගැනීම සඳහා දිරියෙන් හා කැපවීමෙන් ක්‍රියා කළහ. මුහුණ දීමට තිබූ අපමණ බාධා හා අභියෝග ජයගනිමින් ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ සේවය කළහ.

දෙවියන් වහන්සේ වෙනුවෙන් අපගේ සිත යොදවන විට, අපට වැඩ කරන්නට සිදු වන්නේ, අභියෝගාත්මක පරිසරයක ය. එවන් විට ශුද්ධ වූ පාවුලුතුමා මෙන්, අභියෝග ජය ගැනීමට, ශුද්ධාත්ම සවිය ලබමින් ගමන් කරමු.

**ක්‍රියාකාරකම්**

1. එපීසයේ දී පාවුලුතුමාට මුහුණ දීමට සිදු වූ අභියෝගවලට එතුමා මුහුන දුන් ආකාරය විග්‍රහාත්මකව අගයන්න.

2. ඔබට මුහුණදීමට සිදුවන අභියෝග පරාජය කිරීම සඳහා පාවුලුතුමා අනුගමනය කරමින් ඔබ ක්‍රියාකරන අයුරු පහදන්න.

# 16 සාක්ෂියේ දිරියෙන් මෙහෙවර

පාවුලුතුමා රෝමයට සිරකරුවකු ලෙස ගිය ගමන අධ්‍යයනය කිරීම තුළින් කිතුනුවකු සාක්ෂි දැරිය යුතු අයුරු මින් පැහැදිලි කෙරේ. සෑම විට ම ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් ඉවසීමෙන් සත්‍යවාදීව හා එඩිතරව ක්‍රියා කිරීමට යොමු වීමේ වැදගත්කම ද ඉදිරිපත් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

ක්‍රියා 25:10-11, 26:32,27,28 පරිච්ඡේද

තුන්වන ධර්මදූත ගමන අවසානයේ දී අගබස් නම් දිවැසිවරයා පැවසූ ලෙසට ම ජෙරුසලම් දේව මාලිගාවේ දී පාවුලුතුමා අත්අඩංගුවට පත්විය. ජුදෙව් මන්ත්‍රණ සභාව ඉදිරියේත් ෆීලික්ස් ආණ්ඩුකාරයා ඉදිරියේත් ඔහු විනිශ්චයට ලක්විණි. තම හැරීම සිදුවන අවස්ථාවේ දුටු දර්ශනය ලෙසට තමන් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය උදෙසා කොපමණ දුක් විඳින්නට ඕනැද යි පාවුලු ජෙරුසෙලමේදී සාක්ෂි දැරීය.

## රෝම ගමනේ දී සාක්ෂි දැරීම

කියවා බලමු.

ක්‍රියා 25: 10-11, 26: 32 - 27: 1

නායක පූජකයන්ගේ හා ජුදෙව්වරුන්ගේ අරමුණ වූයේ පාවුලුතුමාට ජෙරුසලමේ දීම දඬුවම් කොට මරා දැමීමට යි.

තමාට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් තමා නිර්දෝෂ බව පාවුලුතුමා දැන සිටියේය. රෝම පුරවැසියෙකු වශයෙන් තමාට හිමි වරප්‍රසාදය යටතේ, රෝම අධිරාජ්‍යයාගේ විනිශ්චය ලබාගැනීම සඳහා ඔහු අයැද සිටියේ, කෙසේ හෝ රෝමයට යාමේ අභිප්‍රාය ඉටුකර ගැනීම සඳහා ය. ෆෙස්තුස් හා අග්‍රිපා රජු විසින් පාවුලුතුමාට එම අවස්ථාව ලබාදීමෙන් පාවුලුතුමාගේ රෝමයට යාමේ අභිප්‍රාය මල් ඵල ගැන්විණි.

පාවුලුතුමා සිරකරුවකු ලෙස රෝමය බලා ගමන් කරයි.
ඔහු සමග ලූක් හා අරිස්තාර්කස් ද ගමනට එක්වේ.

## ගමන ආරම්භයේ දීම සාක්ෂි දැරීම (ක්‍රියා 27: 1-13)

සිරකරුවකු ලෙස පාවුලුතුමා ගෙනයනු ලැබුවේ ඉතාලිය බලා යන නැවක ය. එහිදී තවත් සිරකරුවන් කිහිප දෙනකු ද ගෙන යන ලදී.

අගෝස්තීනු නම් බල ඇණියේ ජූලියස් නම් ශතාධිපතියාට මෙම සිරකරුවන්ගේ වගකීම පැවරිණ.

**පාවුලුතුමා සිය ජීවිතයෙන් සාක්ෂි දරයි**

ශතාධිපතියාගේ ගෞරවය ඔහුට හිමි වේ

ඔහුගේ කරුණාවට පාත්‍ර වේ.

යම් තාක් දුරකට නිදහස භුක්ති විඳීමට ඔහුට අවස්ථාව ලැබේ.

**නිවැරදි උපදෙස් දීම මගින් සාක්ෂි දැරීම (ක්‍රියා 27: 4--12)**

සයිප්‍රසයේ වෙරළාසන්නය → සිසිලිය හා පම්පිලියාවේ වෙරළාසන්න මුහුද → ලිසියාවේ මුරා නුවර

ශතාධිපතියා විසින් ඉතාලියට යන ඇලෙක්සැන්ඩ්‍රියාවේ නැවකට පාවුලු ඇතුළු පිරිස නැංවීම. → ක්‍රීතයේ වෙරළ → සල්මොන් තුඩුව → සුන්දර වරාය

ජීවිතවලට බඩු බාහිරාදියවලට ඇති අනතුරුදායක බව පිළිබඳව පාවුල්තුමා උපදෙස් දුන් නමුත් ශතාධිපතියා වඩාත් සැලකුයේ නැව්පතියාගේ හා නැව් අයිතිකරුගේ උපදෙස් ය → ක්‍රීතයේ වරායක් වූ පෙනීකිය → මෙහිදී ශීත කාලය ගතකිරීමට බොහෝ අය කැමති වූහ.

මාලිමාවක් නොතිබූ පැරණි කාලයේ නැව් ගමන් සඳහා මග දැක්වූයේ තාරකා යි. බිහිසුණු කාලගුණ තත්ත්වයන් පැවති කාලවල නැව් ගමනාගමනය වඩාත් අන්තරාදායක විය. එමෙන් ම සැප්තැම්බර් මස නැව් ගමනාගමනය සැක සහිත වූ අතර, නොවැම්බර් මස වන විට එය වඩාත් බිහිසුණු හා ඉතා අපහසු කාර්යයක් විය. පාවුලුතුමා හා පිරිස රෝමය බලා යාමේ මෙම සිදුවීම ඔක්තෝබර් මස සිදු වූ බව පිළිගැනෙන අතර මේ සියල්ල ගැන අත්දැකීමෙන් සිටි පාවුලුතුමාගේ සත්‍යවාදී අදහස් හා උපදෙස් මෙහි දී සැලකිල්ලට භාජනය නොවීම අභාග්‍ය සම්පන්න වූ බව මෙම ගමනේ ඉදිරි සිදුවීම් මගින් පැහැදිලි වේ.

**කුණාටුවේ දී හා නැව බිඳීයාමේදී සාක්ෂි දැරීම (ක්‍රියා 27:13-44)**

ක්‍රීතයට යාමෙන් අර්බුදයකට මුහුණ දීම
ඔවුන් මුහුණ දුන් අර්බුදය කුමක්දැයි ඔබ දන්නවා ද ?

↓

එව්රකුලොන් නම් කුණාටුව යි

↓

නාවිකයන්ට වඩාත් හුරු පුරුදු බිහිසුණු විපත් ගෙන දුන්, මෙම චණ්ඩ මාරුතය ඊසාන දෙසින් හැමී ය. බිහිසුණු බව හේතුවෙන් එම නමින් හැඳින්විණි

↓

චණ්ඩ මාරුතය හේතුවෙන්

ජීවිත ආරක්ෂාව පිළිබඳ ගැටලු මතු විය → බිය, සැක

තමාට හිමි බඩු බාහිරාදිය අහිමි විය → අධෛර්ය වීම

අඳුරු පරිසරයක දිවි රැකගැනීමට සිදු විය → කළකිරීම, ආත්ම විශ්වාසය බිඳ වැටීම

**ජීවිත අර්බුද නිසා ඇතිවන කුණාටු හේතුවෙන්**

මේ සියලු අර්බුද මැද පාවුලුතුමා ඇදහිල්ලේ ස්ථිරව ම සිටිමින් සාක්ෂි දරයි.

කියවා බලමු.

**ක්‍රියා 27:21-26**

මා වැඳුම් පිදුම් කරන මාගේ ම දෙවියන් වහන්සේගේ දූතයෙක් ඊයේ රාත්‍රියේ මා ළඟ සිට"පාවුලු බිය නොවන්න ඔබ අධිරාජ්‍යයා ඉදිරියේ සිටින්නට ම ඕනෑ ය. මෙන්න ඔබ සමග නැවෙන් යන සියල්ලන්ගේ ද ආරක්ෂාව දෙවියන් වහන්සේ ඔබට දුන් සේකැ"යි කීය. (ක්‍රියා 27: 23--24)

පාවුලුතුමාගේ මෙම සාක්ෂි දැරීමෙන්, ශතාධිපතියා හා නැවියෝ පාවුලුට විශ්වාසයෙන් සවන් දුන්හ. නොපසුබට ව අවශ්‍ය පියවර ගත්හ. සියල්ලෝ ම දිරිමත් වූහ. කෑම කා ශක්තිය ලැබූහ.

**සාක්ෂි දැරීමෙන්, ජීවිත කුණාටු හා අභියෝග ජයගැනීමට සවිය හා දිරිය ලැබේ.**

හිරකරුවකු ව සිටියද අභියෝග මධ්‍යයේ සාක්ෂි දැරීමෙන් අන් අය දිරිමත් කළ පාවුලුගේ දිවි සුරැකීමට ශතාධිපතියා ඉදිරිපත් විය. (ක්‍රියා 27: 42--44)

## මෝල්ටාවේ දී සාක්ෂි දැරීම (ක්‍රියා 28: 1-10)

මෝල්ටාව, සිලිසියාවට සැතපුම් 60 ක් පමණ දකුණින් පිහිටි නගරයකි. එහි වෙළඳාම සඳහා වැදගත් වූ වරායන් කීපයක් පිහිටා තිබිණි.

මෝල්ටාවේ වැසියන්

| | | |
|---|---|---|
| සීතල නිසා ගිනි මැලයක් ගසා පාවුල් ඇතුළු පිරිස පිළිගන්නා ලදී | තුන් දවසක් ඔවුන් ආගන්තුක සත්කාර දක්වන ලදී. | පාවුලු ඇතුළු පිරිස පිටත්ව යන කළ ඔවුන්ට වුවමනා දේ නැවට පැටවී ය. |

සර්පයකු පාවුලුගේ අතෙහි එල්ලුන ද, අනතුරක් සිදු නොවී ම තුළින් ඇති වූ සාක්ෂි දැරීම අපට දැක ගත හැකි ය. (ක්‍රියා 28: 3--6)

මුලින් ඔහු මිනිමරුවෙක් යනුවෙන් සෙනඟ තුළ පැවති අදහස ඔහු දෙවි කෙනෙකි යි යන්න දක්වා වෙනස් විය. ලුස්ත්‍රාවේ සිදුවීමට පසු දේවත්වයෙන් සැලකූ දෙවන අවස්ථාව ලෙස මෙය හැඳින්විය හැකි ය.

දිවයිනේ ප්‍රධානියා වූ පබ්ලියස්ගේ පියා උණෙන් හා අතීසාරයෙන් පෙළුණ විට ඔහු ඇතුළු වෙනත් රෝගීන් සුවකිරීමෙන් ද සාක්ෂි දරන්නට හැකි විය. (ක්‍රියා 28: 7--10)

යාච්ඤාවෙන්, විශ්වාසයෙන්, ප්‍රාතිහාර්ය සිදු කිරීමෙන් සාක්ෂි දැරීමට ඉදිරිපත් වූ පාවුලුතුමාගේ සඵලවත් මෙහෙවර මෙම ගමනේ දී අපට පැහැදිලි වේ.

## රෝමයේදී සාක්ෂි දැරීම (ක්‍රියා 28: 11-30)

පාවුලුතුමා රෝම අධිරාජයාගේ විනිශ්චය අපේක්ෂාවෙන් දේව ප්‍රඥාව හා මග පෙන්වීම ඇතිව අන්තරායදායක නැව් ගමනක් නිමා කරමින් රෝමයට පැමිණියේය. මෙහි දී ජුදෙව් ප්‍රධානීන් අතරට ගොස් ඔහුගේ ජීවිත සාක්ෂිය දැරීය. පාවුලු ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරීමේ තම ඒකායන අභිප්‍රාය මුදුන් පමුණුවා ගත් අයුරු මෙහි දී පැහැදිලි වේ.

ජීවිත ගමනේ දී කිතුනුවන්ට කෙතරම් බාධක, අර්බුද, ගැටලුවලට මුහුණ පෑමට සිදු වුවද, ඒ සියල්ල මධ්‍යයේ විශ්වාසවන්තව සිටිමින්, ඒවා ජයගැනීමට ශුද්ධාත්ම මඟ පෙන්වීම හා දිරිය නො අඩුව ලැබෙන අයුරු පාවුලුතුමාගේ රෝමයට යාමේ ගමන තුළින් අපට පසක් කර දෙයි. එසේම අර්බුද හා අභියෝග මැද එඩිතර ව සත්‍යයට සාක්ෂි දැරීමේ අවශ්‍යතාව කිතුනුවන් වටහා ගැනීම වැදගත් ය.

සිරගතවීම්, පහරකෑම්වලට ලක්වීම්, අසාධාරණ විනිශ්චයන්ට මුහුණදීම් ආදී විවිධ අර්බුද හා අභියෝගවලට මුහුණ පෑමට ඔහුට සිදුවිය. ධර්මදූත ගමන් යැමෙන්, ලිපි ලිවීමෙන් හා විශේෂයෙන් රෝමයට යැමේ ගමනින් ද අවසානයේ ක්‍රි. ව. 64 දී නීරෝ අධිරාජ්‍යයාගේ සමයේ වේද සාක්ෂික මරණයකට මුහුණ දුන් බවට මතයක් ඇත. මෙසේ ක්‍රිස්තුස් වහන්සේගේ විශ්වාසවන්ත සේවකයෙකු ලෙස සාක්ෂි දැරීමේ දිවියක් ගත කිරීමට පාවුලුට හැකි විය. එතුමා මුළු මහත් කිතුනු සභාවට ම ආදර්ශයකි, ආලෝකයකි.

**ක්‍රියාකාරකම්**

1. රෝමයට යන ගමන පාවුලුතුමා සාක්ෂි දැරීම සඳහා යොදාගත් අයුරු සනාථ කිරීම සඳහා නිදසුන් කිහිපයක් ලියා දක්වන්න.

2. ඔබේ ජීවිතයේ කුණාටු ඇතිවන විට ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සාක්ෂි දැරිය හැකි ආකාර 3 ක් දක්වන්න.

# 17 ක්‍රිස්තුන් වහන්සේට අයත් මම

**ජේසුස් වහන්සේ තම ඉගැන්වීම් තුළින් මෙන් ම ජීවිත ආදර්ශයෙන් ද ප්‍රේමය පදනම් කර ගනිමින් දේව රාජ්‍යයෙහි ගුණාංග දැක්වූ සේක. මෙය බයිබලයේ සඳහන් විශේෂ චරිත දෙකක් තුළින් විමසීමට ලක් කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ජොහාන් 3: 1-15,4: 7-10, පිලිප්පි 2:1-5, 16**

## ජේසුස් වහන්සෙ හා නිකදේමුස්

ජේසුස් වහන්සේ සිනගෝගයෙහි මෙන් ම නොයෙකුත් ස්ථානවල ඉගැන්වීමේ යෙදී සිටි නිසා උන්වහන්සේට රබ්බී ලෙස, එනම් ගුරු දේවයාණන් ලෙස ජුදෙව් ජනතාව ආමන්ත්‍රණය කළ බව අපි දනිමු.

ජුදෙව්වන්ගේ ප්‍රධානියකු ව සිටි නිකදේමුස් ද පරිසිවරයකු මෙන් ම ගුරුවරයකු ද විය. ජේසුස් වහන්සේගේ සමහර ඉගැන්වීම් පිළිබඳ ව පරිසිවරු එකඟ නො වුව ද නිකදේමුස් නම් වූ පරිසිවරයා වරෙක රාත්‍රියේ ජේසුස් වහන්සේ හමුවීම තුළින් අපට පෙනී යන්නේ,

- නිකදේමුස් තමා තුළ තිබූ ගැඹුරු ආත්මික ප්‍රශ්නවලට ජේසුස් වහන්සේ තුළින් පිළිතුරු සෙවීමට දැඩි පිපාසයක් ඇතිව සිටි බව
- රාත්‍රියක වුවද, නිකදේමුස් සමග පැවති සංවාදයේදී ඔහුව ආලෝකමත් කිරීමට ජේසුස්වහන්සේට හැකි වූ බව.

නිකදේමුස් ජේසුස් වහන්සේ හමු වූ විට පැසුවේ,

**"ගුරු දේවයිනි,**
**ඔබ දෙවියන් වහන්සේ වෙතින් වැඩම**
**කළ ගුරුවරයෙක් යැයි**
**අපි දනිමු.**
**මන්ද දෙවියන් වහන්සේ**
**තමා සමග වැඩ නොසිටින සේක් නම්**
**කිසිවකුට ඔබ කරන වේ භාස්කම්**
**කළ නොහැකි ය. "**
**ශු. ජොහාන් 3: 2**



නිකදේමුස්ගේ ඉහත ප්‍රකාශයෙන් අපට පැහැදිලි වන්නේ නිකදේමුස් උසස් සමාජ තත්ත්වයක සිටි පුද්ගලයකු වුවත් ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ වෙතින් වැඩම කළ සේකැ යි විශ්වාස කළ බව ය. එසේ ම උන්වහන්සේට උතුම් ගෞරවය දෙමින් ඔහු ජේසුස් වහන්සේ සමග සම්බන්ධ වීමට කැමැත්ත දක්වන බවයි. එවන් සම්බන්ධතාවක් ජේසුස් වහන්සේ සමග ගොඩ නගා ගැනීමට ඔහුට අවශ්‍ය ව තිබුණ බව පෙනී යයි. එහෙයින් ජේසුස් වහන්සේගේ ප්‍රේමයේ ආලෝකයෙන්, පසු කාලයේ දී ඔහුගේ ජීවිතය වෙනස් වූ බව සුබ අස්න තුළින් අපට එළිදරව් වේ.

ජේසුස් වහන්සේගේ ඔහුට දැක්වූ ප්‍රතිචාරය පහත බයිබල් පාඨයෙන් තේරුම් ගනිමු.
ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්,

**"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි.**
**යමෙක් නැවත නූපන්නොත්**
**ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැක ගත නොහැක. "**
**ශු. ජොහාන් 3:3**

ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය නිකදේමුස් නිවැරදි ලෙස වටහා ගත් බවක් නොපෙනේ. එය ඔහු අසන මෙම ප්‍රශ්නයෙන් වඩාත් පැහැදිලි වෙයි. එනම් මිනිසකු මහලු ව සිටියදී නැවත මව් කුසට පිවිසිය හැක්කේ කෙසේ ද යන්නයි.

ඒ අනුව ජේසුස් වහන්සේ විස්තර කළ ඉගැන්වීම අපි දැන් අවබෝධ කර ගනිමු.

❖ **යමකු නැවත නූපන්නොත්** යන්න ප්‍රකාශ කිරීමෙන්,

ගැඹුරු ආත්මික සත්‍යතාවක් ජේසුස් වහන්සේ සරල ලෙස පැහැදිලි කළ බව පෙනේ. නැවත ඉපදීමක් යනුවෙන් ජේසුස් වහන්සේ අදහස් කරන්නේ මේ ලෝකයේ දෙවැනි වරට ඉපදීමක් නොවේ.

මෙලොවට බිහිවන මිනිසා පාපයට බර ව ලොව තුළ ජීවත් වේ. මෙම පාපයෙන් නිදහස් වීමට නම් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ ලෙස අලුත් ජීවිතයකට ඇතුළු විය යුතු වේ. (ජොහාන් 3:5)

❖ **දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගැනීමට නො හැකි ය** යන්නෙන් අදහස් වන්නේ,

පාපයට වහල් වී සිටින මිනිසා දේව සම්බන්ධතාවයෙන් ඈත් වේ. බොහෝ විට ප්‍රතික්ෂේප කරයි. එවිට මිනිසාට අත්වන්නේ විනාශය යි. නමුත් සැබෑ ලෙස අලුත් උත්පාදනයකට ජීවිත අභ්‍යන්තර වෙනසකින් ක්‍රිස්තුන් වහන්සේට ප්‍රේම කරමින් උන් වහන්සේ සමග සම්බන්ධ වන විට ඔහු/ඇය මෙලොව දී ම දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ උරුමකම ලබා ගනියි.

ජේසුස් වහන්සේ නිකදේමුස්ට පැවසූ **"නැවත ඉපදීම"** නම් මෙයයි. ජේසුස් වහන්සේ මෙහි දී ප්‍රකාශ කරන්නේ ආත්මයාණන්ගේ උපකාරීත්වය ඇතිව ජීවිත හැරීමක් තුළින් අප අලුත් ජීවිතයක් හෙවත් අලුත් ඉපදීමක් ලැබිය යුතු බවයි. මෙම ජීවිත හැරීම ජේසුස් වහන්සේ කෙරෙහි අදහා ගැනීම මත පදනම් ව සිදුවන බව වටහාගත යුතුය.

# ජේසුස්වහන්සේ හා සමාරිය ස්ත්‍රිය

කියවා බලමු.

**ශු. ජොහාන් 4: 7-10**

ජොහාන් සුභාරංචිය අපට ඉදිරිපත් කරන ජේසුස් වහන්සේ සමග සංවාදයට ඇතුළු වූ තවත් වැදගත් චරිතයක් නම් සමාරියේ ස්ත්‍රිය යි.

ජේසුස් වහන්සේ හා සමාරියේ ස්ත්‍රිය අතර ඇතිවුණු සාකච්ඡාවෙන් ඉස්මතු වන කරුණු අපි විමසා බලමු.



ජේසුස් වහන්සේ -

**"මට වතුර ටිකක් දෙන්න"**
**(ශු. ජොහාන් 4:7)**

සමාරියේ ස්ත්‍රිය --

**"ජුදෙව්වෙකු වන ඔබ සමාරියේ ස්ත්‍රියක වන මගෙන් බොන්නට ඉල්ලන්නේ කෙසේ ද?**
**(ශු. ජොහාන් 4:9)**

සාමාන්‍යයෙන් ජුදෙව්වන් හා සමාරියන් අතර කිසි ම සම්බන්ධතාවක් කිසි ලෙසකින්වත් සිදු නොවුණි. එවැන්නක් තිබියදී ම ජේසුස් වහන්සේ ජුදෙව්වෙකු ලෙස සමාරිය ස්ත්‍රියගෙන් වතුර ඉල්ලීම ඇය මවිතයට පත් කළ කරුණක් වීම ස්වභාවිකය. මෙහිදී සැලකිය යුතු විශේෂත්වය වන්නේ,

- ජුදෙව් ජාතිකයෙකු ලෙස ජේසුස් වහන්සේ සමාරිය ජාතිකයෙකුට කථා කිරීම ය.
- ජුදෙව් පිරිමියෙකු ලෙස සමාරිය කාන්තාවකට කථා කිරීම ය.

ජේසුස් වහන්සේ මෙහි දී ක්‍රියා කළේ දෙවියන් වහන්සේගේ ප්‍රේමය ජුදෙව්වන්ට පමණක් ලබා දෙන ප්‍රේමයක් නොවන බව පෙන්වීමටයි. එමෙන්ම සමාජයෙන් කාන්තාවන් කොන් කරන වටපිටාවක දී වුවද ඇයට දයානුකම්පාව දැක්වීමෙන් මනුෂ්‍යයින්ගේ කුහක කම දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව දැක්වීමට යි.

ජේසුස් වහන්සේ සමාරීය ජාතික කාන්තාවකගෙන් වතුර ඉල්ලීමෙන් සමාජය තුළ බල පවත්නා අනිසි වෛරය, දේව රාජ්‍යයේ පදනම වන ප්‍රේමයෙන් බිඳලිය හැකි බව පෙන්වා දුන් සේක. ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රේමය, ජාතිකත්වය වර්ගවාදය අබිබවා ක්‍රියාත්මක වන ප්‍රේමයක් බව මින් අපට පැහැදිලි වෙයි.

එදා සමාජයේ පැවති වර්ගවාදී ආකල්ප නිසා වතුර ඉල්ලීම සමාරියේ ස්ත්‍රියට ප්‍රශ්නයක් වූ බව පෙනේ. සමාජය තුළ පැවති මෙවැනි වටපිටාවක දී වුව ද ජේසුස් වහන්සේ මෙම අන්‍ය ජාතික කාන්තාවට **දෙවියන් වහන්සේ ලබා දෙන සදාතන ජීවනය** හිමි බව ප්‍රකාශ කළ සේක. මෙහිදී උන්වහන්සේ "ඔබ කථා කරන පුද්ගලයා කව්ද කියා ඔබ හරියට දන්නේ නම්, ඔහුට ජීවන ජලය දෙන්නට හැකි බව" පැවසූ සේක.

මෙම ප්‍රකාශනය සම්බන්ධව පහත කරුණු ගෙන හැර පෑ හැකි ය.

1. මෙසියස් වහන්සේ වන තමන් වහන්සේගේ පැමිණීම සැබෑ ලෙස අදහන ප්‍රේමකරන සැමට උන්වහන්සේ කෙරේ පිපාසාවක් ඇතිවීම,

2. එය විස්තර කිරීමට උන්වහන්සේ ජලය පිළිබඳ මිනිස් අවශ්‍යතාව යොදා ගනිමින් ආත්මික පිපාසාව හෙළි කිරීම.

3. මිනිසාගේ සදාතනික පැවැත්ම වන්නේ ජේසුස් වහන්සේ නැමති ජීවන ජලය යි. එයට ඇති පිපාසාව තුළ දේව රාජ්‍යයේ උරුමය ලබා ගත හැකි බවයි.

ක්‍රිස්තුස් වහන්සේ හා සමග සම්බන්ධ වීමට අප තුළ ඇති පිපාසාව, අපගේ ජීවිත ආකල්ප වෙනස් වීම කෙරේ බලපානු ලැබේ. එය පහත බයිබල් පාඨයෙන් තේරුම් ගනිමු.

***ක්‍රිස්තුස්වහන්සේට අයිති වීමෙන් ඔබට යම් ශක්තියක් තිබේ ද?***
***ප්‍රේමයෙහි යම් අස්වැසිල්ලක් තිබේ ද?***
***ආත්මයාණන්වහන්සේ සමග යම් සහභාගීකමක් තිබේ ද?***
***එකිනෙකා කෙරෙහි ආදරයක් හා දයාබර කමක් තිබේ ද?***

**පිලිප්පි 2:1**

එසේ ඇතිවන ආකල්ප වෙනස සියලු පෞද්ගලික අභිමතාර්ථ අබිබවන ක්‍රිස්තුන් වහන්සේ තුළ පවතින ආකල්ප වෙනසක් විය යුතු ය. එය නිකදේමුස් සහ සමාරියේ ස්ත්‍රිය සමග ජේසුස් වහන්සේ පැවැත්වූ සංවාද තුළින් වඩාත් පැහැදිලි වෙයි. මෙය පහත බයිබල් පාඨයෙන් ද ඔබට පැහැදිලි වනු ඇත.

***එසේ නම් ඔබ එක සමාන චේතනා ඇතිව,***
***එක ම ප්‍රේමයෙන් බැඳී එක ම අරමුණකින් එක්සිත්ව සිටීමෙන්***
***මාගේ ප්‍රීතිය සම්පූර්ණ කරන්න.***
***පක්ෂවාදී කමින්වත් පුහු මානයෙන්වත් කිසිත් නොකරන්න.***
***එකිනෙකා තම තමාට වඩා අන් අය උතුම් යැයි යටහත් කමින් සිතන්න.***
***සැම දෙන තම තමාගේ යහපත පමණක් නොසොයා***
***අනුන්ගේ යහපත ගැනද සලකන්න.***
***ක්‍රිස්තුස් ජේසුස්වහන්සේ තුළ පැවති ජීවිතාකල්පය ම ඔබ තුළ පවතීවා.***
**පිලිප්පි 2:2-4**

එයාකාරයෙන්, ක්‍රිස්තුස් වහන්සේ සමග පෞද්ගලික සම්බන්ධතාවකින් බද්ධ වන අපගේ ජීවිත, ආලෝකය දෙන තාරකා මෙන් බැබළිය යුතු බව අපට පෙන්වා දෙයි.

## ....අඳුරු ලෝකයක දීප්තිමත් තාරකාවක් මෙන් බබළන්නහු ය ...
## පිලිප්පි 2:16

මින් අදහස් වන්නේ තාරකාවකින් දිස්වන කුඩා එළිය වුව ද, අන්ධකාරයේ දී අගනා ආලෝකයක් බවයි. දෙවියන්වහන්සේගේ ආලෝකයෙන් ආලෝකමත් වී එලෙස ලෝකය තුළ එළිය දෙන තාරකාවක් වීමට ඔබත් උත්සාහ කරන්න.

**ක්‍රියාකාරකම**

1. "තාරකාවකින් දිස්වන කුඩා එළිය වුවද අන්ධකාරයෙහි දී අගනා ආලෝකයක් වෙයි" යන වදනෙහි අර්ථය ඔබගේ වචනයෙන් ලියා දක්වන්න.

2. ක්‍රිස්තුන් වහන්සේ හා සමග සම්බන්ධ වීමට ඔබ තුළ වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග 5 ක් ලියන්න.

# 18 ක්‍රිස්තුන් වහන්සේට අයත් අප

**දෙවියන් වහන්සේ අපේක්ෂා කරන්නේ මනා ජීවිත පැවැත්මකින් යුත් යහපත් සමාජ රටාවකි. එවන් සමාජයක පැවැත්ම උදෙසා පවුලක ක්‍රියාකාරීත්වය කෙලෙස විය යුතුද යන්න අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**උත්පත්ති 2:18-25, කොලොස්සි 3:12-17, 3:18-21, එපීස 5:21-6:4, ශු. මතෙව් 25:31-46, තීතස් 3:1-2, ජාකොබ් 2:1-4,**

සමාජයක් යනු මිනිස් වර්ගයාගෙන් සැදුම් ලද්දකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වෙසෙන අපි එම සමාජයේ පුරවැසියෝ වෙමු.

සෑම කෙනකු ම අනිවාර්යයෙන් අයත් වන ප්‍රාථමික සමාජ ඒකකය වන්නේ **පවුල යි.**

ලෝකය මැවීමේ දී සියල්ල යහපත් ලෙස නිම කළ දෙවි සමිඳුන් වහන්සේ ඒවා යහපත් ලෙසම පවත්වාගෙන යාම මනුෂ්‍යයාගෙන් අපේක්ෂා කළ සේක. එබැවින් සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීම ආරම්භ වන්නේ අපගේ පවුල නමැති ඒකකයෙන් බව අවබෝධ කරගැනීම වැදගත් වේ.

**පවුලේ නිර්මාතෘ දෙවිපියාණන් වහන්සේ ය.**

**කියවා බලමු.**

**උත්පත්ති 2:18-25**

දෙවි සමිඳාණන් වහන්සේ අහස පොළොව හා එහි ඇති සියල්ලත් මැවූ සේක. දූවිල්ලෙන් මනුෂ්‍යයා සාදා ඔහුගේ නාස් පුඩුවලට ජීවනයේ හුස්ම හෙළා මනුෂ්‍යා ජීවමාන කෙනකු කළ සේක. අනතුරු ව "මනුෂ්‍යා තනිව සිටීම හොඳ නැත. ඔහුට සුදුසු සහකාරියක් මවා දෙමි" යැයි පවසා මිනිසාගේ ඉල ඇටවලින් එකක් ගෙන ඔහුට ස්ත්‍රියක් මවා දුන් සේක. ඇයට ඒව (ජීවමාන සියල්ලන්ගේ මාතාව) යන නම ආදම් (මිනිසා) විසින් තබන ලදී.

මේ අනුව බලන කල ආදම් සහ ඒව දේව මැවිල්ලේ උසස් ම නිර්මාණය යි. ඒ නිසා මිනිසුන් අතර එකිනෙකා සමග වෙන් කළ නොහැකි මහත් බැඳීමක්, සබඳතාවක් පවතී.

මින් අපට පැහැදිලි වන්නේ මිනිසා සාමූහික ජීවිතයක් ගතකිරීම දෙවියන් වහන්සේගේ කැමැත්ත බවයි.

මේ දෙදෙනා වෙතින් මිනිස් වර්ගයාගේ වර්ධනය වීම සිදුවන අතර, ඒ තුළින් සමාජය බිහිවෙන බව පැහැදිලි වෙයි.

මුළු මහත් ලොවම එකම සමාජයක් ලෙස සලකනු ලබද්දී පවුල නමැති ඒකකය ලොව තුළ නිර්මාණය වී ඇති කුඩා ම සමාජ සංස්ථාව ලෙස අපි හඳුනා ගතිමු. අප එක් එක් පුද්ගලයාගේ යහපැවැත්ම උදෙසාත් සමස්ත සමාජයේ යහපැවැත්ම උදෙසාත් ශු. බයිබලය තුළින් අප වෙත ගෙන එන දේව රාජ්‍යයේ **වටිනාකම්** එමට ය. එම වටිනාකම් අන්‍යෝන්‍ය බැඳීමකින් යුතුව, **යුතුකම් හා වගකීම්** ලෙස ඉටු කිරීම අපෙන් බලාපොරොත්තු වේ.

## කිතුනු පවුලේ යුතුකම් හා වගකීම්.

**භාර්යාව හා ස්වාමිපුරුෂයාගේ වගකීම.** - එපීස 5 ː 21--33

- ක්‍රිස්තුන් වහන්සේට ඇති ගෞරවය නිසා එකිනෙකාට යටත් වන්න.
- භාර්යාවෙනි, ඔබ සමිඳාණන් වහන්සේට මෙන් ස්වාමිපුරුෂයාට යටත් ව සිටින්න.
- පුරුෂයෙනි, ක්‍රිස්තුන් වහන්සේ සභාවට ප්‍රේම කොට සභාව වෙනුවෙන් දිවි පුද කළා මෙන් ඔබත් ඔබගේ භාර්යාවට ප්‍රේම කරන්න.
- පුරුෂයන් විසින් සිය භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතු ය.

දෙවියන් වහන්සේ පුරුෂයා හා ස්ත්‍රිය වශයෙන් මනුෂ්‍යා මැවූ සේක.උන්වහන්සේගේ මැවිල්ල තුළ පුරුෂයාට හා ස්ත්‍රියට හිමි වන්නේ සම තත්ත්වයකි. දෙවියන් වහන්සේ පුරුෂයාට දී ඇත්තේ සහකාරියකි. දෙවියන් වහන්සේගේ මැවිල්ල වන මනුෂ්‍යා ප්‍රේමයෙන් යුතුව ජීවත් වීම උන්වහන්සේගේ බලාපොරොත්තුව වේ. එබැවින් පුරුෂයා තම භාර්යාවට තම ශරීරයට මෙන් ප්‍රේම කළ යුතු වේ. එනම් තමා තමාට කෙතරම් ආදරය කරන්නේ ද, ගෞරව ලැබීමට කැමැත්තේ ද, රැක ගැනීමට කැමැත්තේ ද තම සහකාරිය වන භාර්යාව පිළිබඳ ව ද එසේ ම විය යුතුය.

තව ද දෙදෙනා ම එකිනෙකාට යටත් ව ජීවත් විය යුතු වේ. මෙහි යටත් වීම යනු යටත් කර ගැනීම නොව ප්‍රේමයෙන් සමානාත්මතාවෙන් හා ගෞරවයෙන් යුතුව පිළිගැනීම වේ. එකිනෙකාගේ අවශ්‍යතා සපුරාලමින් ජීවිතවලට ගෞරවයක් හිමිවන ලෙස කටයුතු කළ යුතු වේ.

භාර්යාව හා ස්වාමි පුරුෂයා එකිනෙකා කෙරෙහි දක්වන ප්‍රේමය ක්‍රිස්තුන් වහන්සේගේ සභාවට දක්වන ප්‍රේමය මෙන් විය යුතු බව, එපීස යැවුම් පත්‍රයේ සඳහන් වෙයි. සභාව තුළ කොපමණ ප්‍රශ්න උද්ගත වුවත් ක්‍රිස්තුන් වහන්සේ සභාව එනම් උන්වහන්සේ අදහා ගන්නන්ට දක්වන ප්‍රේමයේ අඩුවක් නැත. ඒ ආදර්ශය පවුල තුළ ඇතිවිය යුතු බව දේව වචනයෙන් අපට පැහැදිලි වෙයි.

**දරුවන්ගේ වගකීම. -** එපීස 6 ඃ 1--3

- ❖ ඔබේ දෙමාපියන්ට සමිඳාණන් වහන්සේ තුළ කීකරු වන්න. එය ඔබගේ යුතුකම ය.

- ❖ ඔබේ පියාටත් මවටත් ගෞරව කරන්න.

දෙවියන් වහන්සේ විසින් පවුලට දෙන ලද තිළිණය වන්නේ දරුවන් ය. එබැවින් දරුවන් හදා වඩා ගැනීමේ දී ඔවුන්ට ආදරය කරමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන්නට මෙන් ම විනයානුකූල ව හැඩ ගැස්වීම දෙමාපියන් සතු වගකීමකි. එමෙන් ම දරුවන් ද දෙමාපියන්ගේ වචනයට අවනත ව කටයුතු කරමින් කීකරු වීමත් මවට හා පියාට ගෞරව දැක්වීමත් කළ යුතු වේ. දෙමාපියන්ට කීකරු හා ගෞරවයෙන් යුතුව ක්‍රියා කරන දරුවා සමාජයට ද යහපත් පුරවැසියෙකි.

පවුලක් ලෙස වර්ධනය වීමේ දී, දරුවන් තම සහෝදර සහෝදරියන් ගැන සැලකිලිමත් වීම, රැකබලා ගැනීම එකිනෙකාගේ අවශ්‍යතාවන් දැන හඳුනා ගැනීම, පවුලට විශ්වාසවන්ත ව සිටීම අවශ්‍ය ය. පවුලක සමගිය වෙනුවෙන් ක්‍රියා කරන සහෝදර සහෝදරියන් සිටීම පවුලට මහත් ආශිර්වාදයකි.

## සමාජය කෙරෙහි අපගේ යුතුකම් හා වගකීම්

**කිතුනුවකු තුළ තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති** - කොලොස්සි 3ඃ12--17

- ❖ සමිඳාණන් වහන්සේ ඔබට කමා කළා මෙන් ඔබත් එකිනෙකාට කමා කරන්න.

- ❖ ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත් ඒ සියල්ල ස්වාමින් වහන්ස්ගේ නාමයෙන් කරමින් දෙවියන් වහන්සේට ස්තුති කරන්න.

- ❖ මේ සියල්ලට ඉහළින් ජීවිතයේ සියළු කාරණා ඒකරාශි කරන **ප්‍රේමයෙන්** සැරසෙන්න.

කිතුනුවන් ලෙස සමාජ ජීවිතයේ දී අපගේ ක්‍රියාවන් ස්වාමින් වහන්සේට ප්‍රසන්න ලෙසින් සිදු විය යුතු වේ. අපගේ වචන එකිනෙකාගේ ජීවිත ශක්තිමත් කිරීමට මිස, එකිනෙකාගේ ජීවිත බිඳ දැමීමට හේතු නො විය යුතු ය. එබැවින් වචනයෙන් හෝ ක්‍රියාවෙන් කුමක් කරතත් එය දේව ගෞරවය හා මහිමය හිමි වන පරිදි මෙන්ම අන්‍යයන්ගේ යහපත හා වර්ධනය සැලසෙන පරිදි විය යුතු වේ.

තව ද අප මුහුණ දෙන ගැටලු අවස්ථාවන්වල දී ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ. ප්‍රේමයෙන් යුතුව ක්‍රියා කිරීමේ දී එකිනෙකා වෙනුවෙන් ඉවසීමෙන් යුතුව ක්‍රියා කිරීමත්, එකිනෙකාගේ වරදේ දී කමාව දීමත්, තමා අතින් වරදක් වූ විට කමාව යැදීමත්, කරුණාව පෙරදැරි ව ජීවත් වීමත් සිදු විය යුතු වේ.

**කියවා බලමු.**

**මතෙව් 25:31-46**

ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ පරිදි උන්වහන්සේ අදහන්නන් විසින් සමාජය තුළ ඉටු කළ යුතු, දේව රාජ්‍යයේ ගුණාංග කිහිපයක් මතෙව්තුමා සඳහන් කරයි. ඒ අනුව කිතුනු දරුවකු වශයෙන් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග ගැඹුරු සම්බන්ධතාවක් ගොඩ නගා ගැනීම සඳහා පවුල හා සමාජය තුළ වටිනාකම් ඉස්මතු කිරීම අපේ යුතුකමකි. එය පහත පරිදි දැක්විය හැකි ය.

සාගිනි ව සිටියෙමි - ඔබ මට කන්න දුන්නහු ය

පිපාසා වී සිටියෙමි - ඔබ මට බොන්න දුන්නහු ය

ආගන්තුක ව සිටියෙමි - ඔබ මා ගෙදරට පිළිගත්තහු ය

වස්ත්‍ර නැතිව සිටියෙමි - ඔබ මට වස්ත්‍ර දුන්නහු ය

රෝගාතුර ව සිටියෙමි - ඔබ මා බලාගත්තහු ය

හිර ගෙදර සිටියෙමි - ඔබ මා බලන්නට ආවාහු ය

- කිතුනු අපගේ ජීවිතවල අරමුණ දේව රාජ්‍යය උරුම කර ගැනීම යි. දේව රාජ්‍යය උරුමකර ගැනීමට ස්වාමින් වහන්සේ වදාළේ අප විසින් අන් අය කෙරෙහි (සමාජය කෙරෙහි) පවත්වා ගත යුතු ප්‍රේමය යි.

- එබැවින් කිතුනුවාගේ ප්‍රායෝගික ජීවිතය ජේසුස් වහන්සේ හා බද්ධ වීමෙන් සමාජය කෙරෙහි සංවේදී වන ජීවිත රටාවකින් සමන්විත විය යුතු වේ.

කිතුනු අප, ස්වාමින් වහන්සේ ඉදිරියේ විනිශ්චයට ලක්වන දිනක් උදා වේ. එදිනට අප සූදානම් විය යුතු වේ. අප අන් අයගේ ජීවිතවල යහපත් පැවැත්මට යමක් කරන්නේ ද එය ක්‍රිස්තුන් වහන්සේට ඉටු කරන ලද සේවයකි. එබැවින් ඉතා කුඩා තැනැත්තෙකුට වුව ද යමක් අප ඉටු කරන්නේ ද එය සග සම්පත් හිමි කර ගැනීමට පිටිවහලක් වනු ඇත.

තීතස් 3:1--2, ජාකොබ් 2: 1--4 හා යන බයිබල් පාඨ අප විමර්ශනය කරන විට සමාජය තුළ ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරමින් ජීවත් වීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය පැහැදිලි කරයි.

- නිලධාරීන්ට හා ආණ්ඩු බලය ඇත්තන්ට සමාජයේ අභිවෘද්ධිය උදෙසා ක්‍රියා කිරීමේදී අවනත වීම.

- සියලු යහපත් වැඩට සූදානම් ව සිටීම.

- කිසිවකු ගැන අගුණ නො කීම හා කලහකාරී නො වීම.

- කාරුණිකව ආචාරශීලී ව සිටීම.

- දුප්පත් පොහොසත් බව හෝ සමාජයේ පවතින අනෙකුත් වෙනස්කම් නොසලකා, තරාතිරම් නො බලමින් කටයුතු කිරීම.

අපගේ ජීවිත ගමනේ දී පවුල තුළ දි මෙන් ම සමාජය තුළ දී ද ක්‍රියාකාරී විය යුතු ආකාරය අපි හැදෑරුවෙමු. එලෙස ක්‍රියාකාරී වන ඕනෑ ම ක්‍රියාවලියක දී නායකත්වය ගෙන කටයුතු කරන පිරිසක් ඉස්මතු වේ. එලෙස නායකත්වය ගෙන කටයුතු කරන අය සමග සහයෝගයෙන් කටයුතු කිරීමත් සියලු යහපත් ක්‍රියාවන්හී දි තම සහය ලබා දීමත් කිතුනුවකුගේ යුතුකම වේ.

එලෙස ක්‍රියා කරන විට මතුවන ගැටලු අවස්ථාවන්හි දී එකිනෙකා විවේචනය කිරීම, කලහකාරී වීම වෙනුවට කාරුණිකව හා ආචාරශීලීව කටයුතු කිරීම ඉතා වැදගත් වේ. (උදා:- ක්‍රීඩාවක දී හෝ තරගයක දී ලැබෙන තීන්දු තීරණ පිළිගැනීමට පුරුදු ව සිටීම.)

## සිතා බලමු

වර්තමාන සමාජය දෙස බලන කල පුද්ගලයාගේ, පවුල් සංස්ථාවේ, සමස්ත සමාජයේ පිරිහීමක් සිදුවෙමින් පවතින බව පෙනී යයි. එසේ වීමට හේතු වී ඇත්තේ මිනිසා දේව කැමැත්තට පිටුපා ක්‍රියා කිරීමයි.

මම, මගේ, මට, යන ආත්මාර්ථකාමී බව නොව අප, අපගේ, අපට යන පරාර්ථකාමී බව පොදු බව, අප ජීවිතවල ගොඩනගා ගත යුතු වේ. තවද අපගේ ජීවිත වෙනස් කර හැඩ ගස්වා ගැනීමෙන් තමාටත්, තම පවුලටත්, සමස්ත සමාජයටත් යහපතක් ඉටු කිරීමට සිතා ගනිමු.

**ක්‍රියාකාරකම**

1. කොලොස්සි 3: 12---17 දක්වා ඇති කිතුනු ජීවිත ප්‍රතිපත්ති 3ක් පිළිබඳ කරුණු ගොනු කරන්න.

2. මතෙව් 25: 31--46 හි ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ කරුණු තුළින් අප සමාජයේ ක්‍රියා කළ යුතු ආකාර 3 ක් පිළිබඳ විස්තර කරන්න.

# 19 සහජීවනයෙන් ගොඩනැගෙමු

**කොරින්ති හා එපීසවරුන්ට යවන ලද හසුන්වල සඳහන් ව ඇති දේව රාජ්‍යයේ වටිනාකම් පෙරදැරි කරගෙන සහජීවනයෙන් යුතු සමාජයක් ගොඩනැගීමට දායක වීම පිළිබඳ ව විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

එපීස 4:11, 12, 16, 2 කොරින්ති 6:4-7, 16, 7:1

දෙවියන් වහන්සේ කිතුනුවන් ලෙස අප කැඳවා ඇත්තේ, දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ක්‍රියාකිරීමටය. ඒ සඳහා උන්වහන්සේ අපට පෙන්වා දී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ ගමන් කළ දුෂ්කර මාර්ගය මෙන් අපගේ ජීවිත මාර්ග ද දුෂ්කර විය හැකි බවයි. මෙම දුෂ්කර මාර්ගයේ ගමන් කරන විට අප දරන ආකල්ප හා අදහස් සමාජයේ ආකල්ප හා අදහස් සමග නොගැළපෙන අවස්ථා ඇතිවිය හැකිය.

**එසේ නොව, දුක් පීඩා අගහිඟකම් ද විපත්ති ද**
**මහත් ඉවසීමකින් විඳ දරා**
**අපි දෙවියන් වහන්සේගේ සේවකයන් වශයෙන් ඔබට ඒත්තු ගන්වමු.**
**අපි බොහෝ දේ විඳ දරා ගත්තෙමු.**
**පහර ලැබුවෙමු. සිරගත වීමු.**
**අඩන්තේට්ටම් කරනු ලැබුවෙමු.**
**විවේකයක්වත් නින්දක්වත් කෑමක්වත් නැතිව සිටියෙමු.**
**2 කොරින්ති 6:4-5**

අප එකිනෙකාට විවිධ දීමනා ලැබී ඇත. (එපීස 4:11) මෙම දීමනා සභාව තුළ විවිධ සේවාවන් ලෙස හඳුනා ගන්නට පුළුවන. තවද දේව රාජ්‍යයේ ගුණාංග ක්‍රියාත්මක කරන කිතුනු ප්‍රජාවක් සභාවක් ලෙසට අප, සමාජය සමග සම්බන්ධ වී සිටිමු. මෙහි දී අප තේරුම් ගත යුතු කරුණක් වන්නේ දෙවියන් වහන්සේ අපට දීමනා ලබා දී ඇත්තේ අපගේ පටු අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා නොවන බව යි. එහෙත් ඒවා ලැබී ඇත්තේ ක්‍රිස්තු ශරීරයට බද්ධව දේව අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා බව පැහැදිලි යි. ඒ තුළින් අපි ක්‍රිස්තු ශරීරය වර්ධනය කරමු. (එපීස 4:16)

**සහජීවනයෙන් දිවි ගෙවීමේ දී අප මුහුණ දෙන අභියෝග**

**කියවා බලමු.**

**2 කොරින්ති 6:16, 7:1**

අප ජීවත්වන සමාජයීය ප්‍රජාව විවිධ ජාතීන්ගෙන් හා ආගමිකයින්ගෙන් සමන්විත වන බව තේරුම් ගැනීම වැදගත් ය. එවැනි පරිසරයක දී කිතුනුවන් වන අප සැමවිට ම කල්පනාකාරී ව ජීවත් විය යුතු වේ. අපගේ ක්‍රියාකලාප අන් අය ප්‍රතික්ෂේප කරන, හෙළා දකින සහ ඔවුන්ගේ මතවලට ගරු නොකරන පරිසරයක් නිර්මාණය කර ගැනීමෙන් අප වැළකිය යුතු වේ. මිශ්‍ර සමාජයක රටාව පහත පරිදි අපට හඳුනාගත හැකි ය.

- ❖ මිශ්‍ර විවාහ තුළින් බිහි වන පවුල් ඒකක. (ජාති හා ආගම්)
- ❖ සමාජයීය කටයුතුවල දී කිතුනු හා විවිධ ආගම් අදහන අයට එක් වී කටයුතු කිරීමට සිදුවීම.

  (මරණාධාර සමිති, සුභසාධක සමිති, සමථ මණ්ඩල)
- ❖ සමාජයීය අසාධාරණකම්වල දී එකතුවී  ක්‍රියා කරන සංවිධානවලට ඇතුළත් වීම.

  (රැකියා ස්ථාන)
- ❖ විවිධ ආගමික හමුවීම්වල දී සහභාගී වන්නට හා උදව් කිරීමට සිදු වීම.

  (උදාඃ මංගල්‍ය, අවමංගල්‍ය අවස්ථාවන්)
- ❖ විවිධ ආගමිකයන්ගෙන් ලබන විශේෂ ආරාධනා අවස්ථාවන්

  (සංස්කෘතිකමය හා ආගමික උත්සව)

ඒ සමග ම පාවුලුතුමා ඉදිරිපත් කරන මේ අදහස් කිහිපයට ද දැන් අපි යොමු වෙමු.

- ❖ අපි ජීවමාන දෙවියන් වහන්සේගේ මන්දිර වෙමු. (2 කොරින්ති 6:16)
- ❖ සිත කය කෙලෙසන සියලු දෙයින් වැළකී සිටින්න. (2 කොරින්ති 7:1)
- ❖ දේව ගරුබිය ඇතිව ශුද්ධවන්තකමින් පරිපූර්ණ වන්න. (2 කොරින්ති 7:1)

පාවුලුතුමා ඉදිරිපත් කරන මෙම කාරණා සලකා බැලීමේ දී,

බහු ආගමික, බහු වාර්ගික මිශ්‍ර ප්‍රජාවක් තුළ ජීවත් වීමේ දී සෑම දෙයකට ම එකඟ වීමක් තිබිය නොහැකි ය.

සියලු විශ්වාසවල පවා සමානත්වයක් තිබිය නො හැකි ය.

අප විශ්වාස කරන දෙය අන් අය නො පිළිගන්නා තත්ත්වයන් ද තිබිය හැකි ය.

අප ලබන ආධ්‍යාත්මික දැනුම ක්‍රියාකාරීත්වයට පත්කළ විට සමහර අවස්ථාවන්වල දී අපගේ අදහස්වල නොගැළපීමක් ද ඇතිවිය හැකි ය.

මෙවැනි තත්ත්වයක දී අපගේ ඇදහිල්ල ආරක්ෂා කර ගනිමින් ක්‍රියා කිරීමට වගකීමක් අපට තිබේ. දේව රාජ්‍යයේ ගුණාංග, වටිනාකම් අපගේ ජීවිතවලින් සමාජය තුළ ඉස්මතු කිරීමේ වගකීමද අපට තිබේ. එවන් කාර්යයක නියැලීම සෑම විටම කටුක අත්දැකීම්වලට ලක්වන  මාවතක්  විය  හැකිය. එසේ වුවත් සහජීවන වටිනාකම් ගැන සිතා සමාජයට අපෙන් විය යුතු සේවය නොපිරිහෙලා ඉටු කිරීමට අප උනන්දු විය යුතු ය.

නිදසුනක් ලෙස තෙරේසා මව්තුමියගේ මෙහෙවර අපට අගය කළ හැකිය. දේව රාජ්‍යයේ උතුම් ගුණාංගයක් වන දේව ප්‍රේමය සියලු ආගමික හා වාර්ගික සීමාවන් අබිබවමින් සමාජය තුළ ගොඩනැංවීමට ඇය සමත් විය. එවන් සහජීවන ක්‍රියාවලියකට ඇතුළු වෙමින් ඇය දුන් උතුම් ආදර්ශයට අනුව දිවි ගෙවීමට අපි දු වෙහෙසෙමු.

මෙවන් ගුණාංග සහිතව එකිනෙකා පිළිගනිමින් සමාජයේ යහපත් සම්බන්ධතාවන් වර්ධනය කිරීමට අපි ක්‍රියාකාරී වෙමු.

**ක්‍රියාකාරකම**

1. ඔබට ලැබී ඇති දීමනා 3 ක් හඳුනාගෙන ඒවා දේව ගෞරවය උදෙසා ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි පහදන්න.

2. "සහජීවනයෙන් කටයුතු කරමු" යන මාතෘකාව යටතේ කිතුනු සඟරාවකට ලිපියක් ලියන්න.

# 20 ආත්මයාණන්ගෙන් දිවි මග ලබමු

**අපගේ යහපත් ක්‍රියාවන් මෙන් ම අයහපත් ක්‍රියාවන් නිසා ද සමාජයට වැඩදායී මෙන් ම සමාජයට අවැඩදායී තත්වයන් ඇතිවිය හැකිය. එබැවින් දේව වචනයට අනුව යහපත් ජීවිත පැවැත්ම හඳුනාගෙන ඒ අනුව ජීවත් විය යුතු ආකාරය පිළිබඳ ව දේව වචනය තුළින් විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**හිතෝපදේශ 23:31-33, රෝම 12:1, ගලාති 5:16-21**

දුව: ආ . . . අයියේ, අපි දැන් පවුලේ යාච්ඤාව පටන් ගන්න ලෑස්ති වුණා විතරයි. ඔයා හොඳ වෙලාවට ආවේ.

අම්මා: පුතා, මොකද සමහර දවස්වලට ගෙදර එන්න පරක්කු වෙන්නේ? .

පුතා: මට මේ දවස්වල වැඩපළේ වැඩ වැඩියි අම්මා. ඒකයි සමහර දවස්වලට පරක්කු වෙන්නේ.

දුව: බොරු අම්මේ. මෙයා වැඩ ඇරිලා යාළුවො එක්ක විනෝද සවාරි යනවා කියලා මට ආරංචි වුණා.

පුතා: මෙයා මේ කාගෙද බොරුවක් අහලා රැවටිලා. අම්මේ මම කිව්වේ ඇත්ත.

තාත්තා: මමත් ටිකක් කල්පනාවෙන් හිටියේ. මේ දවස්වල පුතා ගෙදර එන්න පරක්කු වෙනවා. මමත් පුතාගෙන් අහන්න හිටියේ. පුතා වෙනදට හයහමාර වෙනකොට ගෙදර එනවා. දැන් ගෙදර එන්නේ අපි නිදාගත්තටත් පස්සේ. වෙනද වගේ නෙමෙයි. රෑ වෙලා ඇවිල්ලා කිසිම කතා බහක් නැතුව කාලා නිදාගන්නවා.

අම්මා: ඔව් . . . මෙයා දැන් සමහර දවස්වලට පවුලේ යාච්ඤාවට එන එකත් මග හරින්න හදනවා.

දුව: ඔව් . . . ඔව් . . . අයියා වෙනදා වාගේ නොවෙයි දැන්. ගෙදර ඉන්නවත් අඩුයි අපිත් එක්ක එකට කෑම කන්නෙත් නැහැ.

තාත්තා: - පුතා, මට තේරෙනවා පුතා දැන් යන විදිහ ඒ තරං හොඳ නෑ කියලා. අම්මයි මම යි මේ ගැන පුතා එක්ක කථා කරන්න තමයි හිටියේ.

අම්මා: - ඔව් පුතා. දන්නවනේ, අපි ක්‍රිස්තියානි අය හැටියට බොහොම හොඳින් ජීවත් වෙන්න උත්සාහ කරන බව. ඒ හොඳ ගතිගුණ අපේ ජීවිතවලින් නැති කරගන්න බැහැ. පුතා ඕනෑවට වඩා යාළුවන්ට ළංවෙලා බව මටත් ආරංචි වුණා.

පුතා: - මම එහෙම නරක ආශ්‍රයට ගියේ නැහැ අම්මා. නංගි කියන්නේ බොරු. මට වැඩ වැඩි නිසයි පරක්කු වුණේ.

දුව: - මෙයා කරන වැරදි වහගන්න මෙයා දැන් බොරු කියන්නත් පටන් අරගෙන අම්මා.

අම්මා :- - පුතේ බොරු කීම අතහැරලා ඇත්ත කථා කරන්න පුරුදු වෙන්න. තමන් වරදක් කරනවා නම් ඒවායින් ඈත් වෙන්න උත්සාහ කරන්න.

තාත්තා: - පුතා, මට හිතෙනවා පුතා අපි කියන දෙයට ඇහුම්කන් දුන්නොත් හොඳයි කියලා. ඔයා දැන් යාළුවෝ එක්ක එකතු වෙලා වැරදි පුරුදුවලට යොමුවෙන බව ඔයාගේ හැසිරීමෙන් මට තේරෙනවා. පුතා ඒවායින් ඉතා ඉක්මනින් මිදෙන්න ඕනේ.

දුව: - තාත්තේ ගිය ඉරිදා පල්ලියේ දේවගැතිතුමා දේශනය සඳහා යොදාගත්ත බයිබල් කොටස මෙයාට හොඳට ගැළපෙනවා කියලා මට හිතෙනවා. එදා මම ඒක හොඳට හිතට ගත්තා අයියාට කියලා දෙන්න ඕනෑ කියලා හිතල ම.

එදා දේවගැතිතුමා හිතෝපදේශ විසිතුනේ තිබෙන වැදගත් කරුණු අපට කියලා දුන්නා.

තාත්තා: - දුව කියවන්න බලන්න ඒ කොටස

**කියවා බලමු.**

**හිතෝපදේශ 23:31-33**

දේවගැතිතුමා කිව්වේ බීමත්කමට, නරක මිතුරන් ඇසුරට යාම නිසා අපගේ ජීවිත විනාශ වෙනවා කියලා. මත්පැන් ළඟ පමාවන අයට දුක, කාලකණ්ණිකම, මැසිවිලි නැගීම මෙන් ම නිකරුණේ තුවාල ද ඇතිවන බව කිව්වා. ඒ වගේම ඒ අයගේ දෑස් නිතර ම රතු බවත් කීවා.

තාත්තා -: ඇත්ත පුතා ඒ ඔක්කොම කාරණා හරි. ඔයාගේ ඔය යාළුවන් ආශ්‍රයට ගිහින් බොන්ඩ පටන් ගත් නිසා ඔයාට වගේම අද අපටත් දුක ඇතිවෙලා තියෙනවා. ඒ වගේම දැන් ඔයාටත් ඒ ගැන වේදනාවක් දුකක් හැමෝගෙම ජීවිතවලට දුකක්. ඒ වගේම ඔයාගේ වෙනදා තිබුණ සැහැල්ලු බව, සතුටු බව, විනෝදකාමී බව නැතිවෙලා ගිහින් ඉබේටම ඔයාගේ ජීවිතය විනාශ වන තත්ත්වයට පත්වෙලා.

පුතා -: කවුද කිව්වේ මම බේබද්දෙක් වගේ බොනවා කියලා. මම යාළුවෝ එක්ක සමහර දවස්වලට හවසට එකතු වුණාම ටිකක් ගත්තා තමයි. නංගිට මා ගැන කව්රු හරි බොරුවක් කියලා තියෙනවා.

අම්මා: - පුතා ඔයා ටිකක් ගත්තත්, ගොඩක් ගත්තත් වරද වරද මයි. දැන් ඔයාට පෙනෙනවානේ මැසිවිලි නගන්න වෙලා තියෙන්නේ ඔයාගේ වැරදි නිසානේ. ඔයත් දැන් අපිත් එක්ක එකට එක කියන්නේ ඔය වරද නිසාම නේ, ඒ වගේම ඔය බීමත්ව ඉන්න වෙලාවක යාළුවෝ අතර ප්‍රශ්නයක් ඇති වුණොත් ඔයගොල්ලො නතර වෙන්නේ නිකරුණේ තුවාලයක් කර ගෙන ම තමා.

දුව :- - දේවගැතිතුමා කිව්වේ මත් පැන් ළඟ පමා වන්නවත්, ඒ දිහා බලන්නවත් එපා කියලා. ඒ වගේම කිව්වා මත්පැන් රතට පෙනෙන විටත්, වීදුරුවෙහි දිලිසෙන විටත්, සිනිඳු ලෙස වැක්කෙරෙන විටත් ඒ දෙස බලන්නවත් එපා කියලා. ඒ බව බයිබලයේ තියෙනවා. ඇයි අයියා ඒව ගැන කියවලා නැද්ද ?

තාත්තා--: අනෙක් අය ඔය වගේ වැරදි වැඩවලට යොමු වෙන කොට ඒවයින් ඒ අයවත් මුදවා ගන්නවා මිස ඒගොල්ලොත් ඒ වරදට යොමු වුණාම ඇතිවන විනාශය තේරුම් ගන්න පුළුවන්කමක් ඔයාට තියෙන්න ඕනේ. පුතා මමත් තරුණකමට ඒ කාලේ ඔය වගේ වැරදිවලට යොමුවෙලා, පුදුම විදියට බේරුණු කෙනෙක්.

බීමත්කමට යොමුවන කෙනාට ඒවා පෙනෙන්නේ තම ජීවිතයේ හොඳම දෙය කියලයි. ඒ වගේම යාළුවො එක්ක එකතුවෙලා විනෝද වෙන්න තිබෙන හොඳම දේ බීමත්කම කියල යි. පුතේ, බීමත්කම නිසා අන්තිමට ඉතිරි වන්නේ දුක, කාලකණ්ණිකම බව තේරුම් ගන්න. බීමත්කම නිසා ඇතිවන විනාශය ගැන දැන් කියවන කොටස පුතා ආයෙත් කියවල බලන්න.

දුවඃ - තාත්තේ හිතෝපදේශ 23ඃ 32 තිබෙන කොටස අයියට තව ටිකක් පැහැදිලි කරලා දෙන්න.

තාත්තාඃ - පුතාට දැන් තේරෙනවා නේද මත්පැන් කියන්නේ වස විස අපේ ශරීරයට ඇතුළු කර ගැනීමක් කියලා. දෙවියන් වහන්සේ අපට දී තිබෙන වටිනා ජීවිතය විනාශ කර ගැනීමක්. සර්පයෙකු මෙන් සපා කා පොළඟකු මෙන් දෂ්ඨ කරයි කියලා බයිබලයේ කියන්නේ අපේ ජීවිත කොච්චර විනාශ වෙනව ද කියන එකයි.එතකොට සිහිය විකල් කෙනෙකු වගේ තමයි වැඩ කරන්නේ. පුතාට තේරෙනවා නේද මම කියන දේ.

අම්මාඃ- - බීමත්කමෙන් මනස වියවුල් වෙනවා. කිව යුතු නොකිය යුතු දේ අසිහියෙන් දොඩවනවා. හරියට ඔළුව අවුල් වෙලා වගේ.

තාත්තාඃ - බීපු වෙලාවට මහ අමුතු පුද්ගලයකු වෙනවා. ඔයාට විවිධ විකාර දේවල් පේන්න ගන්නවා. ඔයා දන්නේ නැහැ මොනවා කරනවද කියලා. අර නංගි කලින් කියෙව්ව දේව වචනයේ කොටසේ තියෙනවා වගේ හිතුවක්කාර දේවල් වලට තමන්ගේ සිත යොමු වෙන්නේ. ඔයාට කවුරු මොනවා කළත්, කිවත් ඔයා දන්නේ නැහැ. පහර දුන්නත් දන්නේ නැහැ.

අම්මාඃ - ඒ වගේ ම තමයි ඕකට ඇබ්බැහි වුනොත් හැමදාම හොයන්නේ ඒ වැරදි දෙයම තමයි. ඉන් මිදෙනවා වෙනුවට පුතාලත් කරන්නේ ම තව තවත් හොයාගෙන යන එකයි. බීමත්කමට පුරුදු වුනොත් ඉන් මිදෙන්න හරි අමාරුයි පුතේ. ඔයා ඔය වගේ බොන්න පටන් ගන්න ඉස්සර අපි ගැනත් හිතන්න තිබුණා. ඔයාගේ ශරීරය අයිති දෙවියන් වහන්සේට නේ පුතේ? මේ බලන්න මේ බයිබල් කොටසේ තියෙන එක මම කියවන්නම්.

**සහෝදරයෙනි, දෙවියන් වහන්සේ ඉමහත් දයාවක් පෙන්වූ බැවින් ඔබගේ ශරීර දෙවියන් වහන්සේට කැප කළ උන්වහන්සේට ප්‍රසන්න වූ ජීවමාන යාගයක් කොට ඔප්පු කරන මෙන් ඔබගෙන් උදක්ම ඉල්ලමි. සැබෑ බුද්ධිමය නමස්කාරය එය වේ.**

**රෝම 12:1**

තාත්තා -:- දැන් පුතාට තේරෙනවා නේද අපි මෙච්චර ඔයාට කතා කරන්නේ ඇයි කියලා. පුතා ඔය වරද දිගටම කළොත් තව තවත් වැරදි ගණනාවකට පැටලෙන්න ගන්නවා. ඔයාට පුළුවන් දැන්ම එයින් මිදෙන්න. ඔයා වෙනදා වගේ නොවෙයි දෙවියන් වහන්සේගෙන් ඈත් වෙලා බව ඔයාට දැනෙන්නේ නැද්ද.? පුතා දෙවිඳුන්ගෙන් සමාව ඉල්ලන්න. උන්වහන්සේගෙන් කරුණාව යදින්න. පුතාට ඉන් මිදෙන්න පුළුවන්. බයිබලය කියවලා ජීවිතය අවබෝධ කරගන්න.

(පුතා කල්පනා කරමින් සිටියි. නිහඬ ව සියලු දෙයට සවන් දෙමින් සිටියි. ඔහුගේ දෑස්වලින් කඳුළු වැගිරෙයි. ඔහු ඉදිරිපිට ඇත්තේ ගලාති 5: 16--21 දක්වා බයිබලයෙන් පෙරලා ඇති වදන් ය. ඔහු තමන් කළ වැරදි ගැන අවබෝධයෙන් පසුතැවිලි වන බවක් පෙනේ.)

**ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම**

**ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ඇති ව හැසිරෙන්න. එවිට ඔබ මාංසික තෘෂ්ණාවලට වසඟ වන්නේ නැත. මන්ද, මාංසික තෘෂ්ණා ආත්මයාණන් වහන්සේට විරුද්ධ ය. දෙපක්ෂය අතර ඇති මේ විරෝධය නිසා, ඔබ කැමති දේ ඔබට කළ නො හැකි ය. එහෙත් ඔබ ආත්මයාණන් වහන්සේ විසින් මග පෙන්වනු ලබන්නහු නම් ඔබ ව්‍යවස්ථාව යටතේ නො සිටින්නහු ය. මාංසික තෘෂ්ණාවල පලවිපාක පැහැදිලි ය. එනම්, කාමමිථ්‍යාචාරය, අපවිත්‍රකම, සල්ලාලකම, රූප වැඳීම, කොඩිවින, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, යශස්කාමය, පක්ෂ භේද, ආරාවුල්, වෛරය, බීමත්කම, සුරාධූර්ත උත්සව හා එවැනි තවත් දේ ය. මෙබඳු දේ කරන්නන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි උරුමය නොලැබෙන බව මම පෙර කී ලෙස ම, දැනුත් කියමි.**

**ගලාති 5: 16-21**

සමාජයේ නපුරාගේ බලය උත්සන්න වෙමින් පවතින නිසා අපගේ ජීවිත සූක්ෂ්ම ලෙස විනාශ මුඛයට ගෙන යන බව පැහැදිලි ය. අප ආත්මයාණන් වහන්සේගේ මග පෙන්වීම ඇතිව බුද්ධිමත් ව අපගේ ක්‍රියාවෙන් දෙවියන් වහන්සේට ප්‍රසන්න ලෙස ජීවත් වන බව ඔප්පු කිරීමෙන් දේව කැමැත්තට භාර වෙමු.

**ක්‍රියාකාරකම**

1. වර්තමාන තරුණ පරපුර වරදට පෙලඹීමේ ස්වභාවය වැඩි වීමට හේතු වන කාරණා 3ක් ලියන්න.

3. දෙවියන් වහන්සේ අපෙන් අපේක්ෂා කරන ජීවිත රටාව, පවතින සමාජ වටපිටාව තුළ, සැබෑ කර ගැනීමට ඇති බාධක 2 ක් පිළිබඳ ව විස්තර කරන්න.

# 21 දරිද්‍රතාවේ අභියෝගය ජය ගනිමු

**ලෝකයේ පවතින දරිද්‍රතාවේ විවිධ පැතිකඩ ගැන අවබෝධයක් ලබා ගනිමින් ජීවිතය හැඩගස්වා ගත යුතු ආකාරය පිළිබඳව විමසා බැලීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ශු. මතෙව් 6: 19-21, ශු. ලූක් 16: 19-31, 18: 18-30, ක්‍රියා 6: 1,**

## ඔබේ වස්තුව කොතැන ද ඔබේ සිතත් එතැන ය

ජේසුස් වහන්සේ සාමාන්‍ය ජනතාව අතරේ ජීවත් වෙමින්, ක්‍රියා කරමින් මිනිස් ජීවිතයට නව බලාපොරොත්තුවක් දුන් සේක. සමාජය තුළ ජීවත් වීමේ දී මිනිස් අවශ්‍යතා පිළිබඳව සැලකිලිමත් වෙමින්, දයානුකම්පාවෙන් හා මානව හිතවාදී ව ක්‍රියා කිරීමට ජනතාවට මග පෙන්වූ සේක. තව ද දේව රාජ්‍යය උරුම කර ගැනීමට මග විවර කළ එතුමාණෝ ධනවතුන්ගේ ජීවිත පරිවර්තනයන් අපේක්ෂා කළ සේක. ස්වාමීන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ අපගේ ධනයෙන් -- ශ්‍රමයෙන් හා කාලයෙන් අන් අය නගා සිටුවීමට කටයුතු කිරීමයි.

සාමාන්‍ය ජන ජීවිතය තුළ දරිද්‍රතාව හෙවත් දිළිඳු කම ආර්ථික වශයෙන් මෙන් ම ආත්මිකව ද පැවතිය හැකි ය. මෙහි දී අපි **පළමුවෙන් ලෞකික ජීවිතය** තුළ දිළිඳු කම පිළිබඳවත් දෙවනුව ආත්මික දිළිඳු බව පිළිබඳවත් සලකා බලමු.

### 1. ලෞකික දිළිඳු බව

### දිළිඳු බව පිටුදැකීමට නම්

❖ **දිළිඳු අයට ශක්තියක් වීම.**

දිළිඳුන්ට උපකාර කිරීම, ඔවුන් රැකබලා ගැනීම මෙන් ම පෝෂණය කිරීම ද සිදුකළ හැකි ය. ඔවුන් වෙනුවෙන් සහනාධාර කටයුතු සඳහා මැදිහත් විය හැකි ය. නමුත් ඊටත් වඩා ඔවුනට තම දිළිඳු භාවයෙන් මිදීමට තම ශක්තිය යොදාගත හැකි පියවර මෙන්ම උපදෙස් හා උපකාර කිරීම ද වඩා වැදගත් වේ. මන්ද සහනාධාර මත නො රැඳී ජීවිත ගොඩනගා ගැනීමට ඔවුන්ට උපකාර කළ යුතු වේ. (ක්‍රියා 6: 1)

❖ **අලසකමින් තොරව ක්‍රියා කිරීම.**

අලසව ක්‍රියා කරමින් නිදහසට කරුණු ඉදිරිපත් කරමින් අනුන් මත යැපීමට බලාපොරොත්තු වන කළ දිළිඳු භාවය අත්දකිනු ඇත. අලසව ක්‍රියා නො කොට කඩිසර ව ක්‍රියා කිරීමත් කාලය, ශ්‍රමය, ධනය නිසි ලෙස ප්‍රයෝජනයට ගැනීමටත් පියවර ගත යුතු වේ. තව ද ආර්ථිකය ශක්තිමත්ව ගොඩනගා ගන්නවා සේම එම ආර්ථිකය මෙහෙයවා දියුණු වී නැගී සිටීමට බුද්ධිමත්ව තීරණ ගත යුතුවේ. (මුදල් ඉපයීම මෙන් ම මුදල් වියදම් කිරීම ද මැනවින් සිදුවිය යුතු වේ.) හිතෝපදේශ26: 13--15

❖ **සම්පත් නිසි ලෙස බෙදීයෑමට සැලසීම.**

පවත්නා සම්පත්, පුද්ගලයන් අතරේ නිසි ආකාරයෙන් බෙදී නොයෑම නිසා ඇතැම් පිරිස් දිළිඳු භාවයට පත්ව ඇත. එබැවින් සම්පත් සාධාරණ ව බෙදී යාම කෙරේ සැලකිලිමත් විය යුතු වේ.

❖ **විනීත ලෙස හැසිරීම.**

අහිතකර හැසිරීම් රටාවන් අනුගමනය කිරීම නිසා සමාජයක් දිළිඳු භාවයට පත්විය හැක. (උදා:--සූදුව, සුරාව, වංචාව, නාස්තිය) එබැවින් යහපත් සමාජ රටාවනට යොමු වී තමාට හිමිව ඇති දේ නිසි ලෙස පරිහරණය කරමින් ජීවිත ගොඩ නගා ගත යුතු වේ.

❖ **ධනාත්මක ජීවිත ආකල්ප ඇතිකර ගැනීම.**

තමාට ඇති හැකියාවන් නිසි ලෙස මෙහෙයවා කටයුතු නො කිරීම නිසා කෙනෙක් දිළිඳු භාවයට පත්විය හැකි ය. තමාට හිමි හැකියාවන් පිළිබඳවත්, තමාගේ ජීවිතය පිළිබඳවත් ධනාත්මකව සිතා බලා කටයුතු කළ යුතු වේ. බොහෝ ශාරීරික දූර්වලතා ඇති පුද්ගලයින් පවා ලෝකයේ ශක්තිමත් පෞරුෂයන් ඇතිව ක්‍රියා කරමින් ධනාත්මක ව ජීවිත ගොඩනගා ගෙන ඇත. එසේ කරමින් ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ද පෙලඹේ. එබැවින් තම ජීවිත වටිනාකම හා මෙහෙවර හඳුනාගෙන ක්‍රියා කරමින් දිළිඳු බවින් මිදීමට පියවර ගත යුතු වේ.

❖ **දිළිඳුකම අභියෝගයක් ලෙස භාර ගත යුතු බව.**

දිළිඳුකම ඉදිරියේ හඬා නොවැටී, දුක වේදනාව අගහිඟකම් මැද වුවද එකිනෙකා අතර තමාට හැකි අයුරින් උපකාර කර ගනිමින් ප්‍රීතියෙන් යුතුව ක්‍රියා කිරීමට පෙලඹිය යුතු වේ.

❖ **ආත්මිකව ශක්තිමත් විය යුතු බව.**

අනාගතය පිළිබඳව වෙහෙස වෙමින් වස්තු රැස්කිරීමට වඩා දවස් පතා භෝජනය ගැන සැලකිලිමත් විය යුතුය. තමා පිළිබඳවත් අනෙක් තැනැත්තා පිළිබඳවත් උනන්දු වෙමින් දෙවිඳුන් ඉදිරියේ යැදුම් ඔප්පු කළ යුතු වේ.

මෙලෙසින් අප ජීවත්වන සමාජයේ, දිළිඳු භාවයට පත්වීම හා ඉන් මිදීමට කළ හැකි ක්‍රියාවන් පිළිබඳව සැලකිලිමත් වෙමු.

## 2. අධ්‍යාත්මික දිළිඳු බව

ලෞකික වස්තුව රැස්කිරීමට බොහෝ දෙනා දැඩි වෙහෙසක් දරන බව නොරහසකි. නමුත් මෙලොව ජීවිතය තාවකාලික ය. එබැවින් සදාකාලික ජීවිතයට ඇතුළු වීමට අවශ්‍ය ස්වර්ගික වස්තු රැස්කිරීමට උත්සුක විය යුතු වේ. සාමාන්‍ය ජන ජීවිතයේ අවශ්‍යතා දිනෙන් දින වැඩිවීම නිසා සමාජයේ තණ්හාව වැඩි වෙයි. මේ නිසා සමාජයේ දරිද්‍රතාව වැඩි වන අතර ජීවිත ආකල්පවල සෝදා පාළුවක් ද ඇති වේ. මෙයින් ආධ්‍යාත්මික ව ඇතිවන දිළිඳුකම ද වැඩි වේ.

ජේසුස් වහන්සේ සමාජීය වශයෙන් ඇති දිළිඳුභාවය හා ආත්මික වශයෙන් ඇති දිළිඳුභාවය පිළිබඳව බොහෝ ඉගැන්වීම් ඉදිරිපත් කළ සේක. උන්වහන්සේ ස්වර්ගයේ නැති නො වන ධනවත් බව හා උරුමය ලැබීමට මෙලොව ක්‍රියාකළ යුතු අන්දම පහදා දුන් සේක. මෙලොව භෞතිකව අපට සියල්ල ලැබුණත් සගලොව වස්තුව අප හිමිකර ගැනීමට අපොහොසත් වුවහොත් අප ආධ්‍යාත්මික ව දිළිඳු බව අත්දකින බව ජේසුස් වහන්සේ පෙන්වා දුන් සේක.

## ජේසුස් වහන්සේ කළ ඉගැන්වීම්

**1. ශු. ලූක් 18: 18-30**

**ධනවත් ප්‍රධානියා**

සියලු සැප සම්පත් හිමි ව පැවතියත් තමාට සදාකාල ජීවිතය උරුමකර ගැනීමට කළයුතු දේ විමසනු ලැබීම.

ශු. ලූක් 18: 18--19

ඔහු සියලු ආඥා රක්ෂා කරන බව ප්‍රකාශ කිරීම

ශු. ලූක් 18: 20, 21

සියලු ආඥා රක්ෂා කළත් ඔහුගේ ජීවිතය තුළ ඇති අඩුව ඔහුට දැනීම. එවිට ඔහු කළ යුතු දේ එනම් සියල්ල විකුණා දිළිඳුන්ට දන් දෙන්න යැයි ජේසුස් වහන්සේ කළ ප්‍රකාශනය.

ශු. ලූක් 18: 22

ධනවතුන්ට ස්වර්ග රාජ්‍යයට ඇතුළු වීමට ඇති බාධාවන් හා දුෂ්කරතාව පිළිබඳව හඳුන්වාදීම. මෙහිදී උන්වහන්සේ ප්‍රකාශ කළේ ධනවත් වීම දිළිඳුන්ට උපකාර කිරීමට බාධාවක් නොවිය යුතු බවයි. එසේ ක්‍රියා නොකොට ආත්මාර්ථකාමී ලෙස ජීවත් වීම ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කරන සේක.

ශු. ලූක් 18: 24-25

එසේනම් ගැලවීම ලැබිය හැක්කේ කවරෙකුට ද ?

ශු. ලූක් 18: 26--30

ලෞකික වස්තු රැස්කිරීමෙන් වැළකී තමන් සතු වස්තුව අත්හැරීමට කටයුතු කරන, ස්වර්ගික වස්තු කෙරේ පමණක් සිත යොදවන ක්‍රිස්තු අනුගාමිකයන්ට ය. ඔවුන්ට සදාතන ජීවිතය උරුම බව පැහැදිලි ය.

**2. ශු. ලූක් 16: 19-31**

**ධනවතා සහ ලාසරස්**

ධනවතා මෙලොව ගත කල සැප ජීවිකාව හා දිළින්දා ධනවතාගේ කෑම මේසයෙන් වැටෙන කැබලිවලින් සාගිනි නිවා ගැනීම

ශු. ලූක් 16: 19--21

මෙලොව ජීවිතය හමාර කොට ධනවතා ආත්ම භවනෙහි දුක් විඳීම හා ලාසරස් ආබ්‍රහම්ගේ ළපැත්තේ ප්‍රීතිමත් ව සිටීම.

ශු. ලූක් 16: 21--26

ධනවතාගේ ආයාචනය හා වර්තමාන ලෝකයේ ජනතාව දේව වචනය තුළ ජීවත් වීමේ වැදගත්කම.

ශු. ලූක් 16: 27--31

තමා තුළ ඇති ආර්ථිකමය පොහොසත් භාවය තුළ එකිනෙකා පෝෂණය කිරීමට අත හිත දිය යුතු වේ. තව ද ප්‍රීතියෙන් හා ත්‍යාගවන්ත භාවයෙන් යුතුව තමා සතු දේ බෙදා ගත යුතු ය. මන්ද පොළොවේ වස්තුව විනාශ වී යන අතර අපගේ තාවකාලික ජීවිතය ද හමාර වෙයි. එම නිසා සදාකාල ජීවිතය උරුමකර ගැනීමට මෙලොව දී පියවර ගත යුතු වේ.

මෙලොව ධනවත් වීම හෝ දිළිඳු වීම ස්වර්ග රාජ්‍යය ලබා ගැනීමට සුදුසුකමක් නොවේ. දේව රාජ්‍යය තුළ සැබෑ පොහොසත්කම යනු, තමා තුළ ඇති ආත්මාර්ථය, අහංකාරකම, උඩඟුව, වෛරය, ක්‍රෝධය ඊර්ෂ්‍යාව වැනි අයහපත් ගුණාංගවලින් හිස් වීමයි. එසේම තමන් සතු ව තිබූ ආර්ථික ධනවත්කම නිසා අහංකාර නො වී එය අවශ්‍යතාවෙන් පෙළෙන තැනැත්තන් සමග බෙදා හදා ගැනීමෙන් ඇති වන යහපත් ගුණාංග නිසා ස්වර්ගීය උරුමයට හිමිකම් ලැබෙනු ඇත.

## 3. ශු. මතෙව් 6: 19-21

**සග සම්පත්**

මෙලොව අප රැස්කළ යුත්තේ කුමක් ද ?

"මෙලොව ඔබට වස්තු රැස්කර නො ගන්න. මලකඩ ද කාවෝ ද ඒවා කා දමති. සොරු ද උමං කැන ඒවා සොරා ගනිති. එහෙත් ස්වර්ගයෙහි ඔබට වස්තු රැස්කර ගන්න. එහි දී මලකඩවත් කාවෝවත් ඒවා නාස්ති නොකරති. සොරුද උමං කැන ඒවා නොගනිති. ඔබේ වස්තුව කොතැන ද ඔබේ සිතත් එතැන ය.

අප ජීවත්වන්නේ බඩු භාණ්ඩවලින් පිරුණු, ඒවාට ආකර්ෂණයක් ඇති, ඒ මත ජීවිතය පිහිටුවා ගන්නට වෙර දරන සමාජයක ය. (උදා:-- නත්තල් සමයේ අපගේ වටපිටාව තුළ පිරී ඉතිරී යන බඩු භාණ්ඩවලින් ඇති ආකර්ෂණයෙන් මුළු සමාජය ම වෙළා සිටින විට ආත්මික කාරණා සියල්ල නැතිවෙන ස්වභාවයකට පත්වී තිබීම.) ඒ ආකර්ෂණය හේතුවෙන් මුළු මහත් සමාජය ම තමන්ගේ රැකවරණය ලෙස සලකන්නේ මුදල්මය වාසි ඇති මානසිකත්වයකි. (උදා:-- ලොතරැයි පත්වලින් දිනෙන් දින වැඩිවන මිලියන ගණනට ආකර්ෂණය වීම.) ජේසුස් වහන්සේ පැවසුවේ මෙවන් වස්තු සඳහා ඇති ආකර්ෂණය දෙවියන් වහන්සේගේ ගුණාංගවලට නො පැහෙන බව යි. එවිට අපගේ සිතුවිලි ආකල්ප හා ක්‍රියා කලාපයන් දෙවියන් වහන්සේගෙන් ඈත් වූ පාපයට හා නපුරාට බර වූ ජීවිත බවට පත්වෙයි. (උදා:-- ජීවිත රක්ෂණ ක්‍රමවලින් අප මුදල්වලට ආකර්ෂණය කෙරෙන මානසිකත්වය) වස්තුවට අපගේ ජීවිත ආරක්ෂා කරගත නොහැකි බව පැහැදිලි ය. එය ආරක්ෂා කර දිය හැක්කේ දෙවියන් වහන්සේට පමණකි.

නූතන සමාජයේ ජීවත්වන අපි දෙවියන් වහන්සේගේ කාරණා ගැන අවබෝධයෙන් සිටිමු. ලෝකයේ තිබෙන දරිද්‍රතාව තේරුම් ගනිමු. එය පිටුදැකීමට කටයුතු කරමු. ආත්මික දරිද්‍රතාව වටහා ගනිමු. සදාචාරාත්මක සමාජයක් ගොඩනැගීමට ස්වාර්ගීක සම්පත් කෙරේ අපේ සිත යොදවා ජීවිතය අර්ථවත් කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. දරිද්‍රතාවෙන් පෙළෙන අය උදෙසා ඔබට කළ හැකි ක්‍රියා 2ක් ලියන්න.

2. දිළිඳු බව පිටු දැකීමට ගත හැකි පියවර පිළිබඳ යෝජනා 2ක් ලියන්න.

# 22 පීඩිතවූවන් මුදවාලමු

**ව්‍යසන හා හිංසා පීඩා සහිත ලෝකයක අපි ජීවත් වෙමු. එවැනි පීඩා තත්ත්වයන්ට අපි මුහුණ දෙමින් සිටිමු. එසේම පාපයෙන් ඇතිවන දුක් පීඩාවලින් අප මුදා ගැනීම වෙනුවෙන් දෙවියන් වහන්සේ ක්‍රියා කළ ආකාරය වටහා ගෙන, එය ජීවිතයට අදාළ කර ගැනීම පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**නික්මයාම 2: 23-25, 3: 9 ශු. ලූක් 4: 18 ශු. ජොහාන් 3: 16**

ව්‍යසනකාරී ලෝකයක ජීවත්වන අප, එම ව්‍යසන තත්ත්වයන්ට කොපමණ දායක වී ඇත්ද යන්න කල්පනා කර බැලීම වටී. මිනිසා විසින් ම ඇතිකරන ලද ව්‍යසන මෙන් ම ස්වාභාවිකව ඇතිවන විපත්තිකාරී ව්‍යසනයන් ද හේතුවෙන් දෙවියන් වහන්සේ අපට දුන් ලෝකය බරපතල ලෙස දූෂණයට ලක් වී ඇති බව පැහැදිලි ය. මෙම ව්‍යසනකාරි තත්වය නිසා ඇතිවන දුක් පීඩා තත්ත්ව ද මිනිසාගේ ම වරදින් සිදුවන බව කිව හැකි ය. දෙවියන් වහන්සේ අපෙන් අපේක්ෂා කරන්නේ උන්වහන්සේගේ කැමැත්ත ඇතිව ලෝකය යහපත් ලෙසට පවත්වාගෙන යාම යි.

එනමුත් මිනිසුන්ගේ බල තණ්හාව, ආත්මාර්ථය හා තෘෂ්ණාව මුල්කරගත් පාප නිසා මිනිසා සමාජයේ ජීවත් වන විට අනෙකා මර්දනය කිරීමටත්, ඔහු අබිබවා යෑමටත්, ඔහුට හිංසා පීඩා කිරීමටත් පෙලඹී සිටින බව පෙනේ. මෙවන් තත්ත්වයන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කළ බව නික්මයාම සිද්ධියෙන් පැහැදිලි ය. වහල් බවට ගොදුරු වී සිටි ඉශ්රායෙල් ජනතාව ඉන් මුදවා ගැනීම දෙවියන් වහන්සේගේ සැලසුමේ ප්‍රධාන අභිප්‍රායක් ලෙස අපි මෙහි දී තේරුම් ගනිමු.

ඉශ්රායෙල් ජනතාව වහල් බවින් බොහෝ දුක් පීඩා විඳි අතර, එම පීඩා ඉදිරියේ ඔවුන් දෙවිඳුන්ගේ කරුණාව යැදී ය. ඔවුන් දෙවියන් වහන්සේ කෙරෙහි තම බලාපොරොත්තු තැබූහ. පීඩාවෙන් මිදීමට දෙවිඳුන්ට කන්නලව් කරමින් වඩ වඩාත් උන්වහන්සේ කෙරෙහි සමීප වූහ.

දෙවියන් වහන්සේ ඔවුන්ගේ සුසුම් ලෑම හා මොර ගැසීමටත් කන්නලව්වටත් සවන් දුන් සේක.

**ඉශ්රායෙල් ජනයා වහල් සේවය නිසා සුසුම්ලමින් මොරගැසූහ.**
**ඔවුන්ගේ වහල් සේවය නිසාම ඔවුන්ගේ කන්නලව්ව**
**දෙවියන් වහන්සේ වෙත පැමිණියේ ය.**
**නික්මයාම 2: 23**

**දැන් ඉතින් මෙන්න ඉශ්රායෙල් ජනතාවගේ මොරගැසීම මා වෙත**
**නැගී ඇත. තවද මිසරවාසීන් දෙන දරුණු පීඩාවන් ද මා දැක ඇත.**
**නික්මයාම 3: 9**

දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාව, මිසරයේ වහල් බවින් ගත කළ පීඩිත තත්ත්වයෙන් ඔවුන් මුදවා පිටතට ගෙන ඒම පිණිස මෝසෙස්, ආරොන්, ජොෂුවාගේ ජීවිත තුළින් ක්‍රියා කළ සේක. ඔවුහු දෙවියන් වහන්සේගේ මග පෙන්වීමත් කරුණාවත් තුළ ක්‍රියා කරමින් සියලු බාධක මැද අභියෝග ජය ගත්හ. ඉශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදවා ගැනීමට ඔවුහු කටයුතු කළහ.

**ඉශ්‍රායෙල් ජනතාව**

මිසරයේ වහලුන් වීම

- මිසරයේ පාලකයන් ඊශ්‍රායෙල්වරුන් බර වැඩවල යෙදවූ නිසා.
- සංඛ්‍යාවෙන් ඊශ්‍රායෙලිතයන් වැඩිවීම නිසා
- යම් දිනක මිසරය යටත් කර ගනී යන බිය නිසා
- මිසර ජනතාවට ඇතිවූ සැකය නිසා

වහලුන් ලෙස දෙවියන් වහන්සේට මොර ගැසීම

- උන්වහන්සේ ඔවුන්ගේ පීඩාවන් දුටු සේක.
- මොරගැසීමට සවන් දුන් සේක.
- ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූ සේක.
- පීඩිතයාට සාධාරණය ඉටුකළ සේක.

පීඩිත ඊශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ කරුණාව පෑම.
මුදවා ගැනීමේ කාර්යයට මෝසෙස් නායකත්වයට කැඳවීම.
ඔවුන් මිසරයේ වහල්කමින් මුදවාගෙන පොරොන්දු දේශයට ගෙන යාම.

වර්තමාන සමාජය තුළ අපට අසන්නට හා දකින්නට ලැබෙන කාරණාවල දී සමාජ අසාධාරණත්වය, ප්‍රචණ්ඩත්වය, හිංසනය ප්‍රධාන කොට දැක්විය හැකි ය. බොහෝ ජනයා පීඩාවට හා හිංසනයට පත්ව ඇතත් එසේ සිටිනු දැකීම දේව කැමැත්ත නොවේ.

එසේම අද අප ජීවත් වන සමාජය තුළ නොයෙක් ආකාර වහල්කම්වලට ඇද දමන බලවේගයන් සමාජ රටාව තුළ ඇති වී තිබෙන බව පැහැදිලි ය.

- ❖ දරිද්‍රතාව ඇති කරමින් පීඩා විඳින්නට සැලැස්වීම.
- ❖ ඇති නැති පරතරය තුළ අධික ධනවත් භාවයෙන් මිනිසුන් පෙළීම.
- ❖ රටක් ලෙස අධික ණය බරින් අන් රටවල වහලුන් බවට පත්වීම.
- ❖ වෙළඳ හා කම්හල් අධිකාරිත්වය තුළ ශ්‍රමය සූරා කෑම තුළින් ඇතිවන වහල් භාවය.
- ❖ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය තුළින් පවුල් ඒකක තුළ ඇතිවන හිංසනය.

මිනිසාට හිමිවිය යුතු නිදහස, මානව අයිතීන්, සතුට ආදරය භුක්ති විඳීමට සෑම පුද්ගලයකුට ම අයිතියක් තිබේ. දෙවියන් වහන්සේ මිනිසුන්ගෙන් බලාපොරොත්තු වන සාධාරණත්වයද එය ම වේ. එවැනි අරමුණු තුළ සිටිමින් ජනතාව වහල් භාවයෙන් මුදවා ගැනීමට ක්‍රියා කළ විවිධ නායකයන් ගැන අප අසා තිබේ. එනම් ඉන්දියාවේ නිදහස්

අරගලයට අවිහිංසාවාදය තම ප්‍රතිපත්තිය කරගත් මහත්මා ගාන්ධිතුමා කළු සුදු වර්ණ භේදයට එරෙහි ව කටයුතු කළ මාටින් ලූතර් කිං, නෙල්සන් මැන්ඩෙලා, ඩෙස්මන් ටුටු බිෂොප් තුමා වැනි අය අපට හඳුනාගත හැකි ය.

එලෙස ම සමස්ත සමාජය තුළ ම පාපය කරණකොට ගෙන පීඩා විඳින ජනතාවගේ මිදීම පිණිස ජේසුස් වහන්සේ මෙලොවට වැඩි සේක. උන් වහන්සේගේ මෙලොව මෙහෙවර පිළිබඳ නාසරෙත්හි ප්‍රකාශනයේ මෙය සඳහන් වේ.

**කියවා බලමු.**

**ශු. ලූක් 4: 18**

## එදා ජුදා ජන සමාජය තුළ පැවති තත්ත්වය වෙනස් කරමින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ ආකාරය

පව්කාරයන් ලෙස කොන් කරනු ලැබූවන් පිළිගැනීමට ලක් කළ සේක. --
(සාකෙවුස්, පව්කාර ස්ත්‍රිය)

කාන්තාවන් හා දරුවන් අගය කළ සේක - (ළදරුවන්ට ආශිර්වාද කිරීම)

විජාතීන් පිළිගෙන කටයුතු කළ සේක - (සමාරිය ස්ත්‍රියට කරුණාව දැක්වීම)

වැරදි මතවලට වහල් වී අන්ධ අයවලුන් සේ ක්‍රියා කරන ජනයාට නිවැරදි මං පෙත විවර කළ සේක - (සද්දුසිවරු පරිසිවරු සමග සංවාද)

-

මානසිකව හා ආත්මිකව පීඩා විඳි ජනතාවට සහනය සැලසූ සේක (යක්ෂ ආත්ම දුරු කිරීම, මළවුන් නැගිටුවීම)

රෝගීන්ට අවශ්‍ය ශාරීරික සුවය දානය කළ සේක (අංශභාග රෝගියා, මීමැස්මොර, ලාදුරු රෝගීන්ට සුවය)

නීතියට වඩා මනුෂ්‍යත්වය සලකා කටයුතු කළ සේක - (සබත් දින සුව කිරීම්)

**වර්තමාන සමාජයේ ද**

කොන්වීමට ලක්වන,

ශාරීරක රෝගී බවින් පීඩා විඳින, ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන,

දේශපාලන පළිගැනීම්වලට ලක්වන,

මානසිකව පීඩා විඳින,

විවිධ ව්‍යසන තත්ත්වයන් නිසා පීඩා විඳින,

අසහනයෙන් පෙළෙන,

ආධ්‍යාත්මිකව සැනසීම අහිමි ව ජීවත් වන,

අවිවේකීව රැකියාවේ යෙදෙන,

වැරදි මතවල එල්බගෙන සිටින,

අයුක්තියට හා අසාධාරණයට ලක් වන,

සූරාකෑමට ලක්වන,

හිංසාවට හා පීඩාවට පත්වන,

අපචාරවලට ලක්වන,
බොහෝ ජනයා ශාරීරිකවත් මානසිකවත් පීඩා විඳිති.

ජේසුස් වහන්සේගේ මෙලොව සේවයේ දී පීඩාවට පත්වූ ජනතාවට සහනයක් වූ ලෙසට ම කිතුනු අප ද එලෙස ක්‍රියා කරනු ඇතැයි උන්වහන්සේ අපේක්ෂා කරන සේක.

මෙම පාඩමේ දී අප ඉගෙනගත් කරුණු අතර ජේසුස් වහන්සේගේ සේවය මෙලොවට පිදුණු ආකාරය පැහැදිලි වේ. එලෙස ම දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඉතිහාසයේ පටන් ලෝකයේ යහපැවැත්මට ක්‍රියාත්මක වූ ආකාරයත් ජොහාන්තුමා ඉදිරිපත් කරන පහත පාඨයෙන් පෙනී යයි.

**දෙවියන් වහන්සේ**
**ලෝකයාට කෙතරම් ප්‍රේම කළ සේක් ද කීවොත්,**
**ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් වුවද**
**ලොවට දෙවා වදාළ සේක.**
**එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහන සියලු දෙනාම**
**විනාශ නොවී සදාතන ජීවනය ලබන පිණිස ය.**
**ජොහාන් 3: 16**

"දෙවියන් වහන්සේ ලෝකයාට කොතරම් ප්‍රේම කළ සේක් ද" යන පාඨයෙන් උන්වහන්සේගේ ප්‍රේමය කිසිම තරාතිරමක් නොමැති ව මිනිසාට ලැබෙන බව පැහැදිලි ය. එහෙයින් අසාධාරණකම් හා පීඩාවලට ගොදුරුවූවන් ඉන් මුදවා ගැනීමට කරුණාව දැක්වීමට අපි දු මැදිහත් වෙමු.

**ක්‍රියාකාරකම්**

1. වර්තමාන සමාජයේ මිනිසා පීඩාවට ලක්වන ආකාර 5ක් ලියන්න.
2. එදා සමාජය තුළ පැවති අසාධාරණ තත්ත්වයන්ට එරෙහි ව යමින් ජේසුස් වහන්සේ ක්‍රියා කළ අවස්ථා 3 ක් ගෙන හැර දක්වන්න.

# 23 සමාජ සාධාරණත්වය කරා

**ආමොස් දිවැසිවරයා එදා පැවති සමාජීය තත්ත්වය තුළ යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් ඔහුගේ හඬ අවදි කළ ආකාරයත් එය අපගේ ජීවිතයට අදාළ කර ගත හැකි ආකාරයත් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

**ආමොස් 4, 5 පරිච්ඡේද**

## ආමොස් සේවය කළ පසුබිම

ආමොස් දිවැසිවරයා සිය දිවැසිවර සේවය සිදු කළේ ඉශ්රායෙල් දේශයේ උතුරු රාජ්‍යයේ ය.

ආමොස් දකුණු දිශාවේ පිහිටි ජුදා දේශයෙහි තෙකෝවාහි ගම් වැසියෙකි. හෙතෙම බැටළු එඬේරකු මෙන් ම අත්තික්කා වගා කරන්නකු ද විය. ඔහු වෘත්තීය දිවැසිවරයකු නොවූවත් දිවැසිවර කාර්යය හොඳින් ඉටු කළ කෙනෙකි.

ක්‍රි.පූ. 8 වන ශත වර්ෂයේ මැද භාගයේ හෙතෙම දිවැසිවර සේවයේ නියැලුණි. ඒ කාලයේ උතුරු රාජ්‍යය පාලනය කළේ දෙවන ජෙරබෝවම් රජතුමා ය.

මේ සමයේ දේශය කිසියම් ආකාරයක ආර්ථික දියුණුවකට පත් වී තිබුණි. උතුරු රාජ්‍යය ජාත්‍යන්තර වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ නිසා මතුපිටින් විශාල ආර්ථික සංවර්ධනයක් පෙන්නුම් කළේ ය. ඉශ්රායෙල් රජතුමා සහ රටේ ප්‍රභුවරු, විශේෂයෙන්ම අග නගරය වූ සමාරියාවේ ප්‍රභුවරු විදේශීය අධිරජවරුන් සමග නොයෙකුත් ආර්ථික ගිවිසුම් ඇතිකර ගත්හ. ඒ නිසා ඔවුනට බොහෝ ලාභ ප්‍රයෝජන අත් වූ නමුදු, විදේශීය රජවරුන් සමග ඇතිකර ගත් ගිවිසුම්වල අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබුවේ දිළිඳුන්ගෙන් අධික ලෙස බදු අයකිරීමෙනි. මේ හේතුවෙන් ධනවත් නිලධාරි හා ප්‍රභූ පන්තිය ඉතා සුඛෝපභෝගි ජීවිත ගතකළ අතර දිළිඳුහු ඉතා දුගී තත්ත්වයකට පත්වූහ. එමෙන් ම ඔවුහු දැඩි පීඩනයකට හා සූරාකෑමට ලක් වූහ. දුගී ජනතාව ගැන ධනපති වෙළඳුන් දැරූ ආකල්පය ආමොස්තුමා මෙලෙස විස්තර කරයි. එනම් 'දුප්පතා සල්ලිවලට ද, දුගියා සෙරෙප්පු දෙකක මිලට ද ගත හැකිය' යන්නයි. මින් පෙනී යන්නේ දුගී මිනිසකු සතු වටිනාකම සෙරෙප්පු දෙකක වටිනාකමට වඩා වැඩි නො වන බවක් ඔවුන් සිතූ බවයි. මෙලෙස ඔවුහු මානව වටිනාකම් පහළ තත්ත්වයකට ඇද දැමූහ. සමාරිය අගනුවර කර ගත් ධනපතීහු සුඛෝපභෝගී නාගරික ජීවිතයක් ගත කළහ.

එහෙත් නගරයෙන් පිට ජීවත් වූ කෘෂිකර්මය, එඬේර වෘත්තිය හා අනෙකුත් කම්කරු කාර්යවල නියැලුණු අය හා නාගරික ධනපතීන් අතර තිබුණේ විශාල පරතරයකි. එය ඇතිවූයේ සූරා කෑම හා දුප්පතුන් සතු වස්තුව කොල්ලකෑම නිසා ය.



ආමොස් දුටු දර්ශනයක් - (ලඹ ලණුව)

මී ළඟට අපි ආමොස් දිවැසිවරයාගේ දිවැස් වැකි කිහිපයක් ගැඹුරෙන් සලකා බලමු.

කියවා බලමු.

## ආමොස් 4,5 පරිච්ඡේද

### අසාධාරණ අයුක්ති සහගත ක්‍රියාකාරකම්

සමාරියේ ජීවත් වූ ධනපතීන්ගේ භාර්යාවන් ආමොස් හඳුන්වන්නේ "තරබාරු එළදෙනෙකු" ලෙස ය. එසේ දක්වන්නේ ඔවුන් "දිළිඳුන් තළා පෙළන, අසරණයන්ට පීඩා කරන" පිරිසක් වූ හෙයිනි. දේව විනිශ්චය දරුණු ලෙස ඔවුන් මත පැමිණෙන බව ඔහු දැන්වී ය.

එලෙස ම ධනවත් ප්‍රභූ පංතිය යුක්තිය ඉටුවේ යයි අපේක්ෂා කරනු ලබන උසාවි ක්‍රමයට ද බලපෑම් කළහ. ඔවුහු අල්ලස් දෙමින් හා අල්ලස් ගනිමින් දුප්පතා සඳහා යුක්තිය ඉටුවීම වැළැක්වූහ. (5: 12). මෙලෙස යුක්තිය ඉටුකිරීම සඳහා පිහිටුවනු ලැබූ උසාවිවලිනුත් දුප්පතුන්ට කිසිදු පිළිසරණක් නොලැබුණු බව පෙනී යයි.

### හැරී එන ලෙස ජනතාවට ආයාචනය

දෙවියන් වහන්සේ, නොයෙකුත් ක්‍රියා මගින් ජනතාව තමන් වහන්සේ වෙත හැරී එන ලෙස මග පෙන්වුවත් ඔවුන් එසේ නොකළ බව ආමොස් සඳහන් කරයි.

දෙවියන් වහන්සේ වැස්ස වළක්වා සාගත කාලයක් ඇති කළ නමුදු (ආමොස් 4: 6, 7) ඔවුහු දෙවියන් වහන්සේ වෙත හැරී ආවේ නැත. වසංගත පැමිණිය ද (ආමොස් 4: 10) සෙනගගේ ජීවිතවල වෙනසක් සිදු නොවුණි.

ආමොස් දෙවියන් වහන්සේ දෙන දඬුවම ප්‍රකාශ කරන අතර ම ඔවුන්ගේ ජීවිත සැබෑ පසුතැවීමකින් යුක්තව වෙනස් වීම සඳහා තදබල ආයාචනයක් කරයි. (ආමොස් 4:8, 5: 6)

## පුද පූජාවල අරුත් සුන් බව

ඉශ්රායෙල්වරු අයුක්ති සහගත ජීවිත ගත කරමින් ම ආගමික කාර්යයන්වල නියැලුණා හ. ඔවුහු දසයෙන් කොටස පුද කරමින්, මුහුන් මුසු තුති පූජා ඔප්පු කළහ (ආමොස් 4: 4) බෙයර් ෂෙබා, බෙතෙල්, ගිල්ගාල්වල නොයෙකුත් ආගමික පුද පූජා ස්ථානවලට ගිය ඔවුනට ආමොස්ගේ අවවාදය වූයේ එසේ යෑමෙන් ඉන් පලක් නොමැති බවයි (ආමොස් 4: 5). ඉන් පලක් නැතිවා පමණක් නොව දෙවියන් වහන්සේ ඔවුන්ගේ මංගල්‍යවලට ද්වේෂ කරන බවත්, දවන යාග පූජා, ආහාර පූජා යනාදිය ප්‍රතික්ෂේප කරන බවත් ආමොස් පවසයි (ආමොස් 5: 21, 22)

## සියලු බලැති දෙව් සමිඳාණන්ගේ විනිශ්චය

ආමොස් සිය දිවැසාවලියේ, දේව විනිශ්චය පිළිබඳ සඳහන් කරද්දී දෙවියන් වහන්සේ "සියලු බල ඇති දෙව් සමිඳාණන් වහන්සේ" ලෙසින් හඳුන්වයි. මේ මගින් දෙවියන් වහන්සේගේ බලය හා මහිමය විස්තර කෙරේ. උන්වහන්සේ අයුක්තිය හා අසාධාරණ ලෙස ක්‍රියා කරන්නවුන් විනිශ්චයට ලක් කරන අතර දුප්පතුන්ගේ පැත්ත ගනිමින් ඔවුන් ආරක්ෂා කරන බලවත් දෙව් සමිඳාණන් වහන්සේ බව වැඩිදුරටත් විග්‍රහ කරයි.

## ආමොස්ගේ පණිවුඩය අපගේ ජීවිතවලට අදාළ කර ගනිමු.

## යුක්තිය පිළිබඳ දැනීම හා සැලකිලිමත් වීම.

අප ජීවත්වන ලොව අසාධාරණය රජකරයි. අපි රැකියා ක්ෂේත්‍රය සලකා බලමු. එක ම සුදුසුකම් ඇති දෙදෙනෙක් රැකියාවකට අයදුම් කළ විට, වැඩි බලපෑමක් කළ හැකි පුද්ගලයාට එය ලැබේ. අනෙකාට සිදුවන්නේ අසාධාරණයකි. ආගමික හා වාර්ගික අසාධාරණ ද අපට නිතරම පෙනේ. මෙහිලා කිතුනුවකුගේ වගකීම වන්නේ පළමුව මෙවැනි අවස්ථා ගැන අවධානයෙන් හා දැනීමෙන් යුතුව සිටීම යි. ආමොස් දිවැසිවරයා ප්‍රකාශ කරන "යුක්තිය ගලා බසින දිය දහරක් මෙන් ද ධර්මිෂ්ඨකම නොසිඳී ගලන ගඟක් මෙන්" (ආමොස් 5:24) යන්න සෑම සමාජයක ම ක්‍රියාකාරිත්වයට වැදගත් වන්නකි.

## දෙවියන් වහන්සේ හා යුක්තිය

අප විසින් තේරුම් ගත යුතු වැදගත් ම කරුණ වන්නේ, දෙවියන් වහන්සේ සියල්ලන්ගේ පියාණන් වහන්සේ නිසා, උන්වහන්සේ ම යුක්තිය පිහිටුවාලීම සඳහා මැදිහත් වන බවයි. ජේසුස් සමිඳාණන් වහන්සේ නාසරෙත් නුවරට පැමිණ කළ මුල් ම දේශනාවෙන් මේ කරුණු වඩාත් පැහැදිලි වේ. (ලූක් 4: 18--19).

### ක්‍රියා මාර්ගවලට පිවිසීම

මෙවැනි අවස්ථාවල පළමු ක්‍රියා මාර්ගය විය යුත්තේ නමස්කාරයෙන් දෙවියන් වහන්සේට කරුණු ඉදිරිපත් කිරීමයි. අප, නමස්කාරයේ යෙදී සිටින විට දෙවියන් වහන්සේ යුක්තිය හා සාධාරණත්වය පිහිටුවීම සඳහා අපට විවිධ මාර්ග පෙන්වන සේක. වැරදි පෙන්වාදීම, ප්‍රවෘත්ති පත්‍රවලට ලිවීම, සමාජ අසාධාරණකම්වලට විරෝධය

ප්‍රකාශ කිරීම වැනි දෑ එවන් ක්‍රියාමාර්ගයන් ය. මේ සඳහා අපගේ තත්ත්වය වැදගත් නොවේ. අවශ්‍ය වන්නේ, අපගේ නමස්කාරය දේව කැමැත්තට අනුව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමයි. එවිට නමස්කාරය දෙවිඳුන්ට ප්‍රසන්න වනු ඇත.

## පෞද්ගලික කැපවීම

ජේසුස් වහන්සේ අපට ඉගැන්වූයේ දේව රාජ්‍යය අපගේ ප්‍රධාන ඉලක්කය කරගත යුතු බව යි. යුක්තිය හා සාධාරණත්වය පිහිටුවීම මේ ඉලක්කයේ වැදගත් කොටසකි. මේ ඉලක්කය කරා ළඟාවීමේ දී දෙවියන් වහන්සේ මත යැපෙමින්, තමන්ගේ කාලය හා ශ්‍රමය යොදමින් කැපවීම උන්වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නකි. අපත් වර්තමාන සමාජය තුළ එවන් කැපවීමක් ඇතිව දිවි ගෙවන්නට වෙහෙසෙමු.

**ක්‍රියාකාරකම්**

1. ආමොස් 4 හා 5 පරිච්ඡේදවලින් හෙළි කරන සමාජයේ විවිධ අසාධාරණකම් පිළිබඳ කරුණු ගොනු කරන්න.

# 24 පිවිතුරු දිවියක් කරා

**සුවිශුද්ධ භාවය දෙවියන් වහන්සේට අයිති ස්වභාවයකි. ශුද්ධත්වය ගැනත් එය අපගේ ජීවිතයට අදාළ වන අන්දම පිළිබඳවත් අධ්‍යයනයක යෙදීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

යෙසායා 6:1-8

### යෙසායාගේ කැඳවීමේ පසුබිම

යෙසායා 6 වැනි පරිච්ඡේදයේ පසුබිමට අයත් වන්නේ ක්‍රි. පූ. අටවන ශත වර්ෂයේ දකුණු දිග රාජ්‍යයයි. අසිරියා අධිරාජයාගෙන් දකුණේ ජුදා රාජ්‍යයට බලවත් දේශපාලනික තර්ජන එල්ල වී තිබුණේය. ඉන් පසු සිරියාවෙන් හා ඉශ්රායෙල් රාජ්‍යයෙන් ද ආක්‍රමණ හා තර්ජන තිබුණි. යෙසායාගේ කැඳවීම මෙවැනි පසුබිමක දිවැසිවර කාර්යයක් ඉටු කිරීම සඳහා විය.

දෙවියන් වහන්සේට අකීකරු වීම මෙන් ම උන්වහන්සේ කෙරෙහි විශ්වාසය නො තැබීම සෙනගගේ සිත් දූෂ්‍ය වීමට හේතු විය. එහෙයින් යෙසායා, දෙවියන් වහන්සේ අපේක්ෂා කරන "ශුද්ධත්වය" පිළිබඳ බලගතු දිවැස්වැකි හෙළිදරව් කරයි.

### යෙසායාගේ කැඳවීම



යෙසායා සිය කැඳවීම ලබන්නේ ශුද්ධ වූ දේව මාලිගාවේ සිටියදී ය. ඔහු දුටු දර්ශනය තුළින් දෙවියන් වහන්සේ ශුද්ධ මාලිගාව තුළ දී ඔහුගේ පාපය කමා කර දිවැසිවර සේවය සඳහා ඔහු කැප කළ සේක.

යෙසායා දෙවියන් වහන්සේ දකින්නේ දේව මාලිගාවේ අතිශුද්ධ ස්ථානයේ උස් වූ උදාර වූ සිංහාසනයක් මත වැඩ සිටින අයුරිනි. උන්වහන්සේ වටා සිටින සෙරාප්වරුන් උන්වහන්සේගේ සුවිශුද්ධකම තෙවරක් හඬ නගා කියති. මෙයින් හැඟී යන්නේ ශුද්ධත්වය හෙවත් පිවිතුරුකම දෙවියන් වහන්සේට ම පමණක් හිමි ලක්ෂණයක් බව යි.

මෙහි දී යෙසායා තමන් 'කාලකණ්ණියෙක්' බවත් 'අපවිත්‍ර තොල්' ඇති සෙනඟ අතරේ සිටින බවත් පවසයි. මෙමගින් දෙවියන් වහන්සේගේ සුවිශුද්ධත්වය ඉදිරියේ ඔහුට සිය පාපී ස්වභාවය ඉතාමත් ගැඹුරු ලෙස අවබෝධ වන බව පෙනී යයි. (යෙසායා 6: 5)

මේ දර්ශනයේ ඊළඟට ගිනි අඟුරක් යෙසායාගේ මුඛයේ තැවරීමෙන් ඔහුගේ පාපය කමාකර, ඔහුගේ අපරාධය පහවීම ප්‍රකාශ වේ. එනම් දෙවියන් වහන්සේ අශුද්ධ, පාපි මිනිසා ප්‍රතික්ෂේප නොකර පිළිගන්නා සේක. මෙසේ දෙවියන් වහන්සේ ඉදිරියේ පිළිගැනීමක් ලබන මිනිසා කමාව ලබනවා පමණක් නො ව ඊටත් වඩා වැඩි යමක් දෙවියන් වහන්සේ වෙතින් ලබයි. එසේ වන්නේ ඔහු තමාගේ පාපය ගැන සැබෑ අවබෝධයක් ඇතුව පැමිණි විටයි. එය නම් සුවිශුද්ධ දෙවියන් වහන්සේ මිනිසා හට ලබා දෙන ශුද්ධකමේ ජීවිතය යි.

## පිවිතුරු ජීවිතයක් ලැබිය හැකි වේ ද?

යෙසායාට දෙවියන් වහන්සේ දෙන ශුද්ධත්වය උන්වහන්සේගේ දිව්‍යසිවර කාර්යය මිනිසුන් අතරට ගෙන යන පණිවිඩකරුවා වීමට යි. එනම් දේව හඬ මිනිසුන්ට ඉදිරිපත් කිරීමට යි. එය දුෂ්කර ය, කටුක ය. එනමුත් ඒ සඳහා දෙවියන් වහන්සේ ඔහු තුළ ශුද්ධත්වය සහතික කළ සේක. ඔහු ඔහුගේ පාපය පිළිබඳවත්, සෙනඟගේ අපවිත්‍රකම පිළිබඳවත් මනා අවබෝධයක් ඇතිව දෙවියන් වහන්සේගේ කැමැත්තට භාර විය.

අපට අවශ්‍ය ශුද්ධත්වය කුමක් විය යුතු ද? යෙසායාට එම ශුද්ධත්වය ලැබෙන්නේ දේව කාර්යය මිනිසුන් අතර ඉෂ්ට කිරීම පිණිස ය . "මෙන්න මම මෙහි ය. මා යැවුව මැනව." (යෙසායා 6:8) යන පිළිතුරෙන් මෙය සනාථ වේ. අපේ පාපී ස්වභාවය බරපතළ නම් ශුද්ධත්වය සඳහා අපට ඉල්ලීමක් කළ හැකි ද? පුළුවන.

එහෙත් එම ශුද්ධත්වය දෙවියන් වහන්සේගෙන් අප ඉල්ලන්නේ අපට මහන්තත්වයක් ලබා ගැනීමේ යටි අදහසින් නම් එය ලැබෙන්නේ නැත. එය ඉබේ ලැබෙන දෙයක් හෝ අප කිතුනුවන් වූ පමණින් ම ලැබෙන දෙයක් ද නොවේ. නමුත් එම ශුද්ධකම අපේ පාපි බව අවබෝධ කර ගැනීමෙන් ලබාගත හැකි ය. එවිට අපි තවත් අපගේ නොව, දෙවියන් වහන්සේටම පමණක් අයිති අය වෙමු. මෙසේ අප දෙවියන් වහන්සේට අයිති අය වී දේව කැමැත්ත මග නොහැර සමාජය තුළ ක්‍රියා කරමු.

එසේ ම දාවිත් රජ වැනි අය පවා දෙවියන් වහන්සේගේ සුවිශුද්ධත්වය ඉදිරියේ තමන්ගේ පාපයේ බරපතළකම අවබෝධ කර ගත්හ. දෙවියන් වහන්සේ තව දුරටත් තමන් සමග නැති බව බැත්ෂෙබා සම්බන්ධ පාපයෙන් පසුව දාවිත්ට දැනුණි. ඔහුට ඔහුගේ රජ කමේ බලවත් භාවය කිසි ප්‍රයෝජනයක් නැති බව අවබෝධ විණි. එසේම සාතන්ගේ පරීක්ෂාවලට ඔහු බලවත් ලෙස ගොදුරු වී සිටි බව ඔහුට හැඟුණි. ඔහුට දෙවියන් වහන්සේගෙන් "නිර්මල සිතක්" අවශ්‍ය වූයේ එහෙයිනි. අන් සියලු දෙයට වඩා දෙවියන් වහන්සේ සමග සැබෑ සම්බන්ධතාවකට යෑමට ඔහුට දැවෙන අවශ්‍යතාවක් ඇති වුණි. ඔහු දෙවියන් වහන්සේට මෙසේ ආයාචනා කරයි.

'මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව' (ගීතාවලිය 51:2)

'දෙවිඳුනි මා තුළ නිර්මල සිතක් මවා වදාළ මැනව' (ගීතාවලිය 51:10)

දෙවියන් වහන්සේගෙන් පිවිතුරු ජීවිතයක් ලබන මිනිසා සෑම විටම සමාජයේ යහපත සඳහා ක්‍රියා කරයි. ඔහු/ඇය දෙවියන් වහන්සේට උවමනා ආකාරයට ක්‍රියා කරන්නකු බවට පත් වේ. මෙය යෙසායාට සිදුවූවාක් මෙන් ම ඕනෑ ම අයකුට අවදානමක් ඇතිවිය හැකි ක්‍රියාවලියකි. එම අවදානමෙන් මිදී යෑමට දෙවියන් වහන්සේ අපට උදව් කරන සේක.

එවන් දිවියක් ගත කිරීමට ශුද්ධාත්ම මග පෙන්වීමෙන් දිරි ගනිමු.

**ක්‍රියාකරකම්**

1. යෙසායාගේ කැඳවීම තුළ ශුද්ධත්වය පිළිබඳ ඔබ උගත් කරුණු කිහිපයක් ලියා දක්වන්න.

2. පාසලේ දී ඔබ පරීක්ෂාවට ලක් කරන පිවිතුරු දිවියකට බාධා කරන කරුණු 5ක් ලියන්න.

# 25 නවෝදයේ අරුණළු

**සාමය හා සමෘද්ධිය පිළිබඳව බයිබලයේ ඉගැන්වීම් අධ්‍යයනය කරමින්, සාමකාමී ලොවක් ගොඩ නැඟීමේ ප්‍රායෝගික බව අත් දකින්නට මග පෙන්වීමක් මෙම පාඩමෙන් අපේක්ෂිත ය.**

මීකා 4 පරිච්ඡේදය

## මීකා දිවැසිවරතුමාගේ සේවයේ පසුබිම

යෙසායා මෙන් ම මීකා ද දර්ශන මඟින් දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයට කැඳවන ලදී. හෙතෙම සාමාන්‍ය ජනතාව අතරේ වාසය කළ කෙනකු බව පෙනේ. මීකා දිවැසිවරයා යෙසායා දිවැසිවරයාගේ සමකාලීනයෙකි. එහෙත් හෙතෙම දිවැස් වැකි ප්‍රකාශ කළේ දකුණුදිග ජුදා රාජ්‍යයේ ය. සමාජ සාධාරණත්වය පිළිබඳව දැඩි ලෙස කරුණු ඉදිරිපත් කළ ඔහු ජුදා රාජ්‍යය පාලකයින් හෙළා දකියි. ඔවුන්ගේ අසාධාරණ, අදේවභක්තික ගති පැවතුම් හා පාලන ක්‍රම නිසා සියොන් (ජෙරුසලම) නටබුන් ගොඩක් බවට පත්වෙන බව ප්‍රකාශ කරයි.

මේ අදහස් ප්‍රකාශ කරන ඔහු, සාමය හා සාමකාමිත්වය පිළිබඳව උදාර අදහස් කිහිපයක් ඉදිරිපත් කරයි. අපි දැන් ඒවා විමසා බලමු.

### සමිඳාණන් උදා කරන සාම යුගය

මීකා 4ඃ 1 පදයේ 'මතු දවස' යන වචනය යෙදීමෙන් දෙවියන් වහන්සේ කිසියම් සුවිශේෂී කාලයක සාමය පිහිටුවන බව පවසයි. එය සිදු වන්නේ සියොන් කන්ද, එනම් ජෙරුසලමේ ය. ඉන් පවසන්නේ සියලු වාද භේද, වෛර ක්‍රෝධ, අබිබවා සාමය රට තුළ මහ ඉහළින් ස්ථාපිත කරනු ලබන බව යි.

මීකා 4ඃ 3 වන පදය තුළ දේව සෙනඟ තුළ ජනිත වන සාමකාමී ජීවිත රටාව මනාව පැහැදිලි වෙයි. එහි "තමන්ගේ කඩු වලින් නඟුල් තල ද හෙල්ලවලින් දෑකැති ද තළාගනු ලබන" බව පවසයි. මෙමඟින් අවධාරණය කරන්නේ යුද මානසිකත්වය සම්පූර්ණයෙන් පහවීමේ ලකුණක් ඇති වී තිබෙන බවයි. එනම් සෙනඟ තම කෘෂි කාර්මික ජීවිත රටාවට මුල්තැන දී සාමකාමී දිවි පෙවෙතක් ගත කරන දවසක් උදාවන බව යි.

සාමය තහවුරු වන විට මිනිස් සිතෙන් බිය පහ වී යයි. (මීකා 4ඃ 4 අ) සාමයේ ප්‍රතිඵලය සමෘද්ධිය යි. 'එකිනෙකා තම තමාගේ මිදි වැල යට ද, අත්තික්කා ගස යට ද යෙහෙන් වාසය කරනු ඇත' යනුවෙන් හෙතෙම පවසයි. (මීකා 4ඃ 4 ආ) මිදිවැල හා අත්තික්කා ගස් ඇසුරෙන් මීකා පවසන්නට උත්සාහ දරන්නේ සමෘද්ධිමත්කමේ ස්වභාවය යි. මේ සමෘද්ධිය දෙවියන් වහන්සේ වෙතින් පහළ වන්නකි. විශේෂයෙන් මිදි වැල ජුදෙව් සෙනඟට ආර්ථික හා කෘෂිකාර්මික වශයෙන් පමණක් නොව, අධ්‍යාත්මික වශයෙනුත් ඉතා වැදගත් වන්නකි.

පුරාණ ගිවිසුමේ 'මිදි වතු' රූපකය බෙහෙවින් යොදාගෙන තිබේ. එහි මිදි වත්ත උපමා කර තිබෙන්නේ ඉශ්රායෙල් ජනතාවට ය. එමඟින් දෙවියන් වහන්සේ දේව ජනතාවට දක්වන ප්‍රේමය ප්‍රකාශ වේ. මීකා දිවැසාවලියේ මිදි වතු භුක්ති විඳීම යන්නෙන් අදහස් කරන්නේ ආර්ථික සමෘද්ධිය පමණක් නොවේ. එමඟින් දේව ප්‍රේමය තුළ සාමය භුක්ති විඳින, සාමකාමී ජීවන රටාවක ස්වභාවය අවධාරණය කෙරේ.

**සාමය, ෂාලොම් ලෙස**

හෙබ්‍රෙව් භාෂාවෙන් 'ෂාලොම්' යන වචනය අනුව, සාමය පිහිටුවනු ලබන්නේ යුක්තිය හා සාධාරණත්වය සහිත සංදර්භයක ය. යුක්තිය හා ධර්මිෂ්ඨකම ස්ථාපිත නො කර සැබෑ සාමයක් බලාපොරොත්තු විය නොහැකි බව පුරාණ ගිවිසුමෙන් අපට පැහැදිලි වේ.

**සාමය ඇතිකරන්නෝ දේව දරුවෝ ය.**

සාමය ඇතිකිරීම හෝ සාමකාමී දිවි පෙවෙතක් ගත කිරීම කිතුනු දිවියේ අනිවාර්යය චරිත ගුණාංගයකි. සාමය ලැබීම පමණක් නොව සාමකාමී වීමත්, සාමය පිහිටුවීම සඳහා දායක වීමත් කිතුනුවකුගෙන් බලාපොරොත්තු වේ. මෙය පෞද්ගලිකව පමණක් ලබන සාමයක් නොවේ. එමගින් මුළු සමාජයක්, දේශයක් තුළ සාමය ගොඩනැගීම පිණිස ක්‍රියාත්මක වීමක් අදහස් කෙරේ. මෙසේ කරන්නට දේව දරුකමේ උරුමය ලැබෙන බව නව ගිවිසුමේ මංගල වාක්‍ය තුළින් ද අපට දැන ගත හැකි වේ.

**සමගි වීමක් සඳහා මැදිහත් වීමේ අභියෝගය.**

ශ්‍රී ලංකාවේ පැවති යුද්ධය අවසාන වී තිබුණත් සිත් සමගි වීමක් සිදු වී නොමැත. දෙවියන් වහන්සේ අප අතර සිත් සමඟි වීමක් ඇති කිරීමට අපේක්ෂා කරන සේක. අප ඒ සඳහා ඉදිරිපත් වී කටයුතු කළ යුතු ය.

**සමගිවීමක් සඳහා මැදිහත්වීම** කිතුනු අපට වර්තමානයේ ඇති ඉතාම වැදගත් **අභියෝගය** යි. අපි බොහෝ විට අපේ ම පෞද්ගලික හා පවුලේ කටයුතු කිරීමට පමණක් සීමාවී සිටිමු. සමහර විට, ඉන් ඔබ්බට කටයුතු කළත්, අභියෝග ඇතිවන විට, ඒ කටයුතු අතහැර දැමීමට යොමු වන්නෙමු. මෙවැන්නක් වීම සුදුසු නැත. ගෙදර, පාසලේ, සමාජයේ හැකි සෑම අවස්ථාවක ම සාමය, සමඟිය, ඇතිකිරීමේ දේව කාර්යයට හවුල් විය යුතු ය. දකුණු අප්‍රිකාවේ මයිකල් ලැප්ස්ලි පියතුමා මේ සඳහා කදිම උදාහරණයකි.



ගරු මයිකල් ලැප්ස්ලි පියතුමා

සුදු - කළු අන්තර් සම්බන්ධතා ශක්තිමත් කිරීම එතුමාගේ ප්‍රධාන සේවය යි. මෙහි නියැලීමේ දී එතුමා ට සිය අත්වල කොටසක් සම්පූර්ණයෙන්ම අහිමි විය. එහෙත් එතුමා දිරිමත් ව තවමත් ඒ කටයුත්තේ නියැලී සිටියි. අප රට තුළ මේ සම්බන්ධයෙන්, අතිගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා, සෝමසිරි කේ. පෙරේරා දේවගැතිතුමා වැනි අය මෑත කාලයේ කළ කාර්යභාරය අතිමහත්ය.

සාමයේ ජීවිතයකට ප්‍රබල සාක්ෂියක් වෙමින් දේව උපකාරයෙන් සමාජය තුළ ක්‍රියා කිරීමට ඔබ ද උත්සුක වීම වැගත් ය. එසේම සමගිය වෙනුවෙන් මැදිහත්කාරකමේ යෙදීමේ අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් දේව අභිප්‍රාය ඉටු කරමු.

**ක්‍රියාකාරකම්**

1. සාමය පිළිබඳ මීකා දිවැසිවරතුමා 4 වන පරිච්ඡේදයෙන් ප්‍රකාශ කරන අදහස් ලැයිස්තු ගත කරන්න.

2. ගරු මයිකල් ලැප්ස්ලි පියතුමාගේ සේවයේ වැදගත් කරුණු ගොනු කරන්න.